වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2021

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය.
வரையறுக்கப்பட்ட சுயாதீன தொலைக்காட்சி சேவை.
INDEPENDENT TELEVISION NETWORK LTD.

වාර්ෂික වාර්තාව
2021

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය.

දැක්ම

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ නියමුවා බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලාංකික වටිනාකම් හා සංස්කෘතිය මත බැඳී පවතින ගුණාත්මක ආකර්ශනීය හා මානව හිතවාදී වැඩසටහන් ඉදිරිපත් කිරීම.

අභිමතාර්ථ

විශිෂ්ට අධ්‍යාපනික, තොරතුරු සපිරි සහ විනෝදාත්මක වැඩසටහන් ඉදිරිපත් කිරීම.

වැඩසටහන් නිර්මාණය හා විකාශනය සඳහා අති නවීන තාක්ෂණය යොදා ගැනීම.

ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන යෑම.

නිර්මාණශීලී, නිපුණතා සහ සුදුසුකම් ලත් මානව සම්පත් සංවර්ධනය.

දේශීය වැඩසටහන් පතළ කර ගැනීම හා හුවමාරුව මගින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රේක්ෂකයින් වෙත සමීප කිරීම.

සාරධර්ම

නිර්මාණශීලී -
නවෝත්පාදනය, නව අදහස් උදෙසා කැපවීම හා සහජ හැකියා ඇති පුද්ගලයින්ට උපකාරී වීම.

දිරිමත් -
සෘජු බව හා පැහැදිලි අභිමතාර්ථය ඇතිව වෙනසට අනුගත වීමේ දක්ම.

උපකාරක -
ආයතනයේ සේවයේ සිටින කාලය තුළ පෞද්ගලික වශයෙන් මෙන් ම වෘත්තීය වශයෙන් ද වර්ධනය වීමේ අවස්ථාව ස්වාධීන රූපවාහිනී කාර්ය මණ්ඩලයට ලබා දීම.

වගකීමෙන් යුත් -

ශ්‍රී ලාංකික ප්‍රජාව උදෙසා උසස් ප්‍රමිතියකින් හා වියදමට සරිලන සේවාවක් ලබා දීම.

ආයතනික තොරතුරු

නාමය	සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
නෛතික ස්වරූපය	පෞද්ගලික අංශයේ සමාගමක් ලෙසින් 1979 අප්‍රේල් 13 වැනි දින ආරම්භ කරන ලදී. 1971 අංක 35 දරණ ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පනත යටතේ 1979 ජූනි මස 05 වැනි දින අංක 39/4 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජය වෙත පවරා ගන්නා ලදී. 1987 අංක 23 දරණ පනත යටතේ 1992 අප්‍රේල් 27 වැනි දින රජය සතු පොදු සමාගමක් බවට ප්‍රකාශයට පත් කරන ලද අතර එකම හිමිකරු ලෙසින් මහා භාණ්ඩාගාරය පත් කරන්නට යෙදින. 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලදී.
සමාගම් ලියාපදිංචි අංකය	පීබී 1070 (PB 1070)
ව්‍යාපාරයේ ස්වභාවය	සිංහල හා දමිළ භාෂා කථා කරන ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් වෙනුවෙන් රූපවාහිනී නාලිකා දෙකක් (ITN හා වසන්තම් TV) හා ගුවන් විදුලි සේවා දෙකක් (ලක්හඬ හා වසන්තම් FM) පවත්වා ගෙන යයි. ශ්‍රී ලංකාව තුල පුළුල් ආවරණයක් ලැබෙන සේ ඉතාම බලගතු විකාශන ශක්තියක් හිමි කරගෙන ඇත. සමාජ ජාල ක්‍රියාකාරීත්වය සඳහා ITN Digital නමින් ඩිජිටල් නාලිකාවක් පවත්වාගෙන යයි.
ගිණුම් වර්ෂය	ජනවාරි 1 වැනි දින සිට දෙසැම්බර් 31 දින දක්වා
විගණකවරුන්	විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
සමාගම් ලේකම්	සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසර් සර්විසස් (පුද්ගලික) සමාගම, කොළඹ
බැංකුකරුවන්	ලංකා බැංකුව

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති	සුදත් රෝහණ මහතා	(2021.12.29 දක්වා)
විධායක අධ්‍යක්ෂ	ආචාර්ය එච් එස් හෙට්ටිආරච්චි	(2021.12.30 දක්වා)
අධ්‍යක්ෂ	මහාචාර්ය එම් කේ සී රාජපක්ෂ	
අධ්‍යක්ෂ	ආචාර්ය අමිල ඉෂාන් කන්කානම්ගේ	(2021.12.28 දක්වා)
අධ්‍යක්ෂ	එම් ෆයිනාස් මහතා	
අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත	සංජීවනී වීරසේකර මහත්මිය	
අධ්‍යක්ෂ	නීතිඥ ටී ඒ යජිෂ් තෙන්නකෝන් මහතා	(2021.01.27 දින සිට)

ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

සභාපති	සුදත් රෝහණ මහතා	(2021.12.29 දක්වා)
විධායක අධ්‍යක්ෂ	ආචාර්ය එච් එස් හෙට්ටිආරච්චි	(2021.12.30 දක්වා)
ප්‍රධාන විධායක නිලධාරී	එන් ඒ අයි එන් කේ නිශ්ශංක මහතා	
සාමාන්‍යාධිකාරී	ඩබ් පී ඒ එම් විජේසිංහ මහතා	

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්

එස් රදලියගොඩ මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්)
සංජීවනී ඇපා මිය	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන)
එච් එස් කේ පෙරේරා මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩසටහන්)
රවී සිරිවර්ධන මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)
ටී කේ ඉසෙඩ් ගුණසේකර මිය	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) රා ඉ
කේ ඒ ජී ඒ කුලරත්න මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) 2021.08.30 දින දක්වා
යූ. හේවාවසම් මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) රා ඉ 2021.08.31 දින සිට
අශෝක කරුණානායක මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගුවන් විදුලි) 2021.06.03 දින දක්වා
කපිල තිලකසිරි මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගුවන් විදුලි) රා ඉ 2021.06.03 දින සිට

සම්බන්ධීකරණ තොරතුරු

ප්‍රධාන කාර්යාලය — වික්‍රමසිංහපුර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
දුරකතනය : 94 11 2774424, 2773289
ෆැක්ස් : 9411 2774594
ඊමේල් : chairman@itn.lk, itnadm@itn.lk
වෙබ් අඩවිය : www.itn.lk

අලෙවි අංශය — 325, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.
දුරකතනය : 94 11 2699072, 2682304, 2691868
ෆැක්ස් : 94 11 2688724
ඊමේල් : marketing@itn.lk

● ගමනක වරුණ

1979	අප්‍රේල් 13	පුද්ගලික ව්‍යාපාරික කණ්ඩායමක් විසින් පන්නිපිටිය මහල්වරාවේ අඩි 65 ක් උස කුළුණක් මඟින් කිලෝ වොට් 1 ක සම්ප්‍රේෂණ ධාරිතාවකින් විකාශන කටයුතු ආරම්භ කරන ලදී.
	ජූනි 05	රජයට පවරා ගන්නා ලදී.
1982		විකාශ කටයුතු, මැදිරි හා ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ලේ වික්‍රමසිංහපුරයට ගෙනෙන ලදී. පටිගත කිරීමේ කටයුතු යූ-මැටික් තාක්ෂණය උපයෝගී කරමින් සිදු කරන ලද අතර පසුව බහුලව භාවිතා කරනු ලබන බීටාකැම් තාක්ෂණයට මාරු කිරීම.
1990	නොවැම්බර් 01	යටියන්තොට සම්ප්‍රේෂණාගාරය නිල වශයෙන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
1992	අප්‍රේල් 27	1987 වසර අංක 23 පනතට අනුව රාජ්‍ය සමාගමක් බවට පරිවර්තනය කර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ රාජ්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම.
	නොවැම්බර් 23	දෙනියාය සම්ප්‍රේෂණාගාරය නිල වශයෙන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
1993	අගෝස්තු 23	නායබැද්ද සම්ප්‍රේෂණාගාරය නිල වශයෙන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
1997	අප්‍රේල් 1	ලක්හඬ ගුවන් විදුලි සේවය ස්වාධීන රූපවාහිනී පරිපාලනය යටතට පවරා ගැනීම.
1999	අප්‍රේල් 12	හුන්නස්ගිරිය සම්ප්‍රේෂණාගාරය නිල වශයෙන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
2000	ඔක්තෝම්බර් 4	කරගහතැන්න සම්ප්‍රේෂණාගාරය නිල වශයෙන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
2001	අප්‍රේල් 7	ලක්හඬ මැදිරි හා එහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල වික්‍රමසිංහපුර ස්වාධීන රූපවාහිනී පරිශ්‍රයට ගෙනෙන ලදී.
2006	ජූනි 2	සූරියකන්ද සම්ප්‍රේෂණාගාරය නිල වශයෙන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
2008	අප්‍රේල් 21	වසන්තම් එෆ්එම් ගුවන් විදුලි සේවය ආරම්භ කිරීම.
2008	සැප්තැම්බර්	ස්වාධීන රූපවාහිනී ඉතිහාසයේ පළමුවරට උපරිම ප්‍රේක්ෂක ගුවන් කාලයේ දී (Prime Time) අංක 1 නාලිකාව බවට පත් විය.
2009		සියළුම ගුවන් කාලවලට අදාල ව ස්වාධීන රූපවාහිනී සේවය අංක 1 නාලිකාව බවට පත් විය.
	ජූනි 25	වසන්තම් TV රූපවාහිනී නාලිකාව ආරම්භ කිරීම.
	නොවැම්බර් 12	ප්‍රයිම් රූපවාහිනිය හා ප්‍රයිම් ගුවන් විදුලි සේවය නිල වශයෙන් ආරම්භ කිරීම.
2010	ජූනි 06	ලක්හඬ, වසන්තම් TV හා වසන්තම් එෆ්එම් විකාශන පුළුල් කිරීමේ අරමුණින් කොකාවිල් බහු කාර්ය සම්ප්‍රේෂණාගාරයේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
2011	ජනවාරි 20	නව HDTV මැදිරි සහ කාර්යාල සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම.
	සැප්තැම්බර් 08	වසන්තම් එෆ්එම් විකාශනය පුළුල් කිරීම සඳහා යාපනයේ නව සම්ප්‍රේෂණ යන්ත්‍රයක් හා ඇන්ටනාවක් ස්ථාපිත කිරීම.
	දෙසැම්බර්	කාර්ය මණ්ඩල කාර්ය සාධන ඇගයීමේ ක්‍රමය හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.
2012	සැප්තැම්බර් 03	මඩොල්සිම විකාශනාගාරය ආරම්භ කිරීමත් සමඟ ම වසන්තම් TV විකාශන ආවරණය නැගෙනහිර ප්‍රදේශය දක්වා පුළුල් කිරීම.
2014	මාර්තු 03	ආරක්ෂක අංශය, අමුත්තන් නැවතීමේ ශාලාව, වැඩසටහන්, මුදල්, ඉංජිනේරු යන අංශ සඳහා කාර්යාල සංකීර්ණයකින් යුත් පස් මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.
2016	ජූනි 30	නව HD මැදිරි හා කාර්යාල සංකීර්ණය විවෘත කිරීම.
	සැප්තැම්බර් 19	ස්වාධීන රූපවාහිනී සේවය ප්‍රතිව්‍යුහගත කිරීම. ලක්හඬ ගුවන් විදුලිය ITN FM ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම.
2017	ජූනි 14	කාර්යාල සංකීර්ණයකින් යුත් පස් මහල් ගොඩනැගිල්ල විවෘත කිරීම.
2020	ජනවාරි 01	ස්වාධීන රූපවාහිනී සේවයේ පැවති ලාංඡනය නැවත හඳුන්වාදීම්. ITN FM, ලක්හඬ ලෙස නැවත නම් කිරීම හා ලක්හඬ ලාංඡනය නැවත හඳුන්වාදීම්.
	ජූනි	සමාජ ජාල ක්‍රියාකාරීත්වය සඳහා ITN Digital නාලිකාව ආරම්භ කිරීම.

සභාපතිවරයාගේ සංදේශය

ගත වූ වසර තුළ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය අත්පත් කර ගෙන ඇති ප්‍රතිඵල මා ඉදිරිපත් කරන්නේ සතුටිනි.

මුළු ලෝකයට ම බලපෑ කෝවිඩ් 19 තත්ත්වය යටතේ වුව ද 2021 වර්ෂයේ දී ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ආදායම් වර්ධනය කර ගැනීමටත් අලාභය අඩුකර ගැනීමටත් හැකි වී ඇති අතර නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් වල ගුණාත්මකභාවය වැඩි කිරීමටත්, සියලුම වැඩසටහන් වෙළඳපොළ කොටස (Market Share) හා Ratings ඉලක්ක කර වඩාත් ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීමටත් අවධානය යොමු කර ඇත.

මෙහි දී ප්‍රේක්ෂකයාගේ රසවින්දනයට ගරු කරන, ජාතික හා සමාජීය වගකීමක් සහිතව රසවින්දනය, සංස්කෘතික උරුමය හා අපේකම හා දැනුම ඉස්මතු කළ ආකර්ශනීය වැඩසටහන් පෙළක් "ජාතික උරුමයේ නාලිකා සන්නාමය" නමින් හඳුන්වා දී ප්‍රශස්ත ගණයේ ටෙලි නාට්‍ය හා වැඩසටහන් විකාශයට කටයුතු කර ඇත.

2021 වර්ෂයේ දී පැවති සුමති සම්මාන උළෙලේ දී ස්වාධීන රූපවාහිනී සේවය ඉදිරිපත් කළ විල්පත්තු වාදය හා Acoustica Unlimited හොඳම කාලීන වැඩසටහන හා හොඳම සංගීතමය වැඩසටහන ලෙස පිළිවෙලින් සම්මානයට පාත්‍ර වූ අතරම SLIM NELSON PEOPLE'S AWARDS හිදී අඛණ්ඩව 13 වන වරට අටපට්ටම වැඩසටහන ශ්‍රී ලංකාවේ ජනප්‍රියම රූපවාහිනී වැඩසටහන ලෙස සම්මානයෙන් පිදුම් ලබන ලදී.

තවද රයිගම් සම්මාන උළලේ දී ස්වාධීන රූපවාහිනී සේවය 2020 හා 2021 වර්ෂ සඳහා විශිෂ්ටතම ටෙලිනාට්‍ය නාලිකාව ලෙසත් 2020 හා 2021 වර්ෂ සඳහා වසරේ විශිෂ්ටතම නාලිකාව ලෙසත් සම්මාන ලබාගැනීමට සමත් විය. මෙම සම්මාන උළලේදී ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට සම්මාන හතළිහක් දිනා ගැනීමට හැකිවිය.

මෙම වැඩසටහන් පෙළගැස්ම හා ආයතනය තුළ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ක්‍රියාකාරකම් තුළින් 2019 වසර අවසානයේ 5.21 තිබූ වෙළඳපොල කොටස 2021 අවසාන වන විට 8.51ලෙස රඳවා ගැනීමට සමත් විය.

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තරඟකාරිව නව මාධ්‍ය භාවිතා කිරීම සඳහා ආරම්භ කරන ලද ITN Digital නාලිකාව සාර්ථක ප්‍රගතියක් ලබා ගෙන ඇති අතර සැලසුම් කරන ලද නව අලෙවි ප්‍රවර්ධන හා අලෙවිකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම හා නවමු වැඩසටහන් ඉදිරිපත් කිරීම මඟින් 2021 වසර අවසානයේ දී ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට රු.මි. 1407ක ආදායමක් උපයා ගැනීමට හැකි විය. එය 2020 වර්ෂයට සාපේක්ෂව 22.35% ආදායම් වර්ධනයකි. තවද 2020 වසරේදී රු.මි 280ක රජයේ ප්‍රදාන හැර රු.මි 507 වූ අලාභය ඉහත පරිදි ආදායම් වැඩිකර ගැනීම සහ ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන ආයතනයේ සියළුම ව්‍යාපෘති පාලනය කිරීම මගින් 2021 වසරේදී රු.මි 316 ලෙස 37.7% කින් අඩුකර ගැනීමට හැකිවිය. කොවිඩ් 19 තත්වය හා මාධ්‍ය ක්ෂේත්‍රයේ දැඩි තරඟකාරී වාතාවරණය තුළ ආදායම් වර්ධනය ඉතාමත් අභියෝගාත්මක වුවත් 2021 වර්ෂයේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට ඒ අනුව හැකි වී ඇත. තව ද 2021 වර්ෂයේ දී ආයතනය විසින් මහා භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ව්‍යාපෘති කිසිවක් ලබා ගෙන නොමැති බව ද අවධාරණය කළ යුතු කරුණකි.

මෙම සියළු ජයග්‍රහණයන් රට හඳන සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ නියම කර ඇති සුවිශේෂ ප්‍රමුඛතා සඳහා ද ප්‍රමුඛත්වය ලබා දෙමින් සිදු කර ඇත.

තව ද වෙබ් අඩවි (Web Sites), සමාජ මාධ්‍ය ජාලා (Social Media), දුරකථන කෙටි පණිවිඩ හා සුහුරු ජංගම දුරකථන ඔස්සේ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත්වන සියලු ම ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා ප්‍රේක්ෂක ආකර්ෂණය ලබාගැනීම මඟින් වෙළඳ වටිනාකම හා ආදායම තවදුරටත් වර්ධනය කරගැනීමටත් සමාජ මාධ්‍ය ජාලා හා නව මාධ්‍ය බෙදාහැරීමේ වේදිකා (Over The Top Platforms) භාවිතා කරමින් ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණ, සජීවිකරණ නිර්මාණ හා රූප නිර්මාණ සඳහා වගකීමක් සහිත රාජ්‍ය මාධ්‍යයක් ලෙස නව මාධ්‍ය භාවිතා කරමින් නව ව්‍යාපාරික අවස්ථාවක් ගොඩනැගීමටත් අවධානය යොමු කර ඇත.

මෙම සියළු කාර්යයන් කිරීමෙහි ලා අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය හා මෙම කාර්යයන් නොකඩවා පවත්වා ගෙන යාමට සහය දුන් සියළුම කාර්ය මණ්ඩලය ලබාදුන් සහාය අතිශයින් වැදගත් වුණ අතර ඔවුන් සියළු දෙනාටම ස්තුතිය පල කරන අතර ඒ සියළු දෙනාම අනාගත සාර්ථකත්වයේ නියමුවන් වනු නොඅනුමානය.

සුදර්ශන ගුණවර්ධන

සභාපති

● අලෙවි අංශය

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සමස්ත අලෙවි අංශය වාර්තා කළ අලෙවි ආදායම රු. මිලියන 1579.11 වන අතර, ස්වාධීන රූපවාහිනී සේවය, වසන්තම් TV, ලක්හඬ රේඩියෝ සහ වසන්තම් FM යන නාලිකා වෙන් වෙන්ව වාර්තා කළ ආදායම පහත පරිදි වේ.

නාලිකාව	ආදායම (රු.මිලියන)
ස්වාධීන රූපවාහිනී සේවය	1346.27
වසන්තම් TV	133.68
ලක්හඬ රේඩියෝ	63.2
වසන්තම් FM	35.96

ITN

සේවා නියෝජිත ආයතන වශයෙන් 2021 වසරෙහි වැඩිම ආයෝජනයක් සිදු කරන ලද්දේ Group M Media (Pvt) Ltd. ආයතනය වන අතර එය රු. මිලියන 286.33 වේ. දෙවනුව වැඩිම ආයෝජනයක් Phoenix O & M (Pvt) Ltd. ආයතනය කරන ලද අතර, එය රු. මිලියන 186.04 කි.

තනි සේවාදායකයෙකු විසින් සිදු කරන ලද ආයෝජන වශයෙන් වැඩිම ආයෝජන ජාතික ලොතරැයි මණ්ඩලය සිදු කර ඇති අතර එය රු. මිලියන 180 කි. Unilever Sri Lanka Ltd. හා Unilever Lipton Ceylon Ltd. ආයතන රු. මිලියන 136 ක ආයෝජනයක් සිදු කර ඇත.

ස්වාධීන රූපවාහිනී සේවය විසින් සංවිධානය කරන ලද විවිධ විශේෂ අවස්ථා මඟින් ලබා ගත් ආදායම පහත පරිදි වේ.

• 2021 වසරෙහි "ITN සූර්ය මංගල්‍යය" මින්නේරිය යුධ හමුදා කඳවුරේ දී කොවිඩ් - 19 සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් පවත්වන ලදී. එහි ප්‍රධාන අංග අනුග්‍රාහක දායකත්වයන් යටතේ පවත්වන ලදී. එහි දී උපයා ගත් ආදායම් පහත පරිදි වේ.

- සූර්ය මංගල්‍යය - රු. මිලියන 30 යි
- තරු පිරි අවුරුදු - රු. මිලියන 23 යි
- මහ ගෙදර අවුරුදු - රු. මිලියන 12 යි

එසේම අවුරුදු හා සම්බන්ධ අනෙකුත් අංගවලින් (ළමා අවුරුදු | Avurudu Frequency packages | සෙල්ලම් ගෙදර අවුරුදු) ලබා ගත් ආදායම දළ වශයෙන් රු. මිලියන 33 කි. ඒ අනුව සමස්ත අවුරුදු හා සම්බන්ධ අංගවලින් රු. මිලියන 98 ක ආදායම් ලබා ගත් අතර, මෙය පසුගිය වසරවලට සාපේක්ෂව වාර්තා කළ ඉහළම ආදායමක් වේ.

• "31st Night" වෙනුවෙන් ක්ෂේත්‍රයේ ජනප්‍රිය තරු සහභාගීත්වයෙන් "තරු පළස" ප්‍රසංගය විකාශය කරන ලද අතර, මේ සඳහා Unilever ආයතනය Lux සන්නාමය යටතේ අනුග්‍රහය දක්වන ලදී.

ලක්හඬ රේඩියෝ

2021 වසරෙහි රු. මිලියන 63.2 ක ආදායමක් උපයා ගනිමින් ලක්හඬ ගුවන් විදුලිය අනෙකුත් වර්ෂවලට සාපේක්ෂව වැඩි ආදායමක් උපයා ඇත.

මෙහි දී සේවා නියෝජිත ආයතන සැලසිනේ ආයතනය වැඩිම ආයෝජනයක් සිදු කළ අතර එය රු. මිලියන 14.4 කි. එසේම වැඩිම ආයෝජනයක් සිදු කරන ලද සේවාදායකයා ජාතික ලොතරැයි මණ්ඩලය වන අතර, ඒ රු. මිලියන 23 කි.

• ලක්හඬ ගුවන් විදුලිය ඔවුන්ගේ සංවත්සරය වෙනුවෙන් 2021 නොවැම්බර් 27 වන දින "Color of Love" නමින් විශේෂ වැඩසටහනක් සංවිධානය කරන ලද අතර, මෙය ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ ද සමගාමී විකාශයක් ලෙස විකාශය කරන ලදී. මෙහි දී අනුග්‍රාහකයන් වෙතින් රු. 3,350,000/-ක මුලු ආදායමක් ලැබූ අතර, ලක්හඬ ගුවන් විදුලිය සඳහා රු. 500,000/-ක් වෙන් කරන ලදී. මේ සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, Hemas, අංජන සෙනවිරත්න සහ Dialog යන ආයතන අනුග්‍රහය දක්වන ලදී.

• ලක්හඬ ගුවන් විදුලිය අවුරුදු හා සම්බන්ධව සංවිධානය කරන ලද උත්සව මඟින් රු. 1,580,000/- ක සමස්ත ආදායමක් ලබා ඇත.

වසන්තම් TV

වසන්තම් TV නාලිකාව 2021 වසර සඳහා රු. මිලියන 133.68ක ආදායමක් ලබා ඇති අතර, අඩු ආවරණ කලාපය සහ කොවිඩ්-19 තත්ත්වය යටතේ අලෙවි ඉලක්කය සපුරා ගැනීම අභියෝගයක් විය.

මෙහි දී ඉහළ ආයෝජනයක් සිදු කළ සේවා නියෝජිත ආයතනය වන්නේ Pheonix O & M (Pvt) Ltd. වන අතර, එය රු. මිලියන 35.26 ක ආයෝජනයකි. එසේ ම සේවාදායකයින් අතරින් ඉහළ ම ආයෝජනයක් සිදු කරන ලද්දේ Unilever Sri Lanka ආයතනය වන අතර, එය රු. මිලියන 11.43 ක ආයෝජනයකි.

එසේ ම 2021 ජනවාරි - පෙබරවාරි මාසයන්හි පැවැති අබුඩාබි T 20 තරගාවලිය සඳහා ද වසන්තම් TV නාලිකාව නිල රූපවාහිනී සහකරු ලෙස ක්‍රියා කරන ලදී.

වසන්තම් FM

වසන්තම් FM නාලිකාව 2021 වසරෙහි අනෙක් වසරවලට වඩා ආදායම් වර්ධනයක් පෙන්නුම් කරමින් රු. මිලියන 35.96 ක ආදායමක් උපයා ගන්නට සමත් විය. මෙම ආදායම ලබා ඇත්තේ බාහිර ක්‍රියාකාරකම්, ප්‍රචර්ධන වැඩසටහන් ආදී කිසිවකින් තොරව වීම විශේෂත්වයකි.

2021 වසර සඳහා වසන්තම් FM නාලිකාවෙහි ආයෝජන සිදු කල සේවා නියෝජිත ආයතන අතරින් ඉහලම ආයෝජනයක් Lanka Hope Media ආයතනය සිදු කර ඇති අතර, එය රු. මිලියන 4.22 කි. සේවාදායකයින් අතරින් වැඩිම ආයෝජනයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිදු කර ඇති අතර, එය රු. මිලියන 13.4 කි.

ඒ අනුව කොවිඩ්-19 තත්ත්වය හේතුවෙන් 2021 වසරෙහි වාර 02 ක දී (අප්‍රේල් සහ අගෝස්තු) රට පුරා සංචරණ සීමා පැනවූ අතර, එම තත්ත්වය යටතේ සේවාදායකයින් විසින් සිදු කරනු ලබන ආයෝජන විශාල ප්‍රමාණයක් නතර කරන ලදී. මෙය සමස්ත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ක්‍රියාකාරීත්වයට බලපෑවේ ය. මෙම තත්ත්වය යටතේ වුව ද අලෙවි අංශය විසින් 2020 වසරට සාපේක්ෂව 2021 වර්ෂයේ දී රු.මි. 200 කට වැඩි ආදායමක් උපයා ගැනීමට සමත් වීම අලෙවි අංශය ලැබූ ජයග්‍රහනයකි.

● වැඩසටහන් අංශය

ස්වාධීන රූපවාහිනිය 2021 වසරේ දී සිය 42 වන සංවත්සරය සමරන ලදී. ලෝකයට ම අභියෝගයක් වූ කොවිඩ් - 19 තත්ත්වය අප රටට ද ඉතා අයහපත් අන්දමින් බලපෑව ද ඒ සියලු දුෂ්කරතා මධ්‍යයේ ශ්‍රී ලාංකීය ප්‍රේක්ෂක ජන මනසට අධ්‍යාපනික, විනෝදාත්මක, සංස්කෘතික, සංවර්ධන, කෘෂිකාර්මික, සංගීත, ළමා, ආගමික මෙන් ම තොරතුරු වශයෙන් ඉහළ රසවින්දනයක් ලබා දීමට ස්වාධීන රූපවාහිනී සේවය ප්‍රමුඛ දායකත්වයක් ලබා දෙන ලදී.

වැඩසටහන් විකාශන කාලය

සෑම දිනකම උදෑසන 4.00 ට විකාශය ආරම්භ වන අතර රාත්‍රී 12.00 ට විකාශය අවසන් වේ. ලොතරැයි වාසනා දිනුම් ඇදීම ආරම්භ වීමත් සමඟ විකාශය තවත් පැය 1/2 න් දීර්ඝ විය. ඒ අනුව දිනපතා පැය 20 විනාඩි 30ක් පුරා නාලිකාවේ වැඩසටහන් විකාශය වේ.

විකාශය වන වැඩසටහන් සැලකීමේ දී ආයතනය විසින් නිෂ්පාදනය කරනු ලබන වැඩසටහන් 45 ක් පමණ වන අතර බාහිරින් මිල දී ගන්නා වැඩසටහන් 19 ක් පමණ වේ. එම වැඩසටහන් වලින් කොටසක් අනුග්‍රාහකත්වය සහිතව ද ඉතිරිය අනුග්‍රාහකත්වය නොමැතිව ද විකාශය වේ.

උදා විකාශය

දිනපතා උදෑසන 4.00 ට සෙත් පිරිත් සජ්ඣායනාවෙන් ආරම්භ වී පත්තර විස්තර ඇතුලත් "පත්තරමේන්තුව" හා "හත්වෙනි පැය" විකාශය වේ. ඉරිදා දින "මොහාන් සමඟ" වැඩසටහනින් ලෝකයෙහි විස්තර පිළිබඳ සාකච්ඡා වේ.

පිනිවියන උදා විකාශය 2021.01.04 දින සිට සතියේ දින පහේම පෙ.ව. 8.00 සිට මධ්‍යහන 12.00 දක්වා විකාශය වේ. මෙම උදා විකාශය විවිධ අංශයන්ගෙන් සමන්විත අතර විවිධ නිෂ්පාදකවරුන් යටතේ එම වැඩසටහන නිෂ්පාදනය වේ.

"නිම්හිම් සර" වැඩසටහනින් ආරාධිතයෙකු සහභාගී කරවා ගෙන ඔහු/ඇය කැමති ගීත ලබා දීම සිදු කෙරේ. සතියේ එක් දිනක ජ්‍යොතිෂ්‍ය වැඩසටහනක් ද, කාලීන අවශ්‍යතාවයන් මත මාතෘකාවන් තෝරා ගෙන ආරාධිත අමුත්තෙකු කැඳවා ඒ පිළිබඳ සාකච්ඡා කිරීම, එක් දිනක දේශීය වෙදකම හා සිංහල බෙහෙත්වල ඇති ගුණාත්මකභාවය පිළිබඳ සාකච්ඡා කිරීම සහ කලින් විකාශය කරන ලද ප්‍රේක්ෂක ජනප්‍රියත්වය වැඩිපුර දිනාගත් ටෙලි නාට්‍යයක් පෙ.ව. 9.30 - 10.00 දක්වා නැවත විකාශය කෙරේ. තව ද උදා විකාශනය යටතේ "Life Style" නමින් රූපලාවන්‍ය වැඩසටහනක්ද, කාන්තාවන්ට වැදගත් කාලීන මාතෘකාවන් පිළිබඳ සාකච්ඡාද, "සූප යාත්‍රා" නමින් ඉවුම් පිහුම් වැඩසටහනක්ද, "සිත් යාය" වැඩසටහනක් ද අවසාන වශයෙන් "Music @11" නමින් පුරා පැයක් ගීත ඉල්ලීම් ඇතුලත් වැඩසටහනක් ද විකාශය වේ.

සවස විකාශය

ප.ව. 12.30 - 3.30 දක්වා ටෙලි සිනමාවේ පැරණි ජනප්‍රිය ටෙලි නාට්‍යයන් පැය 03 ක් පුරා විකාශය කරන ලදී. ප.ව. 3.30 - 5.00 දක්වා "අපේ පන්තිය" නමින් අධ්‍යාපනික වැඩසටහනක් සතියේ දිනවල විකාශය කරන ලද අතර සවස 5.00 සිට කලා/ කෘෂි/ ක්‍රීඩා/ ළමා/ තරුණ/ යොවුන් වැඩසටහන් විකාශය කරන ලදී.

රාත්‍රී විකාශය

රාත්‍රී විකාශය සවස 6.00 සිට ආරම්භ කරන අතර රාත්‍රී ප්‍රමුඛ කාලය 6.00 සිට රාත්‍රී 9.30 දක්වා වේ. එම කාලය තුල ටෙලි නාට්‍ය විකාශය කරන ලදී.

ළමා වැඩසටහන්

සමනල යාය

දරුවන්ගේ සංගීතමය දක්ෂතා වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. ජනප්‍රිය සංගීත ශිල්පියෙකුගේ ගීත ඔහු ඉදිරියේ ම ළමුන් විසින් ගායනා කරනු ලැබේ. එම ගායනය පිළිබඳ විවරණයක් ද, පැමිණෙන ශිල්පියා සමඟ පිළිසඳරක් ද, ඇතුලත්ව මෙම වැඩසටහන පටිගත කෙරේ. පාසල් ළමා සංගීත කණ්ඩායම් වලට ගීත ගායනයට දක්ෂ දරුවන්ට ද අවස්ථාව හිමි වේ.

Fun Street

ළමා විනෝදාත්මක සහ දැනුම ලබා දෙන වැඩසටහනකි. වැඩසටහන් ආකෘතියට අනුව ළමුන් විවිධ චරිත නිරූපණය කරන අතර එමඟින් දැනුම, ආකල්ප සහ හැකියාවන් විවිධ අන්දමින් ඔප් නංවා ගැනීමට අවශ්‍ය පසුබිම සකසන අතර එමඟින් ඔවුන්ට විනෝදාස්වාදයක් ද ලබා ගැනීමට හැකිවේ.

ළමා පුවත්

ප්‍රවෘත්තිමය වටිනාකමක් සහිතව පාසල් පද්ධතිය තුළ සිදුවන ක්‍රියාකාරකම් පිළිබඳ ව ළමුන් දැනුවත් කිරීමත්, නොයෙකුත් ළමා සමාජ සහ ළමුන්ට වැදගත් වන සිදුවීම් පිළිබඳ ප්‍රචාරයක් ලබා දීමත්, ළමයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා කෙටි විශේෂාංග ඉදිරිපත් කිරීමත්, සංස්කෘතික, ඓතිහාසික හෝ සාමාජීය වටිනාකම් සහිත ස්ථාන පිළිබඳව නොදත් තොරතුරු ළමුන්ට ලබා දීමත් මෙම වැඩසටහන මඟින් සිදුවේ.

සඟරාමය වැඩසටහන්

හිරිමල් සවාරිය

තමන් උපන් රට පිළිබඳ ව දරුවන් තුළ පවතින දැනුම, ආකල්ප, ධනාත්මක ලෙස වෙනස් කිරීම තුලින් මාතෘ භූමිය කෙරෙහි පවතින ගෞරවය සහ ආදරය වර්ධනය කිරීම හා සම වයසේ සෙසු දරුවන් සමඟ මෙම හැඟීම් බෙදා ගැනීමට අවස්ථාව සලසා දෙන වැඩසටහනකි. එමෙන් ම සොබා දහම නිවැරදි ව විඳින ආකාරය සහ සොබා දහමට සමීප වීම තුළින් ජීවිතයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දරුවන් තුළ හැඟීමක් ඇති කිරීම ද මෙමඟින් අපේක්ෂා කරන ලදී.

කලා මංජරී

කලාවේ අපූර්වත්වය සොයා යන කලාවට ආදරය කරන සියලු දෙනාට රස විඳිය හැකි කලා කෘති රැසක එකතුවකි. රූප මාධ්‍ය හරහා රස වින්දනයත්, දැනුමත්, අවබෝධයත්, ලබා දිය හැකි නිර්මාණ සමුච්ඡයක එකතුවකි.

වෙද ගෙදර

දේශීය හා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය දැනුම නවමු ආකාරයෙන් ප්‍රේක්ෂක ජනතාව වෙත ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන නිෂ්පාදනය වේ. මෙහි නිවේදන කටයුතු මෙහෙයවන්නේ ද ආයුර්වේද වෛද්‍යවරියක් විසිනි. පාරම්පරික හා ආයුර්වේද වෙදකම නඟා සිටුවීමට මෙම වැඩසටහන තුලින් හැකියාව ලැබී ඇති හෙයින් "රයිගම්" සහ "සුමති" සම්මානද " වෙද ගෙදර" සඳහා හිමි වී ඇත.

වෙනස Plus

මෙම වැඩසටහන සංස්කෘතික, ක්‍රීඩා, පරිසර, ගුප්ත, විශේෂ චරිත, නිර්මාණ, විදෙස් විත්ති, සංචාර ආගමික හා සත්ව ආදී ක්ෂේත්‍ර රැසක් හරහා ප්‍රේක්ෂකයින්ට තොරතුරු ලබා දේ.

වෙනස වැඩසටහන හරහා විශාල වශයෙන් සමාජ සේවා කටයුතු ද සිදු කර ඇත. අසරණ අයට උදව් උපකාර කිරීම්, කෘතිම පාද ලබා දීමට, නිවෙස් සාදා ගැනීමට උදව් ලබා දීමට නිර්මාණකරුවන්ට අතහිත දීම මෙන් ම බොහෝ මානෘකා වන්නේ දකින දේ නොදකින පැත්ත සාකච්ඡා කිරීමය.

මෙම වැඩසටහන ප්‍රේක්ෂක ආකාර්ශනය දිනාගත් වැඩසටහනක් බැවින් මේ සඳහා බොහෝ සම්මාන හිමි වී ඇත.

Travel Girl

ශ්‍රී ලංකාවේ පාරිසරික සුන්දරත්වය හා ඓතිහාසික උරුමයන් මෙන් ම සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව ආකර්ශනීය ලෙස කරුණු ගෙන හැර පාමින් සංචාරක කර්මාන්තය දියුණුවට මහත් පිටුවහලක් ඉටු කරන වැඩසටහනකි.

අටපට්ටම

අඛණ්ඩව වසර 21ක පමණ කාලයක් විකාශය වන මෙම වැඩසටහන 2021 වර්ෂයේ ද ආයතනයට ඉහළ මට්ටමේ ආදායමක් උපයා දෙන ආකර්ෂණීය වැඩසටහනක් ලෙස විකාශය කිරීමට හැකි විය. ඉතා අවම පිරිවැයකින් ඉතා ඉහළ ආදායමක් ලබා ගන්නා වැඩසටහන බවටද පත් වී ඇත.

රන් බිමට අරුණැල්ල

රන්බිමට අරුණැල්ල ගවේෂණාත්මක කෘෂිකාර්මික වැඩසටහන මඟින් කෘෂිකර්මාන්තය, සත්ව නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත ස්වයං රැකියා අවස්ථාවන් ප්‍රේක්ෂක ජනතාවට ඉදිරිපත් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලුණු හා ආධුනික සෑම දැනුවත් කිරීමේ වැඩසටහනකි.

සංගීතමය වැඩසටහන්

සියපත් පොකුර

2021 වර්ෂයේ ද මෙම වැඩසටහන ධනාත්මක ප්‍රේක්ෂක ප්‍රතිචාර මැද විකාශය කරන ලදී. මේ වන විට කලාකරුවන් 50 කට අධික ප්‍රමාණයක් පිළිබඳ ව ප්‍රාසාංගික වැඩසටහනක් ලෙස විකාශය කරන ලදී.

Rhythm Of India

හින්දි ගීතයට ප්‍රිය කරන ප්‍රේක්ෂකයින් වෙනුවෙන් හා ඔවුන්ගේ ගීත ඉල්ලීම් වලට ද අවස්ථාව ලබා දෙන වැඩසටහනකි.

Chat N Music

Chat N Music වැඩසටහන නව මුහුණුවරකින් 2021 වර්ෂයේ දී ද විකාශය කරන ලදී. ප්‍රවීන හා ආධුනික ශිල්පීන් විවිධ වෘත්තිකයින්, නළු නිලියන් සහ විදේශගත ශ්‍රී ලාංකිකයින් හෝ සහභාගීත්වයෙන් සංවාදයන් සමඟ සජීව ලෙස ඉදිරිපත් කෙරේ. මෙය ප්‍රේක්ෂකයන් අතර ඉතා ජනප්‍රිය වැඩසටහනකි.

ශනිදා සාදය

ශ්‍රී ලාංකික සුභාවිත ගීතය පෝෂණය කිරීමෙහිලා 2016 වසරේ ද ආරම්භ කරන ලද සංගීතමය වැඩසටහනකි. මෙහි දී විවිධ ගායකයන්ගේ විවිධ ගීත රචකයන්ගේ විවිධ සංගීතඥයින්ගේ ගීත ළමයින් 8 දෙනෙකු විසින් ගායනා කරනු ලබයි. මෙයට 08 දෙනෙකුගෙන් යුත් වාදක මඩුල්ල සංගීතය සජීවී ව සපයනු ලබයි.

31st Night - ආසියානු තරු පලස

ස්වාධීන රූපවාහිනීය OBS Air ආයතනය එක්ව 2021.12.31 දින රාත්‍රී "ආසියානු තරු පලස" නමින් සංගීත ප්‍රසංගයක් පවත්වන ලද අතර එය සජීවී ව විකාශය කරන ලදී.

Voice of Colombo

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ස්වාධීන රූපවාහිනී සේවය එක්ව සංවිධානය කරනු ලබන මෙම රියැලිටි වැඩසටහන රාජ්‍ය සේවකයින් ගේ ගායන කුසලතා ඔප් නංවා ගැනීමට මහත් රුකුලක් වනු ඇත. මෙම වැඩසටහනේ අවසන් වැඩසටහන 2022 ජනවාරි 29 වන දින පවත්වන ලදී.

සාකච්ඡාමය වැඩසටහන්

දොරමඩලාව

ජාතියේ රූපවාහිනී සරසවිය ලෙස කීර්තියක් දිනා ගනිමින්, වසර 21ක පමණ කාලයක සිට විකාශය වන මෙම වැඩසටහන අඛණ්ඩව, ජනප්‍රියත්වය හා ගුණාත්මකභාවය රැකගනිමින් 2021 වර්ෂයේ ද විකාශය කිරීමට හැකි විය.

2021 වර්ෂයේ පැවති SLIM Nielsen ජනතා සම්මාන උළෙලේ දී අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම රූපවාහිනී වැඩසටහන් 4 අතරට නිර්දේශ වීම කැපී පෙනෙන සිදු වීමකි.

වාණිජමය වශයෙන් ආයතනයට ඉහළ ප්‍රතිලාභ අත්කර දෙන වැඩසටනක් ලෙස පවත්වා ගැනීමට හැකි විය.

Medical Clinic

ශල්‍යාගාරයක් තුල කෙරෙන බරපතල ගණයේ ශල්‍ය කර්ම, ප්‍රවීන වෛද්‍ය විද්‍යා දැනුම මෙම වැඩසටහන තුලින් රූපවාහිනී ප්‍රේක්ෂකයාට ලබා දීමට හැකියාව ලැබී ඇත.

හිත ගාව

මෙම වැඩසටහන මනෝ වෛද්‍යවරයෙකු සහ මනෝවිද්‍යා උපදේශකයෙකුගේ සහභාගීත්වයෙන් මිනිසුන්ගේ විවිධාකාර වූ මානසික ප්‍රශ්න හා ඒ සඳහා ලබා දිය හැකි විසඳුම් පිළිබඳ ව සාකච්ඡාමය වැඩසටහනකි.

වාර්තා වැඩසටහන්

ජනමාධ්‍ය පොකුණේ සුපිපි සියපත

අභාවප්‍රාප්ත කලා කීර්ති එඩ්වින් ආරියදාසයන්ගේ චරිතාපදානය හා ඔහු විසින් ඉටු කළ මාධ්‍ය හා සමාජ සේවාව අළලා නිෂ්පාදිත වැඩසටහනකි. මෙහි ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නවකයන් වෙනුවෙන් උපදෙස් රැසක් අන්තර්ගත ව තිබුණි.

"සඳහිරු සෑය" වාර්තාමය වැඩසටහන සහ සජීව විකාශය

රට වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන් සිහි කිරීම වෙනුවෙන් අනුරාධපුරයේ ඉදි කරන ලද සඳ හිරු සෑය 2021 නොවැම්බර් මස 18 වන දින සම්බුදු සසුන වෙත පූජා කරන ඓතිහාසික මොහොත සජීවීව විකාශය කරන ලද අතර ඒ සම්බන්ධව වාර්තාමය වැඩසටහනක් ද එදින ම විකාශය කරන ලදී.

මහා ඇල දිගේ වාර්තාමය වැඩසටහන් මාලාව

මෙම වැඩසටහන මඟින් මිනිපේ ඇල යෝජනා ක්‍රමය, මහ ඇල යෝජනා ව්‍යාපෘතිය, වයඹ ඇල මහවැලි යෝජනා ව්‍යාපෘතිය හා එම ප්‍රදේශවල ගොවීන්ට හා ජනතාවට එයින් ලැබෙන ප්‍රතිලාභ හා ආර්ථික දියුණුව සම්බන්ධයෙන් සාකච්ඡා කෙරේ.

සූර්ය මංගල්‍යය - 2021

හෙළයේ මහා සිරිත් මංගල්‍යය

සෑම වර්ෂයක ම අප්‍රේල් මස පැවැත්වෙන සිංහල, දෙමළ අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් සජීවීව විකාශය කරනු ලබන සූර්ය මංගල්‍යය වැඩසටහන මෙවර Covid - 19 තත්වය බරපතල ව රටේ පැතිර තිබූ අවස්ථාවක වූව ද ශ්‍රී ලංකා යුධ හමුදාව සමඟ එක්ව මින්නේරිය වැව් තාවුල්ලේ සිට සාර්ථක ලෙස පටිගත කොට විකාශය කරන ලදී.

මීට අමතරව විවිධ පරම්පරාවල කලා පවුල් 05 ක් සම්බන්ධ කර මහගෙදර අවුරුද්ද නමින් වැඩසටහනක්ද, ටෙලිතරු රැල්ලේ සූර්ය මංගල්‍ය නමින් කලාකරුවන් වෙනුවෙන් අවුරුදු උත්සවයක්ද, සෙල්ලම් ගෙදර අවුරුදු නමින් ළමා අවුරුදු උත්සවයක් ද පවත්වා විකාශය කරන ලදී.

ක්‍රීඩා වැඩසටහන්

වොලිබෝල් සජීව විකාශයන්

2021 වර්ෂයේ දී Galaxy Volley Ball නමින් නව තරඟාවලියක් විකාශය කිරීමට හැකි විය. එමෙන් ම Munchee Volley Ball තරඟාවලිය ද සාර්ථකව විකාශය කිරීමට හැකි විය.

School Boy Cricketer

අනාගත ක්‍රිකට් වසන්තයේ තරු සැණකෙළි 2020 සහ 2021 යන වර්ෂ දෙකේ ම වසරේ ජනප්‍රියතම ක්‍රිකට් ක්‍රීඩකයා සහ ක්‍රීඩිකාව තෝරා පත්කර ගැනීමේ සංවිධාන උළෙල විකාශය කරන ලදී.

T - 10 ක්‍රිකට් සජීව විකාශය

පළමු වරට T - 10 ක්‍රිකට් තරඟාවලියක් අප මාධ්‍ය ජාලයේ විකාශය කිරීමට හැකිවිය.

දේශපාලන වැඩසටහන්

"තුලාව"

පක්ෂ විපක්ෂ දේශපාලන පක්ෂ 04 ක සමාජිකයන් සහභාගි වෙමින් කාලීන මාතෘකා යටතේ සංවාද පවත්වන "තුලාව" දේශපාලන වැඩසටහන 2021 වර්ෂයේ ද විකාශය විය.

"තීරණය"

දේශපාලන පක්ෂ වල නායකයින්, ආර්ථික විද්වතුන්, රාජ්‍ය සහ සංස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෛද්‍යවරු ආදී රටේ විවිධ ක්ෂේත්‍රීය නියෝජනය කරන ඉහළ පරිපාලන නිලධාරීන් සහභාගී වන කාලීන වැඩසටහනකි.

ආගමික වැඩසටහන්

"සවනක් රැස් "

වසර ගණනාවක සිට සෑම පුර පසළොස්වක පොහොය දිනකම විකාශය කරන ලද "සවනක් රැස්" සජීව වැඩසටහන මෙම වර්ෂයේදී ද දිවයිනේ නොයෙකුත් සිද්ධාස්ථාන තෝරා ගෙන සෑම පොහොය දිනකම විකාශය විය.

"සංඝාධිකරණය"

ස්වාමීන් වහන්සේලා දෙනමකගේ සහභාගීත්වයෙන් සමාජීය ගැටළු සහ බුදු දහම පිළිබඳව සාකච්ඡාවක් මෙම වැඩසටහන මඟින් සිදු කරන ලදී.

"නැගෙන ලොවට ඇසෙන දහම"

ස්වාමීන් වහන්සේලා දෙනමකගේ සහ මහාචාර්යවරයෙකුගේ සහභාගීත්වයෙන් ලෝවැඩ සඟරා කවි පිළිබඳ විවරණයක් මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ. මෙම වැඩසටහන පොහොය දින විකාශය වූ "සංඝාධිකරණය" වැඩසටහන වෙනුවට 2021 සැප්තැම්බර් මස සිට විකාශය විය.

වෙසක් වැඩසටහන්

2021 මැයි 26 දින "ආලෝකෝ උදපාදී" වෙසක් වැඩසටහන තේමාව යටතේ නිෂ්පාදනය කරන ලද "තක්ක ජාතකය" කථා පුවත විදහා දැක්වෙන ඩිජිටල් තොරණ රාත්‍රී 7.00 සිට විකාශය වූ ආලෝකෝ උදපාදී වැඩසටහනේ දී කොටස් වශයෙන් විකාශය විය. තවද, වෙසක් සතිය නිමිත්තෙන් ධම්ම පදය, වෙසක් නිසදැස්, වෙසක් සිරිය ගෙන එන ගාථා පටිගත කොට අනුග්‍රාහක වැඩසටහනක් ලෙස විකාශය කරන ලදී.

නත්තල් වැඩසටහන්

2021 වර්ෂයේ නත්තල වෙනුවෙන් කතෝලික දේව මෙහෙය මීගමුව ශාන්ත කයිතානු දේවස්ථානයේ දී හා ක්‍රිස්තියානි නත්තල් දේව මෙහෙය ගාලු මුවදොර ක්‍රිස්තු දෙව් මැදුරේ සිට විකාශය කරන ලදී.

මීට අමතරව ක්‍රිස්තියානි හා කතෝලික සභාවලට අයත් දිවයිනේ නොයෙකුත් ප්‍රදේශ ආවරණය වන පරිදි කැරොල් ගීත කණ්ඩායම් අප ආයතනයට කැඳවා පටිගත කොට "නත්තල් ගී මිහිර" නමින් විකාශය කරන ලදී.

අධ්‍යාපනික වැඩසටහන්

යෞවනය

දරුවන් තුළ විද්‍යාත්මක දැනුම ඉහළ නැංවීමටත්, රස වින්දන ශක්තිය ඉහළ නැංවීමටත්, විද්‍යාත්මක පර්යේෂණ, නව නිර්මාණ, ව්‍යවසායකත්වය පිළිබඳ කැමැත්තක් ඇති කිරීම හා ඒ පිළිබඳ දැනුම ඉහළ නැංවීම මෙම වැඩසටහනේ අරමුණ විය.

තක්ෂිලාව

වසර ගණනාවක සිට දැයේ දූ දරුවන්ගේ අධ්‍යාපන කුසලතා ඔප් නංවා ගැනීමට උපකාර වූ තක්ෂිලාව වැඩසටහන 2021.05.29 දින සිට අ.පො.ස(සා/පෙළ) සහ අ.පො.ස(උ/පෙළ) දරුවන් ඉලක්ක කර ගනිමින් විකාශය කර ඇත.

ITN අපේ පන්තිය

2021.08.06 දින සිට ප.ව. 3.30 - 4.55 දක්වා ජාතික අධ්‍යාපනික ආයතනය හා එක්ව ITN අපේ පන්තිය අධ්‍යාපන වැඩසටහන විකාශය ආරම්භ කරන ලදී.

Smart 5

ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටින 5 ශ්‍රේණියේ සිසුන්ගේ දැනුම දියුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන විකාශය විය. මෙම වැඩසටහන 2021 වසරේ කොවිඩ් වසංගතය හමුවේ නිවසේ රැඳී සිටි දරුවන් වෙනුවෙන් කරන ලද මහඟු සත්කාරයක් විය.

"ITN Smart Mind"

ප්‍රේක්ෂකයාගේ දැනුම දියුණු කිරීමට සහ අනෙකුත් නාලිකා අභිබවා ගුණාත්මක වැඩසටහන් ඉදිරිපත් කිරීමේ අරමුණින් 04 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසල් සිසුන් සහභාගී කර ගනිමින් මෙම ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන විකාශය කරන ලදී.

ITN ටෙලි විෂන් ඉස්කෝලේ

කොවිඩ් තත්ත්වය හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රය අඩාල වී තිබූ අවස්ථාවේ කාලීන අවශ්‍යතාවයක් ලෙස ඇරඹුණු "ITN ටෙලි විෂන් ඉස්කෝලේ" වැඩසටහන 2021 වසරේද ඉතා ජනප්‍රිය වූ අතර, ආයතනයට වාණිජමය වශයෙන් ආදායමක් ලබා ගැනීමට ද හැකි විය.

Gadget Mania

ලෝකයේ නව තාක්ෂණ ප්‍රවණතාවය ඔස්සේ විවිධ තාක්ෂණික මෙවලම් පිළිබඳ කෙරෙන ගවේෂණශීලී විචිත්‍රාංගයකි.

දැනුමයි වාසනාවයි.

ලංකාවේ පාසැල් දරුවන්ගේ දැනුම මිණුම් ඇගයුමට ලක් කෙරෙන මෙම ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන තුළින් ITN නාලිකාව ප්‍රවර්ධනයට හේතු වී ඇත.

හඬ කවන ලද වැඩසටහන්

Shadow of the Elves Cartoon කථා මාලාව සිංහලට හඬ කවා "සුර මිටියාවත" නමින් ඉරිදා දිනවල විකාශය කරන ලදී.

NLB ලොතරැයි දිනුම් ඇදීම.

2021.04.19 දින සිට රාත්‍රී 9.30 ට ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන විකාශය කරන ලදී. එමඟින් විශාල ප්‍රේක්ෂක පිරිසක් නාලිකාව වෙත ආකර්ශනය කර ගැනීමට හැකිවී ඇත.

ලිය වරුණ

මාර්තු මස 08 වන දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් සෞඛ්‍ය නීති රීතිවලට අනුගත වෙමින් HD මැදිරියේදී විකාශය කරන ලදී.

මෙහිදී කාන්තාව ඉලක්ක කර ගනිමින් ඇයගේ ජීවිතය ශක්තිමත් කිරීමටත් නිවසේ ආර්ථිකයට හා සමාජීය වශයෙන් ඇයව බල ගැන්වීමටත් අත්වැලක් සපයන ලදී.

ටෙලි නාට්‍ය

බාහිර විද්වතුන්/ කලාකරුවන් හා විචාරකයන්ගෙන් යුක්ත වූ පූර්ව දර්ශන මණ්ඩලයක නිර්දේශ මත වෙළඳපොළ තරඟකාරීත්වය හා ගුවන් කාලයන්හි රේටින් අගයන් සැලකිල්ලට ගෙන නාට්‍යයේ ගුණාත්මක බව, නිර්මාණශීලිත්වය, වියදම මෙන් ම එහි අලෙවියට ඇති පහසු අපහසුතා ද, අනෙක් නාලිකාවල මිලදී ගැනීමේ තරඟකාරීත්වය ද සැලකිල්ලට ගෙන ටෙලි නාට්‍ය විකාශනයට කටයුතු කර ඇත.

නව ටෙලි නාට්‍ය සමඟ පැරණි ගුණාත්මක ටෙලි නාට්‍යන් ද විකාශය කරන ලද අතර නව ටෙලි නාට්‍ය මිලදී ගැනීමට යන මුදල ද ඉතිරි කර ගැනීමට හැකි විය.

සතියේ දිනවල ටෙලි නාට්‍ය

Interනැසනල් 01, කොහොල්ලෑවේ දේවතාවි, සත් වර්ෂා, ඉස්කෝලෙ කාලේ, එකගෙයි කුරුල්ලෝ, සක්මන් චායා, සංසාර සිහිනේ, ලෙන්ගතු අසපුව, නාඩි, හදවිල අරණ, සකුණ පියාපත්, Interනැසනල් 02, ගිරිකුළ, වනවඳුලේ වසන්තය, කටු ඉඹුල, අප්පච්චි, සහෝදරයා, බැද්දේගෙදර, Metro හීන, Bro, ආලියා, පෝක් වීදිය, හිතුවක්කාරී, පාවෙන යකඩ සහ කොළඹ ඉතාලිය එම ටෙලි නාට්‍ය අතර ප්‍රධාන තැනක් ගනී.

සති අග ටෙලි නාට්‍ය

"සති අන්තයේ නිදහස් සති අග" ලෙසින් සම්භාව්‍ය නාට්‍ය සති අග විකාශය විය. අයාල්, යුග විලක්කුව, දුන්හිඳ අද්දර, සැප්තැම්බරයේ දිගු දවසක්, අසංවර වැස්සක්, තාදී, අඳුන් ගිර, මහපොළොව, සකර්ම, මාණික්කාවත, ගරුඬ මුහුර්තය, පිං කෙත, දියසුළිය, චක්‍ර, පිච්ච මල සුවඳයි ඒ අතර වේ.

රජයේ සංවර්ධන වැඩසටහන්

- සෞභාග්‍යයේ දැක්ම පෙර දැරිව 2020 - 2025 "සැමට පානීය ජල යෝජනා ක්‍රමය" ජනතා අයිතියට පත් කිරීම. රජයේ සංවර්ධන වැඩසටහනක් ලෙස ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ සිට විකාශය විය.
- ගුණ නැණ බල සහිත ළමා පරපුරක් බිහිකිරීම වෙනුවෙන් යහපත් දෙමාපියභාවය ඇති කිරීම සඳහා කොළඹ නිදහස් චතුරස්‍රයේ දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කාන්තා දින සැමරුමක් ලෙස පැවැත් වූ අම්මාවරුනේ වැඩසටහන විකාශය කරන ලදී.
- ජනතාවගේ නව නිර්මාණ, නවෝත්පාදන දිරි ගැන්වීමට හා හඳුන්වා දීමට කටයුතු කරන ලද, "එක මගේ රට" වැඩසටහන මේ වර්ෂයේ ද ජුනි මස දක්වා විකාශය කරන ලදී.
- "වාරි සෞභාග්‍යයා" වැඩසටහන 2021.02.05 දින අනුරාධපුරයේ සිට සජීව විකාශය කරන ලදී.
- "සුරකිමු ගඟ" - අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් කතරගම දී පැවති උත්සවය 2021.03.22 දින සජීව විකාශය කරන ලදී.
- "පෝර්ට් සිටි ඇත්ත කතාව" යනුවෙන් සාකච්ඡාමය වැඩසටහනක් 2021.04.20 දින සජීවීව විකාශය කරන ලදී.
- රුවන්පුර අධිවේගී මාර්ගයේ සමාරම්භක උත්සවය අරලියගහ මැදුරේ සිට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ එක් ව 2021.05.07 දින සජීවීව විකාශය කරන ලදී.
- "උරුමය" නමින් නූතන කෘෂි විප්ලවය පිළිබඳ සාකච්ඡාමය වැඩසටහන් පෙළක් සජීවීව විකාශය කරන ලදී.
- සෞභාග්‍යයේ මං පෙත් - නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා ඉදි කරන කුළුණු මත ඉදිවන අධිවේගී මාර්ගය සහ ගුවන් පාලම ඉදිකිරීමේ සමාරම්භක උත්සවය - අරලිය ගහ මන්දිරයේ සිට සජීවීව 2021.06.07 දින විකාශය කරන ලදී.
- "ගම සමඟ පිළිසඳර" වැඩසටහන 2021.03.07 සහ 2021.06.12 දින විකාශය කරන ලදී.
- සෞභාග්‍යයේ පෙර පාසල හා ගුරු අභිමානී සමාරම්භක උළෙල සජීවීව 2021.06.17 දින විකාශය කරන ලදී.
- සෞභාග්‍යයේ නිෂ්පාදන ගම්මානය - සාමාරම්භක උත්සවය 2021.07.01 දින සජීවීව විකාශය කරන ලදී.
- සෞභාග්‍යයේ මංපෙත් විප්ලවය - 2021.07.02 දින සජීවීව විකාශය කරන ලදී.
- ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් පැවති "දොරින් දොරට කප්රුක" වැඩසටහනේ සමාරම්භක උළෙල සජීවීව 2021.07.10 දින විකාශය කරන ලදී.
- "සිපගමු මව්පස" යනුවෙන් රසායනික පොහොර පිළිබඳ සාකච්ඡාමය වැඩසටහනක් 2021.07.17 දින විකාශය කරන ලදී.
- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 76 වන සමුළුවට සහභාගී වූ ජනාධිපතිතුමා විසින් කරන ලද කථාව විකාශය කරන ලදී.

• යාපනය - නාගදීපය ජල පිරිපහදු ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කිරීම පිළිබඳ උත්සවය අරලිය ගහ මන්දිරයේ සිට සජීවීව 2021.10.06 විකාශය කරන ලදී.

• සෞභාග්‍යයේ මංපෙත් විප්ලවය - මාර්ග 1500 විවෘත කිරීමේ සාමාරම්භක උත්සවය මාතර සිට සජීවීව 2021.11.06 දින විකාශය කරන ලදී.

• අභියෝග මැද සෞභාග්‍යයේ දෙවසර වැඩසටහන 2021.11.20 දින විකාශය කරන ලදී.

• කැළණි රන් පිවිසුම - අධිවේගී මාර්ගය විවෘත කිරීම සහ නව කැළණි පාලම ජනතා අයිතියට පත් කිරීම පිළිබඳ වැඩසටහනක් විකාශය කරන ලදී.

• සෞභාග්‍යයේ පෙරමං ලකුණු - පසුගිය දෙවසර තුළ රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ වැඩසටහනක් 2021.12.04 දින විකාශය කරන ලදී.

• බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "යුගයක නිමැවුම්" ප්‍රදර්ශනය 2021 දෙසැම්බර් 17 සිට 19 දින දක්වා මහනුවර Kandy City Centre හීදී පැවැත්විණි. මේ සඳහා සජීවී තත්ව වාර්තා සහ සාකච්ඡාමය වැඩසටහන් 02ක් ලබා දෙන ලදී.

<u>සමාජ සත්කාර වැඩසටහන්</u>

• කොරෝනා තත්ත්වය නිසා ඇතිවූ වසංගත තත්ත්වය වෙනුවෙන් ශ්‍රී ලාංකීක ජනතාව මෙන් ම ලෝවැසි ජනතාවට සෙත්පතා නවගමුව දේවාලයේ සත්පත්තිනි මැණියන්ට වූ භාරය අළුත් කිරීමේ පූජාවක් 2021.08.28 දින සජීවීව විකාශය කරන ලදී.

• 2021.05.08 දින ප.ව. 5.30 සිට ප.ව. 6.45 දක්වා රටට සෙත්පතා විශ්ව ආශිර්වාද පූජාව කොළඹ ගංගාරාම විහාරයේ සිට සජීවීව විකාශය කරන ලදී.

• කොරෝනා අවදානම පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදෙස් ඇතුලත් කෙටි, දිගු වැඩසටහන් විකාශය කිරීම සහ කෙටි පණිවිඩ විකාශය කිරීම.

• "වසන්තය එනවා සත්තයි" යනුවෙන් කොවිඩ් - 19 තත්ත්වය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 02 ක් විකාශය කරන ලදී.

• දේශපාලන/ ආර්ථික/ සමාජයීය/ ආගමික ආදී අංශයන් පිළිබඳ ව සාකච්ඡා කරන සිව්මංසල වැඩසටහන් පෙළ ගැස්මේ ද ලැබෙන කාල වේලාව අනුව විනාඩි 20 සහ විනාඩි 15 වැඩසටහන් විකාශය කරන ලදී.

• "මනුසත් කමින් පිරි ලේ බිඳක්" යනුවෙන් ITN ලේ දන්දීමේ වැඩසටහනක් 2021.07.03 දින ආයතන පරිශ්‍රයේදී පැවැත්විණ. කොවිඩ් අවදානම මධ්‍යයේ වූවද මේ සඳහා විශාල පිරිසක් සහභාගී විය.

ඒ අනුව 2021 වර්ෂයේදී ද ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වෙනුවෙන් වැඩසටහන් අංශය අති විශාල කාර්යභාරයක් ඉටු කර ඇත.



● ඉංජිනේරු අංශය

වැඩසටහන් නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මැදිරි පහසුකම් වැඩි දියුණු කිරීම, සුපැහැදිලි දර්ශණ ජනතාව වෙත යොමු කිරීම සඳහා ප්‍රධාන පාලක මැදිරි, සම්ප්‍රේෂණ පහසුකම් හා ඊට අදාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා තාක්ෂණය සමඟ යාවත්කාලීන වන තොරතුරු තාක්ෂණික පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ඉංජිනේරු අංශයට අදාල කාර්යයන් වේ.

ඒ අනුව ඉදිරියේ දී ක්‍රියාත්මක වීමට නියමිත ඩිජිටල් විකාශණ ක්‍රමවේදය සඳහා, මේ වන විට භාවිත කරන ඇනලොග් තාක්ෂණයේ යටිතල පහසුකම්, එනම් ජාල පද්ධති (Broadcast Local Area Network), මැදිරි උපකරණ හා පහසුකම්, ප්‍රධාන පාලක මැදිරිය හා අනුබද්ධ පහසුකම් තවදුරටත් භාවිතා කිරීමට නොහැකි වන බැවින් මෙම යටිතල පහසුකම් නවීන තාක්ෂණයට හා ඩිජිටල්කරණය සඳහා සූදානම් කිරීමට කටයුතු යොදා ඇත. ඩිජිටල් තාක්ෂණ විකාශණය සඳහා නිෂ්පාදනය වන වැඩසටහන් ඩිජිටල් ශ්‍රව්‍ය හා දෘශ්‍ය සංඥා වශයෙන් (Digital Video /Audio Signal) ඉතා ගුණාත්මක තත්ත්වයෙන් හා සුපැහැදිලි දසුන් සහිතව පැවතිය යුතු අතර වන ඒ සඳහා ප්‍රධාන පාලක මැදිරිය හා මැදිරි අංශවල අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කරමින් පවති.

කෝවිඩ් 19 තත්ත්වය මත පනවන ලද සංචරණ සීමා හේතුවෙන් බොහෝ නිෂ්පාදන සමාගම් හා දේශීය නියෝජිත ආයතන ඔවුන්ගේ රාජකාරි කටයුතු සීමාකිරීම, මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීමේ ප්‍රමාදය, හා ණයවර ලිපි නිකුත් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ආනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් සැලසුම් කර තිබූ පරිදි බොහෝ ව්‍යාපෘතීන් 2021 වසරේ දී අපේක්ෂා කළ අයුරින් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් ඒ හා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු දිගටම ක්‍රියාත්මක කල අතර එම කටයුතු 2022 මුල් කාර්තුවේ දී අවසන් කිරීමට නියමිතය.

වසන්තම් ටීවී නාලිකාව මෙරට දමිළ බස කථා කරන ශ්‍රී ලාංකික ජනතාව වෙත සුපැහැදිලි දසුන් නැරඹීමට හා දේශීය දමිළ වැඩසටහන් නිෂ්පාදනය කර විකාශණය කිරීමට හැකිවන පරිදි වැඩිදියුණු කිරීම සහ ආවරණ කලාපය පුළුල් කිරීම සඳහා 2018 වසරේ අනුමත අයවැය යෝජනාවකි. ඒ අනුව ආරම්භ කළ ද්විපාර්ශවික ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 314 කි. 2019 වසර තුල අපේක්ෂිත අරමුදල් නොලැබීම හේතුවෙන් ව්‍යාපෘති කාලය වසර 03 ක් දක්වා දීර්ඝ කිරීමට සිදුවිය. 2020 වසරේ රුපියල් මිලියන 40.037 වියදම් සිදුකල අතර ඇනලොග් තාක්ෂණය යටතේ සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට ප්‍රාග්ධන අරමුදල් ලබා ගැනීමට මෙමගින් යෝජනා වුව ද, 2021 වසරේ මෙරට රූපවාහිනී ඩිජිටල් තාක්ෂණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමඟ ඩිජිටල්කරණය වීම පිළිබඳව ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ද අවධානය යොමුකර ඇත. එබැවින් 2021 වසරට වෙන්වූ නමුත් වියදම් නොකල රුපියල් මිලියන 209.96 ක අරමුදල් මහා භාණ්ඩාගාරයට නැවත පවරන ලදී. 2022 වර්ෂයට මෙම මුදල මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අපේක්ෂිතය. 2021 වසර අග වන විට ව්‍යාපෘතිය සඳහා මුළු වියදම රුපියල් මිලියන 73.337 කි.

● ITN ඩිජිටල් අංශය

ලෝකයේ මාධ්‍ය ක්ෂේත්‍රයේ ඇතිවන්නා වූ නව ප්‍රවණතා හඳුනා ගනිමින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තරඟකාරීව නව මාධ්‍ය (New Media) භාවිතා කිරීම ආරම්භ කර ඇති අතර ඒ අනුව පහත සඳහන් අරමුණු ඉටු කරගැනීමට අපේක්ෂා කෙරේ.

i) වෙබ් අඩවි (Web Sites), සමාජ මාධ්‍යජාලා (Social Media), දුරකථන කෙටි පණිවිඩ හා ස්මාට් ජංගම දුරකථන ඔස්සේ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත්වන සියලුම ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා සඳහා ප්‍රේක්ෂක ආකර්ෂණය ලබා ගැනීම මගින් වෙළඳ වටිනාකම හා ආදායම තවදුරටත් වර්ධනය කරගැනීම.

ii) සමාජ මාධ්‍යජාලා හා නව මාධ්‍ය බෙදා හැරීමේ වේදිකා (Over The Top Platforms) භාවිත කරමින් ශ්‍රව්‍ය දෘෂ්‍ය නිර්මාණ, සජීවිකරණ නිර්මාණ, රූප නිර්මාණ හා ලිපි නිර්මාණ සඳහා වගකීමක් සහිත රාජ්‍ය මාධ්‍යක් ලෙස නව මාධ්‍ය භාවිතා කරමින් නව ව්‍යාපාරික අවස්ථාවක් ගොඩනැගීම.

ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත්වන සියලුම ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා සඳහාත් ප්‍රවෘත්ති හා විශේෂිත වූ වැඩසටහන් (Youth With Talent වැනි) සඳහාත් නිර්මාණය කර ඇති වෙබ් අඩවි, YouTube Channel, Facebook Page හා අනෙකුත් සමාජ මාධ්‍යජාලා වලින් සමන්විත එකතුවක් ITN Digital වශයෙන් ක්‍රියාත්මක වේ.

ඒ මගින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ නිෂ්පාදනය කරනු ලබන ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන්, සජීවිකරණ නිර්මාණ නව මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම සිදුකරණු ලබයි. මේ සඳහා වෙබ් අඩවි, facebook හා YouTube යන නව මාධ්‍ය කාලානුරූපීව යාවත්කාලීන කරන ලද අතර ලොව ඕනෑම තැනක සිට ජංගම දුරකථනය ඔස්සේ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත්වන සියලුම ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා සජීව ලෙස නැරඹීමට හැකි ලෙස ස්මාට් ජංගම දුරකථන App එක නිර්මාණය කර තිබේ. එසේම අවසන් පැය 6 තුල විකාශය වූ වැඩසටහන් නැවත නැරඹීමේ පහසුකම සහිත දැනට ශ්‍රී ලංකාවේ රූපවාහිනී නාලිකාවක් සතු එකම App එක මෙයයි.

YouTube ආයතනයේ Gold Play Button, ITN Sri Lanka YouTube චැනලය ලබාගෙන ඇති අතර ITN Digital හරහා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත්වන සියලුම ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකාවල වැඩසටහන් නව මාධ්‍ය තුල ප්‍රවර්ධනය කර ඒ මඟින් ප්‍රේක්ෂක ආකර්ෂණය ලබා ගැනීම සිදුකරණු ලබයි.

ITN Digital යටතේ ඇති වෙබ් අඩවි, facebook හා YouTube ඔස්සේ වැඩසටහන් ප්‍රචාරය කොට ප්‍රේක්ෂක ප්‍රතිචාරය අනුව කාලානුරූපීව සකසන මිළ කාඩ්පතක් (Rate Card) මගින් ITN Digital අලෙවි කටයුතු සිදුකරනු ලබයි. මේ වනවිට අලෙවි අංශය මගින් YouTube හා Facebook වැඩසටහන් සඳහා වෙළඳ දැන්වීම් ලබා ගැනීමෙන් ද ආදායම වර්ධනය කර ඇත.

තවද YouTube ඔස්සේ ප්‍රචාරය වන වැඩසටහන් සඳහා වන ප්‍රේක්ෂක ඉල්ලුම මත Google ආයතනයෙන් ලැබෙන ආදායම වර්ධනය කිරීම හා නව ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇත.

2021 වසර වනවිට ITN YouTube චැනලයේ සමස්ථ ග්‍රාහකයින් 1,000,000 දක්වා වර්ධනය වෙමින් ග්‍රාහකයින් 334,000 ක් එකතු වී ඇති අතර මිලියන 720.3 ක සමස්ථ ග්‍රාහක නැරඹුම් ප්‍රමාණයක් හා රුපියල් මිලියන 118.9 ක සමස්ථ ආදායමක් පෙන්වමින් 2021

වසර තුල රුපියල් මිලියන 48.9 උපයා ඇත. තව ද YouTube ආයතනයේ Gold Play Button ලබාගැනීමට හැකිවිය.

මීට අමතරව වසන්තම් ටීවී, ලක්හඬ, YouTube චැනල ආදායම් ඉපයීම ආරම්භ කර ඇති අතර හා ආයතනයෙහි Facebook චැනල ද විශාල ග්‍රාහකයින් පිරිසක් ආකර්ෂණය කර ඇත.

ඉහතින් දක්වා ඇති ITN Digital ක්‍රියාකාරිත්වයට අමතරව ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත් සියලුම වැඩසටහන් හා නිර්මාණ (Content) හි පූර්ණ අයිතිය ස්වාධීන රූපවාහිනිය සතුව තබාගනිමින් පවතින නව මාධ්‍ය බෙදා හැරීමේ වේදිකා (OTT Platforms), චන්ද්‍රිකා විකාශනයන් (Satellite), රැහැන් ගත විකාශනයන් (PEO TV, Cable TV), අන්තර්ජාල සජීවී විකාශ (Live Streaming) හා ඉල්ලුම මත බාගත කල හැකි පද්ධති (On Demand) සඳහා ඉහතින් දක්වා ඇති වැඩසටහන් හා නිර්මාණ (Content) ලබා දී ආදායම් උපයා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

ඒ අනුව ඉහත පහසුකම් සපයන ආයතන සමග ආයතනය සතු Content වාණිජ පදනම මත බෙදාහැරීම මඟින් ද ආයතනයට අමතර අදායමක් උපයාගත හැකි බැවින් ඒ පිළිබඳ අධ්‍යනය කරමින් සිටියි.

ඉලක්ක

- 2022 අවසන් වනවිට සමස්ථ ITN Sri Lanka YouTube ග්‍රාහකයන් මිලියන 1.5 දක්වා වැඩි කර ගැනීම හා ඒ අනුව ආදායම තවදුරටත් වර්ධනය කර ගැනීම.
- ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අනුබද්ධ අනෙකුත් නාලිකා වල YouTube Channel හා Facebook වර්ධනීය තත්වයකට ගෙන ඒම හා ආදායම් ඉපයීම.
- Content ID පහසුකම ලබාගැනීම, බහු නාලිකා ජාලයක් සමඟ (Multi Channel Network) සම්බන්ධ වීම හෝ එහි හවුල්කාරිත්වය ලබාගැනීම. එමඟින් ග්‍රාහකයින් සහ ආදායම වැඩි වර්ධනයක් ලබාගැනීම.
- නව මාධ්‍ය බෙදා හැරීමේ වේදිකා වන OTT හා VOD වැනි ක්‍රමවේදවලට අනුගතවෙමින් ආදායම් හා ග්‍රාහකයන් වර්ධනය කරගැනීමේ නව උපාය මාර්ග වලට යොමුවීම.

YouTube Analytics - ITN Sri Lanka

Category - YouTube	2020	2021
Total Views	276.1 M	255.6M
New Subscribers	403.9 K	334 K
Total Subscribers	650K	1000K
Estimated Revenue Each Year	Rs 48.9 M	Rs 48.9 M
Total Revenue cumulative	Rs 71.2 M	Rs 118.9 M

YouTube Analytics - Lakhanda

Category - YouTube	2020	2021
Total Views	1.2M	2.2M
New Subscribers	9.1K	20.9K
Total Subscribers	15.9K	36.8K
Estimated Revenue Each Year	Rs 60,981.00	Rs 291,363.00
Total Revenue cumulative	Rs 127,056.00	Rs 418,420.00

YouTube Analytics – Vasantham TV

Category - YouTube	2020	2021
Total Views	895.7K	622.4K
New Subscribers	18.2K	9.4K
Total Subscribers	35.1K	44.5K
Estimated Revenue Each Year	Rs 47,401.00	Rs 37,841.00
Total Revenue cumulative	Rs 65,864.00	Rs 103,705.00

YouTube Analytics – ITN News

Category - YouTube	2020	2021
Total Views	1.9M	987.5K
New Subscribers	25.3K	10.9K
Total Subscribers	41.5K	52.5K
Estimated Revenue Each Year	Rs 148,875.00	Rs 162,110.00
Total Revenue cumulative	Rs 215,595.00	Rs 377,705.00

FaceBook Analytics - ITN Sri Lanka

Category - Face Book	2020	2021
Total Likes cumulative	372,380	-
Total followers cumulative	288,129	565,705
Page Reach	49.1M	118.8M
Engagement	14.3M	28.2M
Total Revenue cumulative	Rs 215,595.00	Rs 377,705.00

FaceBook Analytics - Lakhanda

Category - Face Book	2020	2021
Total followers cumulative	30,000	119,633
Page Reach	5.1M	5.2M
Engagement	2.5M	4.1M

FaceBook Analytics – ITN Srilanka News

Category - Face Book	2020	2021
Total followers cumulative	41000	164,377
Page Reach	6.7M	6.5M
Engagement	10.4M	9.5M

FaceBook Analytics – Vasantham TV

Category - Face Book	2020	2021
Total followers cumulative	-	337,774
Page Reach	5.4M	7.6M
Engagement	4.0M	3.0M

FaceBook Analytics – Vasantham FM

Category - Face Book	2020	2021
Total followers cumulative	-	432,564
Page Reach	65.4M	83.5M
Engagement	22.6M	39.5M

● ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම්

කොවිඩ් තත්ත්වය දරුණු ලෙස පැතිර තිබිය දී ආරම්භ වූ 2021 වර්ෂය ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශයට දැඩි අභියෝගාත්මක වසර ආරම්භයක් විය. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශයේ සිටින නිලධාරීන් කොටස් 02 කට වෙන් කොට දෛනික සේවා මුර සකස් කරමින් ඉතා සීමිත පිරිසක් පමණක් සේවයට යොදවා ගැනීම අභියෝගාත්මක ක්‍රියාවලියක් විය.

දෛනිකව සීමිත පිරිසක් සේවයට කැඳවා සිංහල ප්‍රවෘත්ති විකාශන 10 ක් ද දෙමළ ප්‍රධාන ප්‍රවෘත්ති විකාශන 02 ක් ද පවත්වා ගෙන යාම දැඩි අසීරු කර්තව්‍යයක් වුවත් එම අභියෝගය සාර්ථකව වසර අවසානය වන තෙක් අඛණ්ඩව ගෙන යාමට හැකි වීම ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශය ලැබූ ජයග්‍රහණයකි.

එමෙන් ම අනෙකුත් තරඟකාරී නාලිකා අතර අවසන් මිනුම් දර්ශකවල දෝලනය වෙමින් තිබූ අයිටිඑන් ප්‍රවෘත්ති 03 වන ස්ථානයට පැමිණ වර්ෂය පුරා 03, 04 ස්ථානවල රැඳී සිටීමට හැකි වීම ද විශේෂත්වයකි.

ප්‍රවෘත්ති වල නිවැරදි බව තහවුරු කර ගනිමින් විශ්වසනීය ප්‍රවෘත්ති ප්‍රේක්ෂකයන්ට ලබා දීමට කටයුතු කිරීම සහ ජනතාවට අවශ්‍ය තොරතුරු නිසි පරිදි ඔවුන් වෙත ලබා දෙමින් අනෙකුත් තරඟකාරී නාලිකා වලට සමානව රජයේ නාලිකාවක් වුවත් තොරතුරු ලබා දීමට නිරන්තරයෙන් ම කටයුතු කළේය.

2020 වසරට වඩා ඉහළ ආදායමක් ලබාදීමට ද ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශයට හැකියාව ලැබුණි.

ප්‍රවෘත්ති විකාශය	ආදායම (රු.)
සතියේ දිනවල දහවල් පුවත් විකාශයේ	25,961,974.88
රාත්‍රී 6.30 ප්‍රධාන පුවත් විකාශයේ	127,516,894.36
රාත්‍රී 10.00 ප්‍රධාන පුවත් විකාශයේ	24,932,979.17
සති අන්තයේ ප්‍රධාන ප්‍රවෘත්ති විකාශන	32,275,852.33
පැයෙන් පැය ප්‍රවෘත්ති විකාශන	30,585,233.44
දිනපතා දහවල් 12.00 දෙමළ ප්‍රධාන ප්‍රවෘත්ති	26,392,991.94
දිනපතා රාත්‍රී 8.00 දෙමළ ප්‍රධාන ප්‍රවෘත්ති	4,106,916.62
මුළු ආදායම	**276,994,167.74**

ඊට අමතරව කාලීන සිදුවීම් වැඩසටහන් වලින් පහත සඳහන් පරිදි ආදායමක් ඉපැයීමට හැකියාව ලැබී ඇත.

වැඩසටහන	ආදායම (රු)
පත්තරමේන්තුව	13,863,112.25
හත්වෙනි පැය	1,888,164.00
තීරණය	693,170.00
තුලාව	137,961.00
මුළු ආදායම	**16,582,407.25**

ප්‍රාදේශීය වාර්තාකරුවන්ගේ ප්‍රවෘත්ති සඳහා ඉහළ ගුණාත්මකභාවයක් ලබා ගැනීම සඳහාත් ස්වාධීන රූපවාහිනිය වෙනුවෙන් ම කැපවීමට හැකියාව ඇති වාර්තාකරුවන් සඳහා සුවිශේෂී අවස්ථා ලබා දීම සඳහාත් විශේෂ වැඩපිළිවෙලක් සකස් කිරීමත් ඒ අනුව වාර්තාකරුවන් හා ආයතනය අතර නව ගිවිසුමක් අත්සන් තැබූ අතර එහිදී ස්වාධීන රූපවාහිනියට පමණක් ම ප්‍රවෘත්ති වාර්තා සපයන වාර්තාකරුවන්ට විශේෂත්වයක් ලබාදීමට කටයුතු කළේය.

කොරෝනා වසංගතය හමුවේ ආයතනයේ ආදායම් තත්ත්වය සැලකිල්ලට ගනිමින් පවතින යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණික උපකරණ වලින් ම ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් නිෂ්පාදන කටයුතු සිදු කිරීමට ද අප සේවක මණ්ඩලය වග බලා ගත්තේය.

නව වැඩසටහන් හා ඒවායේ ප්‍රගතිය

කාලීන සිදුවීම් අංශයෙන් ඉදිරිපත් කළ උදෑසන වැඩසටහන් 2020 ට සමගාමීව අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කළ අතර 2021 වසරේදී එම වැඩසටහන් සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාරය වර්ධනය කර ගැනීමට ද හැකි විය. එමෙන්ම ආයතන හා අමාත්‍යාංශ වලින්ද එම වැඩසටහන් වලට සහභාගී වීමට ඇති ඉල්ලුම ද වර්ධනය විය.

ප්‍රධාන ප්‍රවෘත්ති විකාශනයන්ට පහත සඳහන් නව විශේෂාංග කිහිපයක් එක් කළ අතර එම විශේෂාංග වලට ද ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලැබුණි.

- අමතක නැති මතක
- ප්ලැට්ෆෝම්
- සරු පොළොවක් කරා
- එක්ව නැගිටිමු
- යන්න හිතෙන තැනක්

රජයේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ප්‍රවෘත්ති විකාශය තුළත් කාලීන වැඩසටහන් තුළත් නව වේදිකාව සකස් කර තිබූ අතර රජයේ අඩුපාඩු සෘජුවට ම පෙන්වා දීමට හැකියාව ලැබුණි.

විපක්ෂයේ දේශපාලනඥයින්ට ද අවස්ථාව සලසා දෙමින් පක්ෂ විපක්ෂ මත එකම වේදිකාවකට ගෙන ඒම සඳහා බ්‍රහස්පතින්දා රාත්‍රී 10.25 තුළාව වැඩසටහන ආරම්භ කිරීමට හැකියාව ලැබීම ද අප අංශය ලැබූ ජයග්‍රහණයකි. එහිදී මෙතෙක් අඩුවක් පැවති දේශපාලන වේදිකාවක් සකස් කිරීමට ස්වාධීන රූපවාහිනියට හැකියාව ලැබුණි. එමෙන්ම පක්ෂ විපක්ෂ දෙපාර්ශවය ම ඊට සහභාගී කරවා ගැනීමට ද කටයුතු කෙරුණි. ඊට ද සාර්ථක ප්‍රතිචාර මේ වන විට ලැබෙමින් පවතී.

ලක්හඬ ගුවන් විදුලිය

ලක්හඬ ප්‍රවෘත්ති - සත්‍ය අපක්ෂපාතීව විශ්වාසයෙන්

ඒකපාර්ශවික වාර්තාකරණයෙන් මිදී උණුසුම් කාලීන ප්‍රවෘත්ති නිවැරදි ව අපක්ෂපාතී ව සමබර ව ශ්‍රාවකයන් වෙත ගෙන යාම ලක්හඬ ප්‍රවෘත්ති අංශයේ ප්‍රධාන කාර්යභාර්යයි. ශ්‍රාවක අකාර්ෂණය දිනාගත හැකි පරිදි ඉදිරිපත් කෙරේ. පෙර පැවති ඒකපාර්ශවික අසමබර පක්ෂපාතී ඇතැම් විට විකෘති කළ ප්‍රවෘත්ති වෙනුවට සත්‍ය අපක්ෂපාතී ව විශ්වාසයෙන් යන තේමාවෙන් ලක්හඬ නිවැරදි ප්‍රවෘත්ති වාර්තාකරණයකට යොමු විය.

ලක්හඬ ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ තුනකි. උදෑසන 6.30 දහවල් 12.00 සවස 6.30

පෙරවරු 8.00 සිට රාත්‍රී 9.00 දක්වා පැයෙන් පැය ප්‍රවෘත්ති ප්‍රකාශ 10කි.

ලක්හඬ ප්‍රවෘත්ති නව සැලසුම් ක්‍රියාත්මක කිරීම

- තරඟකාරී ගුවන් විදුලි නාලිකා අධ්‍යයනය කර නියමිත කාල රාමුවකට අනුව ප්‍රවෘත්ති ප්‍රකාශ තවත් විධිමත් කිරීම. ඒ අනුව සෙසු ගුවන් විදුලි නාලිකා පවා අභිබවායමින් විශේෂ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට හැකි විය. ඇතැම් විට අනෙකුත් පෞද්ගලික ගුවන් විදුලි නාලිකා පවා අභිබවායමින් විශේෂ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට ලක්හඬට හැකි විය.
- සිද්ධි වාචික ප්‍රවෘත්ති වලට මුල්තැන ලබා දෙමින් පක්ෂ විපක්ෂ මතවාද වලට ද සමබර අවස්ථාවක් සලසමින් අපක්ෂපාතී ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම. සෑම ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශයකටම විපක්ෂයේ ප්‍රවෘත්ති අනිවාර්ය කිරීම. ඒ යටතේ විපක්ෂයේ මාධ්‍ය හමු, විපක්ෂයේ ප්‍රවෘත්ති නිවේදන සහ ඔවුන්ගේ තීරණවලට ද ලක්හඬ ප්‍රවෘත්ති තුළින් අවස්ථාව සැලසීමට හැකිවිය.
- දිස්ත්‍රික්ක 25 හි රජයට සම්බන්ධ ප්‍රවෘත්ති, නිලධාරීන් සම්බන්ධ කරගනිමින් රටෙහි සිදුවන සියලු සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඇතුලත් ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම, දිස්ත්‍රික් ප්‍රවෘත්ති නිලධාරීන්ගෙන් හඬපට සහිතව සංවර්ධන ප්‍රවෘත්ති ලබා ගනිමින් අයි රිපෝටර් විශේෂාංගය ප්‍රචාරය කිරීම. ඒ අනුව 2020 ආරම්භයේ සිට සතියේ දින පහේම දහවල් 12 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශයට දිස්ත්‍රික්වල සංවර්ධන කටයුතු ඇතුළත් අයි රිපෝටර් විශේෂාංගය ප්‍රචාරය කිරීමට හැකිවිය.
- සෑම අමාත්‍යාංශයක්ම ආවරණය වන පරිදි ප්‍රවෘත්ති අංශ නිලධාරියෙකු යොදවා අමාත්‍යාංශයෙන් ජනතාවට සිදුවන කාර්ය භාර්යයන්, සේවා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීම. මීට පෙර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතනවල මග හැරුණු ප්‍රවෘත්ති මෙමගින් ලබා ගැනීමට හැකි විය.
- සෑම අමාත්‍යාංශයක්ම ආවාරණය වන පරිදි ප්‍රවෘත්ති අංශ නිලධාරියෙකු යොදවා අමාත්‍යාංශයෙන් ජනතාවට සිදුවන කාර්ය භාර්යයන්, සේවා සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව නිවැදි තොරතුරු ලබා ගැනීම.
- රාජ්‍ය ආයතනයකින් මහජනතාවට සේවා සැපයීමේ දී ජනතාව මුහුණපාන ගැටලු අවම කිරීම සහ වැළැක්වීමේ අරමුණින් නිවැරදිව සේවාවන් ඉටුකර ගැනීමට අවශ්‍ය තොරතුරු සහ දැනුම ලබාදීම වෙනුවෙන් සෑම සඳුදා දිනයකම මහජන දිනය ලෙස ප්‍රවෘත්ති විශේෂාංගයක් ප්‍රචාරය කෙරිණ.
- රට පුරා ඇති ස්වාභාවික පරිසර පද්ධති, සුන්දර ස්ථාන සහ සංචාරක ස්ථාන පිළිබඳව ජනතා දැනුවත් කිරීම මෙන්ම එම ස්ථාන ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මහජන පෙළඹවීමේ අරමුණින් සතියේ සෑම දිනකම හුස්ම නමින් පරිසර විශේෂාංගයක් ප්‍රචාරය කෙරිණ.
- රජයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව පසු විපරම් කිරීමේ ඇසි දිසි සෞභාග්‍යයේ පෙරමග ප්‍රවෘත්ති විශේෂාංගය සෑම සඳුදා දිනයකම ප්‍රචාරය කෙරිණ.

ලක්හඬ ප්‍රවෘත්ති ජයග්‍රහණ

1. 2021 ගුවන් විදුලි රාජ්‍ය සම්මාන උළෙලේදී ලක්හඬ ප්‍රවෘත්ති අංශය ප්‍රශස්ථ ප්‍රවෘත්ති නිවේදක රාජ්‍ය සම්මානය සඳහා නිර්දේශ වීම
2. 2021 ගුවන් විදුලි රාජ්‍ය සම්මාන උළෙලේදී ලක්හඬ ප්‍රවෘත්ති අංශය ප්‍රශස්ථ ගුවන් විදුලි ප්‍රවෘත්ති සංස්කරණය සඳහා කුසලතා ඇගයීමක් ලබා ගැනීම.

2021 වසරේ ලක්හඬ ප්‍රවෘත්ති ආදායම

2021 ජනවාරි මාසයේ සිට 2021 නොවැම්බර් මාසය දක්වා රු. මිලියන 2.2කට අධික ආදායමක් ලැබිණ.

වසන්තම් එෆ්එම්

වසන්තම් එෆ්එම් ගුවන් විදුලිය 2008 වර්ෂයේ අප්‍රේල් 21 වන දින ආරම්භ කරන ලදී. එදින පටන් වසන්තම් එෆ්එම් ප්‍රවෘත්ති විකාශයන්ද පියවරෙන් පියවර දියුණු කිරීමට කටයුතු කරන ලදී.

සත්‍ය හා අපක්ෂපාතී උණුසුම් කාලීන ප්‍රවෘත්ති හා විශේෂ ප්‍රවෘත්ති සමබරව ශ්‍රාවකයන් වෙත ගෙන යාම වසන්තම් එෆ්එම් ප්‍රවෘත්ති අංශයේ ප්‍රධාන කාර්යභාර්යයි. දිනකට ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ 03ක් හා පැයෙන් පැය ප්‍රවෘත්ති ප්‍රකාශ 10ක් විකාශය කරමින් දෙමළ කතාකරන ජනතාව වෙත විශ්වාසය තහවුරු කරන ලදී.

එමෙන්ම අනෙකුත් තරඟකාරී දෙමළ ගුවන් විදුලි නාලිකා 8 අතරින් 2021 වර්ෂයේ ප්‍රවෘත්ති විකාශයන් සඳහා අංක 2 හා 3 මිනුම් දර්ශකයේ රැඳී සිටීමට හැකියාව තිබුණි.

වසන්තම් එෆ්එම් ගුවන් විදුලි නාලිකාවේ ප්‍රවෘත්ති අංශය දසදෙනෙකුගෙන් යුත් සේවක එකමුතුවකින් හා අඩු මානව හා භෞතික සම්පත් වලින් ක්‍රියාත්මක වේ.

වසන්තම් එෆ්එම් ප්‍රවෘත්ති ජයග්‍රහණ

2021 ගුවන් විදුලි රාජ්‍ය සම්මාන උළෙලේදී වසන්තම් එෆ්එම් ප්‍රවෘත්ති අංශය පහත පරිදි සම්මාන වලින් හා නිර්දේශයන් පිදුම් ලැබූහ.

1. ප්‍රශස්ථ ප්‍රවෘත්ති සංස්කාරක රාජ්‍ය සම්මානය
2. ප්‍රශස්ථ ප්‍රවෘත්ති නිවේදිකා රාජ්‍ය සම්මානය
3. ප්‍රශස්ථ ප්‍රවෘත්ති නිවේදක රාජ්‍ය සම්මානය (නිර්දේශිත)

● ලක්හඬ ගුවන් විදුලිය

"ජාතික උරුමයේ නාලිකා සන්නාමය" තේමාව යටතේ 2021 වසරේ ලක්හඬ වැඩසටහන් ක්‍රියාත්මක විය. කොවිඩ් වසංගත තත්වය හමුවේ සංචරණ සීමා හා නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක කාල සීමාවක් තුල අනුග්‍රාහක ආදායම් පහත වැටීම සිදුවුවත් 2020 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 15 ක ආදායම් වැඩිවීමක් 2021 වසරේ වාර්තා විය. බාහිර ප්‍රවර්ධන හා බාහිර අනුග්‍රාහක වැඩසටහන් කොවිඩ් තත්ත්වය හමුවේ ක්‍රියාත්මක නොවුන පසුබිම මත මෙලෙස ආදායම් වර්ධනය කර ගැනීමට හැකිවීම විශේෂයෙන් දැක්විය හැකි ප්‍රගතියකි.

ඒ සඳහා අලෙවි අංශයේ දායකත්වය මෙන් ම වැඩසටහන් අංශය යටතේ අනුග්‍රාහක ධර්ම දේශනා මඟින් උපයාගත් ආදායම ද උපකාරී විය. ප්‍රධාන ගුවන් කාලයක් වන ප.ව. 16.00 - 18.00 ගුවන් කාලය තුල ශිල්පීය පදනම මත වැඩසටහන් ඉදිරිපත් කිරීමට වසරක ගිවිසුම් ගත කාලයකට බාහිර ශිල්පිනියක් බඳවා ගැනීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් අනුග්‍රාහකයන් සම්බන්ධීකරණයට දිරිමත් කිරීම මඟින් ද මෙලෙස ආදායම් තත්වය වර්ධනය කර ගැනීමට හැකි විය.

2021 වසරේ නව වැඩසටහන් කිහිපයක් අලුතින් හඳුන්වාදීමට හැකිවිය. පාසැල් දරු දැරියන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීමේ අවස්ථාව ලබා දෙමින් "ලක්හඬ තක්ෂිලාව" අධ්‍යාපන වැඩසටහන දිනපතා පෙ.ව. 05.00 සිට 06.00 දක්වා 2021 තුන්වන කාර්තුවේ සිට ක්‍රියාත්මක විය.

කොවිඩ් වසංගතය හමුවේ සෞඛ්‍යාරක්ෂිත බව විවිධ ආකාරයෙන් වලට ඇතිවන බලපෑම හා සමාජ ගැටළු සම්බන්ධයෙන් දිනපතා පෙරවරුවේ වෙඩිල්ල සංවාදාත්මක වැඩසටහනින් කාලය වෙන් කළ අතර ජනතාව දැනුවත් කිරීම උදෙසා අනෙකුත් ගුවන්කාල වලදී ද කෙටි පණිවිඩ ප්‍රචාරයට කටයුතු යොදන ලදී.

සතියේ දිනවල ප.ව. 16.00 - 18.00 ගුවන් කාලය තුළ දේශීය සුළු පරිමාණ නිෂ්පාදකයන් සඳහා විශේෂ පැකේජයක් හඳුන්වා දෙමින් අලෙවි ආදායම් වැඩි කර ගැනීමට හැකිවිය.

සිත නිවන බුදුබණ අනුග්‍රාහක ධර්ම දේශනා මාලාව රාත්‍රී 21.00 - 22.00 ගුවන් කාලය තුළ නැවත ක්‍රියාත්මක කිරීමෙන් ද ආදායම් උපයා ගැනීමට හැකිවිය.

ලක්හඬ 25 වන සංවත්සරය මෙම වසරේ නොවැම්බර් 15 දිනට යෙදී තිබූ අතර ඒ වෙනුවෙන් Colour of Love නමින් සංගීත ප්‍රසංගයක් ස්වාධීන රූපවාහිනිය ඔස්සේ විකාශය කරමින් ද එම වැඩසටහන ලක්හඬ YouTube හා Face Book මඟින් ප්‍රචාරය කිරීමෙන් ද ආදායම් උපයා ගැනීමට හැකිවිය. 2021 වසර ආරම්භයේ ලක්හඬ YouTube නාලිකාව සතු subscribers සංඛ්‍යාව 15,000ක් පමණ වූ අතර 2021 අවසන් වන විට එම සංඛ්‍යාව දෙගුණයක් දක්වා වර්ධනය කිරීමට හැකිවිය.

ඉදිරියේදී YouTube ඇතුළු සමාජ මාධ්‍ය ලක්හඬ සඳහා අදායම් උත්පාදනය කිරීමට යොමු කිරීමේ පදනම මෙම වසර තුළ ඉටුවිය.

බාහිර ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැකි තත්වයකදී ITN මනුෂ්‍යත්වයේ සත්කාරය සමඟ එක්ව විවිධ ආයතන හා සංවිධාන සහභාගී කරගනිමින් කොවිඩ් වසංගතයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමට ද ලක්හඬට හැකිවිය.

ලක්හඬ 25 වන සංවත්සරයට සමගාමීව පාසැල් දරුවන් කොවිඩ් වලින් ආරක්ෂා කිරීමේ දැනුවත් කිරීම් වැඩසටහන්, කෙටි පණිවිඩ, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය සමඟ ඉදිරිපත් කිරීම සිදු කෙරිණ.









● වසන්තම් TV

වසන්තම් TV නාලිකාව එයටම සුවිශේෂී වූ අනන්‍යතාවයකින් යුක්තව ප්‍රේක්ෂක සිත් දිනෙන් දින ආකර්ශනය කරමින් දිදුලන දමිළ ජාතික රූපවාහිනී නාලිකාවකි. මේ අනුව අපගේ නිර්මාණ කාලීන අවශ්‍යතාවන් සහ ජනතා අභිලාෂයන් හඳුනාගනිමින් නිර්මාණය කරන ලද්දන් වේ. ඒ සඳහා 2021 වසර සාක්ෂි දරයි.

ඒ අනුව, 2021 වසර වනාහී වැඩසටහන් නිර්මාණයේ දීත්, සැලසුම්කරණයේදීත් බොහෝ වෙනස්කම් සහිතව ගමන් කළ වර්ෂයකි. නව වැඩසටහන් සඳහා වන සැලසුම් කෙටුම්පත් ඉදිරිපත්කොට ඇතැම් වැඩසටහන්හි අන්තර්ගතයන් සහ තේමාවන්හි වෙනස්කම් සිදු කොට නාලිකාව සිය ගමන ඉදිරියට ගෙන ගියේය. 'එම් - ස්ටුඩියෝ' යන වැඩසටහන වෙනුවට 'ස්ටාර් වෝ' වැඩසටහන නව මුහුණුවරකින් ආරම්භ කරන ලදී. තාවකාලිකව අත්හිටුවන ලද 'ඒලාම් නාල්' වැඩසටහන යළි ආරම්භ කරන ලදී. එසේම, 'අයි' නම් බුද්ධිමය වැඩසටහන ද අලුතින් ආරම්භ කරන ලදී.

මෙම තත්ත්වය යටතේ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් දීප ව්‍යාප්තව ඇතිවූ රට වසා දැමීමේ තත්ත්වය මත සුපුරුදු වැඩසටහන් නිර්මාණය කිරීමට නොහැකි තත්ත්වයක් උදාවූ අතර වගකිවයුතු ජාතික නාලිකාවක් වශයෙන් උක්ත අර්බුදකාරී වාතාවරණය මධ්‍යයේ වුවද ජනතාව වෙත සේවය ලබාදීමේ ප්‍රමුඛ යුතුකමක්ද විය. එබැවින්, පරිපාලනමය වශයෙන් ගන්නා ලද තීන්දු තීරණයන්ට අනුගතව වසන්තම් රූපවාහිනිය විශේෂ වැඩසටහන් පෙළගැස්මක් යටතේ මාස තුනක් පමණ ගමන් කළේය.

පාසැල් දූ දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාකාරකම් ඇණහිට තිබීම සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට විද්‍යා වසන්තම් යන නමින් රූපවාහිනී අධ්‍යාපන වැඩසටහනක් විකාශය කරන ලදී. මේ අනුව, එකී වැඩසටහන සතියේ දිනයන්හි දී විකාශය කරන ලදී. එසේම, කොවිඩ් වසංගතය පිළිබඳ දැනුම්වත්භාවය ජනතාව තුළ ඇති කිරීම සඳහා විනාඩි 1 සිට 2 දක්වා කාලයක දැනුවත් කිරීමෙහි trailer නිෂ්පාදනය කර ඉදිරිපත් කරන ලදී. විශේෂයෙන්, රටෙහි එවකට පැවති තත්ත්වය සම්බන්ධයෙන් ජනතාවට අවබෝධයක් ලබාදීමේ විශේෂ සම්මුඛ සාකච්ඡා සහ සාකච්ඡාමය වැඩසටහන් යනාදිය ද ජනතාව වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම කාල වකවානුවේ දී එංගේයුම්, එප්පෝදුම්, තොඩුවානම්, වාංග පලහලාම්, සුටිරි වරුම් භූමි, ලේඩීස් ස්පෙෂල් වැනි බොහෝ වැඩසටහන් එලෙස අත්හිටුවා තිබුණි. කෙසේ නමුත්, තලෙයි වාසල්, ආරෝක්කියම්, හලෝ වසන්තම්, මියුසික් එක්ස්ප්‍රස්, සන්ඩේ කැෆේ, සුයාදීන සෙයිතිප් පාර්වෛ, හොලිවුඩ්ස් බිට්ස්, තුවානම්, ආඩුකලම්, මක්කල් සේවෛයි, කන්මණි, කදෙයි තිරෙයික් කදෙයි වසනම් ඉයක්කම්, නම්ම හිට්ස්, සිහරම් තොට්ට සිනිමා, ඔස්කාර්, රෙන්ඩින්ග්ල විඩුංග, තඩම් වැනි වැඩසටහන් විකාශය වෙමින් පැවතිණි. එසේම, සිරි මනමේ, සුපර් සීන්, තලෙයි වාසල් වැඩසටහනෙහි විකාශය වූ යාවරුම් කේලීර් කොටස සමඟ චිත්‍රපට ගීත, චිත්‍රපට යනාදී වශයෙන් වැඩසටහන් ලැයිස්තුව සකස් වී තිබුණි.

එසේම, මෙම අර්බුදකාරී තත්ත්වය තුළ අප නව වැඩසටහන් නිර්මාණය කිරීම කෙරෙහිද අවධානය යොමු කළෙමු. ඒ හරහා ස්ටාර් වෝර්, ඒලාම් නාල්, අයි වැනි නව වැඩසටහන් ආරම්භ කොට විකාශය කළෙමු. ඊට අතිරේකව පැවති තත්ත්වය සාමාන්‍ය අතට හැරීමෙන් පසු අතරමැද නවතා තිබූ බොහෝ වැඩසටහන් යළි ආරම්භ කරන ලද අතර ඒවාට අතිරේකව බොහෝ නව වැඩසටහන් ද, මුල් කාලයේදී අතරමැද නවතා දමන ලද බොහෝ වැඩසටහන් සඳහා යළි නව ජීවයක් ලබා දී චිත්‍රපට සහ රූපවාහිනී ටෙලිනාට්‍ය යනාදී වශයෙන් ජනප්‍රිය අංග සමඟ ඉදිරියට පියමන් තබමින් සිටී.

ප්‍රවෘත්ති අංශය සම්බන්ධයෙන් ගත්කල පැයෙන් පැයට පුවත් ජනතාව වෙත ඉදිරිපත් කරන ලද අතර කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එය අතරමඟ නවතා තිබුණ ද පැයෙන් පැය පුවත් විකාශය යළි ආරම්භ කොට ජනතාව වෙත ප්‍රවෘත්ති වාර්තා කිරීමේ කටයුතු ද ඉතාමත් සාර්ථක අන්දමින් ඉදිරියට ගෙන යන ලදී.

එසේම, නව වසරේ දී ආරම්භ කරන්නා වූ බොහෝ වැඩසටහන්හි ආරම්භක කටයුතු මේ වන විට දියත් කරමින් සිටී. මේ අතරවාරයේදී විශේෂ දිනයන් සහ උත්සව කාලයන්ට අදාළව අලුත් චිත්‍රපට අවම මිලකට මිලදීගත් අතර බොහෝ ක්ෂේත්‍ර වැඩසටහන් සහ බාහිර පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් යුත් වැඩසටහන් වලින් වැළකී 2021 වසරේ අවසානය දක්වා වාතාවරණයට ගැලපෙන න්‍යාය පත්‍රයක් සමඟ ගමන් කර ඇති බව සඳහන් කළ යුතුය.





● වසන්තම් එෆ් එම්

වසන්තම් එෆ්එම් ගුවන් විදුලියට 2021 වර්ෂයේ සාර්ථකව වැඩසටහන් ඉදිරිපත් කිරීමට හැකිවිය.

මහා ශිව රාත්‍රිය

මෙවර මහා ශිවරාත්‍රී උළෙල ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ශිව දේවාලයන්හි සිට සජීවීව විකාශය කිරීම සඳහා සැලසුම් කර තිබුණු අතර රටේ ව්‍යාප්ත වී පවතින කොරෝනා වසංගතය හේතුවෙන් පිටස්තර දිස්ත්‍රික්කයන්හි සිට පැමිණෙන බැතිමතුන්ට දේවාල තුළට ප්‍රවේශ වීමට අවසර ලබා නොදීම හේතුවෙන් ප්‍රාදේශීය වාර්තාකරුවන් දේවාලයන් වෙත යවා එහි කටයුතු දුරකථන මාර්ගයෙන් සජීවී ලෙස විකාශය කිරීමට කටයුතු කර ඇත.

ජාත්‍යන්තර කාන්තා දිනය

ජාත්‍යන්තර කාන්තා දිනයේ දී කාන්තාවන් වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කරන ලදී. එදින කාන්තාවන් විසින් ම වැඩසටහන් ඉදිරිපත් කරන ලදී. පැයකට වරක් ශ්‍රී ලංකාවේ වාර්තා පිහිටවූ කාන්තාවන්ගේ ජීවිත කතා පටිගත කොට විකාශය කරන ලදී. එසේම මේ වන විට විවිධ ක්ෂේත්‍රයන් අළලා වාර්තා පිහිටුවමින් සිටින්නාවූ කාන්තාවන්ගේ අදහස් ද පැයකට වරක් විකාශය කිරීමට කටයුතු කර ඇත.

වසන්තම් ගුවන් විදුලියෙහි 13 වන උපන්දින සැමරුම පෙරදැරි කොට සංගීතමය වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කරන ලද අතර ඉන්දියාවේ සිට ගායකයින් කැඳවීම කෙරෙහි කොරෝනා වසංගත තත්ත්වය බාධා කළ බැවින් සැලසුම් කරන ලද සංගීත වැඩසටහන නතර කිරීමට සිදුවිය.

අලුත් අවුරුදු සැමරුම

රටේ ව්‍යාප්ත වී පැවැති කොවිඩ් තත්ත්වය හේතුවෙන් අලුත් අවුරුද්ද වෙනුවෙන් පැවැත්වීමට සැලසුම් කර තිබූ සියලු වැඩසටහන් නවතා ගුවන් විදුලියෙහි විශේෂ වැඩසටහන් පමණක් සංවිධානය කරන ලදී.

VPL ක්‍රිකට් තරඟාවලිය

වසන්තම් ගුවන් විදුලි නාලිකාවේ සංවත්සරය ප්‍රධානකොට සංවිධානය කරනු ලැබූ වසන්තම් ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය මෙවර කිලිනොච්චියේ දී පවත්වන ලදී.

රට තුළ කොරෝනා තත්ත්වය ව්‍යාප්ත වී තිබීම හේතුවෙන් ප්‍රේක්ෂක ජනතාවට ක්‍රීඩා පිටියට රැස්වීමට අවසර ලබා නොදුන් අතර තරගාවලියට සහභාගීවන ක්‍රීඩකයින්ට පමණක් අවසර ලබා දී තරගාවලිය පවත්වන ලදී.

මෙම තරගාවලියෙන් ජයග්‍රහණය ලැබූ කණ්ඩායම සඳහා රුපියල් 100,000 ක මුදල් ත්‍යාගයක් ද, අනුශූරතාවය ලැබූ කණ්ඩායම සඳහා රුපියල් 50,000 ක මුදල් ත්‍යාගයක් ද පිරිනමන ලදී.



මහා වීර සංගිලියන් - ගුවන් විදුලි සංගීතමය නාට්‍ය

මෙම වසරේ ගුවන් විදුලි සංගීතමය නාට්‍ය වශයෙන් යාපනය ප්‍රදේශය පාලනය කළ ද්‍රවිඩ රජ කෙනකු වූ සංගිලියන් රජතුමාගේ ජීවිත කතාව අළලා නිර්මාණය ගොඩනගන ලදී. ආයතනයේ සේවකයන් යොදවා ගනිමින් සම්පූර්ණ නාට්‍ය සඳහා ම අවශ්‍ය හඬ කවා පටිගත කළ බැවින් හඬ කැවීම් සඳහා බාහිර පුද්ගලයන් නොකැඳවන ලදී. එබැවින්, කිසිදු වියදමකින් තොරව මෙම නාට්‍ය නිර්මාණය කිරීමට හැකිවූ අතර එය කථාංග 25 කින් සමන්විත විය.

රාමසාන් උළෙල

රාමසාන් උත්සව කාලයේ දී ආයතනයේ සේවය කළ බොහෝ පුද්ගලයින්ට කොවිඩ් රෝගය වැළඳී තිබීම හේතුවෙන් බාහිර පුද්ගලයන් ආයතනයට නොකැඳවා දුරකථනය ඔස්සේ ඔවුන්ව සෘජුව සම්බන්ධ කරගනිමින් ඒවා පටිගත කොට ගුවන් විදුලියෙහි විකාශය කළෙමු. මේ සඳහා කිසිදු වියදමක් දැරීමට සිදු නොවූ හෙයින් ඒ සඳහා වෙන් කරන ලද මුදල භාවිතා නොකරන ලදී.

ලෝක ළමා දිනය

වසන්තම් රූපවාහිනිය සමඟ එක්ව ළමා දිනයේ දී ළමා නිවාසයකට ගොස් එහි සිටින ළමුන් සමඟ වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර රට තුළ ව්‍යාප්ත වී පැවති කොරෝනා තත්ත්වය හේතුවෙන් එය සිදු කිරීමට නොහැකි විය. එබැවින් දක්ෂ ළමුන් දුරකථනයෙන් සම්බන්ධ කරගනිමින් ඔවුන්ගේ හඬ පටිගත කොට ඒවා ළමා දිනයේ දී විකාශය කිරීමට කටයුතු කර ඇත.

දීපාවලී උළෙල

දීපාවලී දිනයේ දී ජනතාව සමඟ එක්ව සංගීත වැඩසටහනක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර කොරෝනා වසංගතය හේතුවෙන් එම සංගීත වැඩසටහන බාහිර ස්ථානයක නොපවත්වා එය ආයතනය තුළ පවත්වා සජීවීව විකාශය කිරීමට කටයුතු කර ඇත.



නත්තල් උළෙල

නත්තල් උළෙල මූලික කරගනිමින් මෙවර දේවස්ථානයක විශේෂ දේව මෙහෙයක් පටිගත කොට නත්තල් දිනයේ දී සජීවීව වසන්තම් එෆ් එම් ගුවන් විදුලිය මඟින් විකාශය කළ අතර සමාජ වෙබ් අඩවියට ද එක් කිරීමට කටයුතු කර ඇත.

නිරසාරත්වය

ආයතයනයේ සෑම අංශයකම කාර්යක්ෂම පරිපාලනය ආයතනයේ ඵලදායීත්වයටත් කීර්තියටත් ඉතා වැදගත් වේ. එමෙන්ම සේවක, සේවාදායක, සමාජීය සහ පාරිසරික කරුණු වල ඵලදායී කළමණාකරනය ආයතනයේ ක්‍රියාකාරකම් වලට අත්‍යාවශ්‍ය සාධකයක් බැවින් ආයතයනයේ සියළු අංශ අවබෝධාත්මකව ක්‍රියාකරමින් සිටී.

වාර්ෂික බඳවා ගැනීමේ සංෂිප්තය 2021

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි	01
තාක්ෂණික නිළධාරී	01

අනුමත සේවක සංඛ්‍යාව

තනතුර	ITN/ LAKHANDA/ VASANTHAM TV/VASANTHAM FM
ජ්‍යෙෂ්ඨ මට්ටම	80
තෘතීය මට්ටම	150
ද්විතීය මට්ටම	503
ප්‍රාථමික මට්ටම	190
එකතුව	923

2021 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව (ස්ථිර / කොන්ත්‍රාත්)

තනතුර	ITN	LAKHANDA	VTV	VFM
ජ්‍යෙෂ්ඨ මට්ටම	42	4	1	1
තෘතීය මට්ටම	112	8	4	0
ද්විතීය මට්ටම	301	42	14	18
ප්‍රාථමික මට්ටම	159	4	0	0
වෙනත් (අලෙවි විධායක)	19	3	6	2
මුළු එකතුව	740			

2021 දෙසැ 31 දිනට සේවක සම්මිශ්‍රණය

වර්ෂ ගණන	ස්ථිර	කොන්ත්‍රාත්
01 අඩු	15	64
01 - 05	63	37
05 - 10	174	11
10 - 15	110	6
15 - 20	76	7
20 - 25	76	0
25 - 30	68	0
30 ට වැඩි	33	0
එකතුව	615	125

2021 දෙසැම්බර් 31 දිනට සේවා විශ්ලේෂණය (ස්ථිර / කොන්ත්‍රාත්)



2021 දෙසැ 31 දිනට වයස් සීමාව අනුව සේවක සම්මිශ්‍රණය (ස්ථිර / කොන්ත්‍රාත්)

අවුරුදු	18-30	31-40	41-50	50<
පුරුෂ				
කළමණාකරණ	0	0	3	8
විධායක	0	1	17	23
තාක්ෂණික	30	67	26	29
රූපවාහිනී/ ගුවන් විදුලි නිෂ්පාදන	37	101	60	27
ලිපිකාර සහ ආශ්‍රිත	6	41	48	43
එකතුව	**73**	**210**	**154**	**130**
ස්ත්‍රී				
කළමණාකරණ	0	0	2	1
විධායක	0	2	6	4
තාක්ෂණික	2	2	0	4
රූපවාහිනී/ ගුවන් විදුලි නිෂ්පාදන	17	34	27	15
ලිපිකාර සහ ආශ්‍රිත	3	23	18	13
එකතුව	**22**	**61**	**53**	**37**

පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවූ නිලධාරීන්ගේ සාරාංශය (2021)

පුහුණු ඉසව්ව	පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව	සහභාගි වූ සේවක සංඛ්‍යාව
දේශීය		
මානව සම්පත් සංවර්ධනය	2	126
ඉංජිනේරු	3	26
මූල්‍ය	2	2
තොරතුරු තාක්ෂණ	1	15
එකතුව	**8**	**169**

2020 මාර්තු මස සිට Covid-19 තත්ත්වය මත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

● සේවක සබඳතා

ආයතනික නිර්ණායක

කොටස්කරුවන් විසින් පත් කරන ලද ජාතික විගණන කාර්යාලයේ, විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශන විගණනයට ලක් කරනු ලබන අතර විගණකවරුන්ගේ ප්‍රකාශිත මතය අදාළ විගණක හා වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ වෙනත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වේ. විනිවිදභාවය සහ වගකීම සනාථ වන අයුරින් සත්‍ය, නිරවද්‍ය සහ සැබෑ මූල්‍ය තොරතුරු වාර්තා කරනු ලැබ ඇත. ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශිත රීති වලට හා රෙගුලාසි වලට අනුකූල වේ.

ගණුදෙනුකාර සන්නිවේදනය

අපේ ප්‍රධාන ගණුදෙනුකරුවන් වන ප්‍රචාරක නියෝජිත ආයතන සැබැවින්ම අපේ ව්‍යාපාරයේ කොඳු නාරටිය වන අතර ඔවුන් නිතරම ප්‍රශස්ථ දෙය ඉල්ලා සිටින බැවින් ඔවුන්ගේ අපේක්ෂාවන් ද ඉක්මවා යන පරිදි අපේ නිෂ්පාදනයන් ලබා දීමට අපට හැකි වී තිබේ. එය ස්වභාවයෙන් ම පදනම් වනුයේ විශ්වාසය මතයි. ඒ ඒ ගණුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ද හඳුනා ගැනීම සඳහා විස්තීරණ ගණුදෙනුකාර තක්සේරුවක් සහ ගණුදෙනුකාර ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මකව පවතී. අප ලබා දෙන නිෂ්පාදන වලින් සහ සේවා වලින් ගණුදෙනුකාර අපේක්ෂාවන් මනාව ප්‍රදර්ශනය වන අතර අපේ ප්‍රමිතීන්ට හා ආචාර ධර්ම වලට යටත් ව ගණුදෙනුකාර ඉල්ලීම් ඉටු කිරීමෙහි ලා අවශ්‍ය පරිදි වෙනස් වීමට ද අපි ක්‍රියා කරමු.

ඊට අමතරව, අපේ සියළු උත්සාහයන් වල සාර්ථකත්වය විශ්ලේෂණය කිරීම සඳහා දිවයිනේ පිළිගත් ආයතන දෙකක් විසින් සිය විකාශ කාල අනෙකුත් නාලිකා සමඟ දත්ත විමර්ශනය කරන අතර එම දත්ත තුලින් විවිධ වැඩසටහන් වල ජනප්‍රියතා සීමා හඳුනා ගත හැක. මෙය අපේ ගණුදෙනුකරුවන්ට ඉතා වටිනා මිණුම් දණ්ඩක් වන අතර අපට ද අවශ්‍යය වෙනස්කම් කිරීම සඳහා උපකාරී වේ.

සේවක සන්නිවේදනය

නිර්මාණශීලීත්වය මත රැඳුන ව්‍යාපාරයක, සේවකයින් හා කළමනාකරණය අතර විශ්වාසය, අභියෝග, ව්‍යාපාර උපාය මාර්ග සහ සමාගමේ මූල්‍ය තත්ත්වය රඳා පවතින්නේ ද්වි මාර්ගික සන්නිවේදනය පිළිබඳව සියලු සේවකයින්ගේ අවබෝධය මත නොසිතූ අවස්ථාවන් වල දී නොසිතූ කෙනෙකුගෙන් මතුවුනු නිර්මාණශීලීත්වයන් අති සාර්ථක වූ අවස්ථා බොහෝ වූ අතර, දායකත්වය මත පදනම් වූ කාර්ය සාධන දීමනාව මීට හොඳ උත්තේජනයක් ලබා දී ඇත.

සේවක සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය

සේවක සුබසිද්ධිය අපේ සාර්ථකත්වය පිටුපස ඇති මූලික සාධකයයි. නිෂ්පාදන ක්‍රියාවලියේ දී කඳු, හෙල්, සහ කැලෑ පිරමින්, නොයෙකුත් උපකරණ ප්‍රවාහනය කරමින් ඉතා දුෂ්කර සේවයක යෙදී සිටින සේවකයින්ගේ කායික මෙන්ම මානසික නිරෝගීතාව කෙරෙහි තිරසාර විශ්වාසය තබා සිටින අප, සේවා ස්ථානය තුල සහ ඉන් පිටත දී ඔවුන්ගේ ආරක්ෂාවත් ආයතනයේ අඛණ්ඩ ක්‍රියාන්විතයන් ගැනත් අවධානයෙන් සිටින අතර වඩා යහපත් ජීවන තත්ත්වයක් භුක්ති විඳීමට ඔවුන්ට නිතර ම උපකාර කරමු. සෞඛ්‍ය ප්‍රතිලාභ උදෙසා ආයෝජනය කර ඇති අප, සිය සෞඛ්‍ය තක්සේරු කිරීම, පවත්වාගෙන යාම සහ වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කර ඇත.

සේවක ප්‍රතිලාභ හා සුබසාධන කටයුතු

- රු. 5,000/-ක කාර්ය සාධන දිරි දීමනාවක් ගෙවීම.
- පැමිණීමේ දිරි දීමනාව වශයෙන් මාසිකව රු. 5,500/- ක් ගෙවීම.
- ස්ථිර හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයට රු. 7,000/- වටිනා තිළිණ පත් ද දින වැටුප් ලබන අය සඳහා රු. 4,000/- වටිනා තිළිණ පත් ද 2021 නව වසර වෙනුවෙන් ලබා දීම.
- ස්ථිර හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයට රු. 9,000/- වටිනා තිළිණ පත් ද දින වැටුප් ලබන අය සඳහා රු. 5,000/- වටිනා තිළිණ පත් ද 2021 වසර අවසානය වෙනුවෙන් ලබා දීම.
- ස්ථිර, කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල හා සහන මණ්ඩලය සඳහා පුද්ගලික හදිසි රක්ෂණ ආවරණයක් ලබා දීම.
- රුපියල් මිලියන 37 ක මුදලක් ආයතනය විසින් දරමින් සියළුම ස්ථිර හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පවුල් වලට රු. 150,000/- ක වටිනාකමකට රක්ෂණ ආවරණයක් ලබා දීම.
- දෙහිවල, කොටුව, පිළියන්දල, සහ කඩුවෙල යන නගර වල සිට කාර්යාලයීය දෛනික ප්‍රවාහන සේවාවක් විධිමත්ව ක්‍රියාත්මක කිරීම.
- සේවා මුර රාජකාරි ඉටු කරන කාර්ය මණ්ඩලයට රු. 3,000/- ක ප්‍රවාහන දීමනාවක් ගෙවීම.
- වත්මන් වැටුපට අනුකූලවල ආපදා ණය නිකුත් කිරීම.
- විධායක කාර්ය මණ්ඩලයට රු. මිලියන 1.2 දක්වා වාහන ණය ප්‍රදානය කිරීම.
- ආයතනයේ අනෙකුත් සේවකයින් සඳහා යතුරුපැදි සහ ත්‍රිරෝද රථ මිළදී ගැනීම සඳහා රු. 150,000/- උපරිමයකට යටත්ව ණය පහසුකම් ලබාදීම.

● ආයතනික පරිපාලන ප්‍රතිපත්ති

කොටස් හිමිකරුවන්ගේ විශ්වාසය රඳවාගනු පිණිස යහපාලනයේ විශිෂ්ඨ තලයන් අත් කර ගැනීම උදෙසා ස්වාධීන රූපවාහිනී සේවය කැපවීමෙන් ක්‍රියා කරන අතර, එයට සුදුසු ප්‍රතිපත්ති රාමුවක් සම්පාදනය කිරීමෙහි ලා අධ්‍යක්ෂක මණ්ඩලය ද සාර්ථක අකාරයෙන් මගපෙන්වීම් ලබා දෙයි.

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම හා විනිවිදභාවය තහවුරු කරන අන්දමින් සිය පරිපාලනය පවත්වා ගෙන යෑමට අවශ්‍ය කටයුතු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික වගකීම වන්නේ ආයතයනයේ උපරිම යහපත සඳහා කටයුතු කිරීමටත් කොටස් හිමිකරුවන් සඳහා දිගු කාලීන වටිනාකම් සහ ප්‍රතිලාභ අත් කර දීමය. ආයතයනයේ සමස්ත කාර්ය සාධන අරමුණු, ප්‍රධාන ආයෝජනයන්, වාර්ෂික අයවැය, මූල්‍ය කාර්ය සාධන සමාලෝචනයන්, අවදානම් කළමණාකරනය සහ ආයතනික පාලන ක්‍රියා පටිපාටි සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

සිය වගකීම කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සහ කළමණාකාරීත්වය පිළිබඳ ස්වාධීන අධීක්ෂනයක් ඇති කිරීම සහතික කිරීම සඳහා විගණන හා කළමණාකරන කමිටුවක් සහ ප්‍රතිසම්පාදන කමිටු ඇතුළු අනු කමිටු කිහිපයක් පිහිටුවා තිබේ.

2021 වසරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පහත ආකාරයෙන් සැදුම් ලැබ තිබුනි.

සුදත් රෝහණ මහතා
සභාපති
(2021.12.29 දක්වා)

ආචාර්ය එච් එස් හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ
(2021.12.30 දක්වා)

මහාචාර්ය එම් කේ සී රාජපක්ෂ
අධ්‍යක්ෂ

ආචාර්ය අමිල ඉෂාන් කන්කානම්ගේ
අධ්‍යක්ෂ
(2021.12.28 දක්වා)

එම් ෆයිනාස් මහතා
අධ්‍යක්ෂ

සංජීවනී වීරසේකර මහත්මිය
අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත

නීතීඥ ටී ඒ යජිෂ් තෙන්නකෝන් මහතා
අධ්‍යක්ෂ
(2021.01.27 දින සිට)

අධ්‍යක්ෂ මණ්ඩලයේ සලකා බැලීම සහ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට නිදහස තිබේ. එක් එක් අධ්‍යක්ෂවරයාගේ දායකත්වය ආයතනයට උපාය මාර්ගික සබඳතා ඇති කර ගැනීම සහ කළමනාකරණයට මග පෙන්වීම සහ අදහස් හුවමාරු කර ගැනීම වැනි විවිධ ආකාර වලින් යුක්ත වේ.

රැස්වීමේ වර්ගය	රැස්වීම් වාර	පැවැත් වූ වාර ගණන
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	මසකට වරක්	13
විගණන හා කළමනාකරණ කමිටුව	ත්‍රෛමාසිකව	04
ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව	අවශ්‍ය පරිදි	08
සුළු ක්‍රොන්තාත් සඳහා වන ප්‍රසම්පාදන කමිටුව	දෙසතියකට වරක්	11

කළමණාකාරීත්වය විධිමත් පදනමක් මත ප්‍රමාණවත් කළමණාකරණ සහ මෙහෙයුම් වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයට සපයයි. රැස්වීමට පෙර කරුණු පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමටත් ඒ අනුව අදාල කාරණය සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කිරීමටත් අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව ලැබෙන පරිදි අවශ්‍ය තොරතුරු රැස්වීම් වලට සතියකට පෙර ඔවුන්ට ඉදිරිපත් කරනු ලැබේ. ආයතනයේ මූල්‍ය කාර්ය සාධනය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයට ඇති විය හැකි ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා ප්‍රධාන විධායක නිලධාරි, සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් ද රැස්වීම් අවස්ථා වලදී රැඳී සිටී.

රැස්වීම් න්‍යාය පත්‍රය සකස් කිරීමේදී සමාගමේ ලේකම්වරයා සභාපතිවරයාට සහය වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තොරතුරු මනාව සැපයෙන බව තහවුරුවන පරිදි කාර්ය සටහන් අධීක්ෂණය සැකසීම සහ සහභාගිත්වයද සිදු කරයි. ව්‍යවස්ථා පත්‍රයට හා නීති රීති රෙගුලාසිවලට අනුකූලවීම සම්බන්ධයෙන් ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. යහපත් ආයතනික පාලනය සහ පරිචය ක්‍රියාත්මක කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීමට ආයතනයේ කළමණාකාරීත්වය කැපවී සිටී.

විගණන හා කළමණාකරන කමිටුව

විධායක නොවන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකුගෙන් විගණන හා කළමණාකරන කමිටුව සමන්විත වන අතර එම කමිටුවේ මුලසුන භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂකවරයා දරයි.

එමෙන්ම ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ නියෝජිතයෙකු හා රජයේ විගණකවරු නිරීක්ෂක ලෙසද, ප්‍රධාන විධායක නිළධාරි, සාමාන්‍යාධිකාරි, මුදල්, පාලන හා අලෙවි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්, ස්වාධීන රූපවාහිනී සේවය හා ලක්හඬ ගුවන් විදුලියේ ගණකාධිකාරීන් හා ප්‍රධාන අභ්‍යන්තර විගණක ආදීන් ද මෙම කමිටු රැස්වීමට සහභාගී වේ.

අභ්‍යන්තර විගණනය

ආයතනයේ අභ්‍යන්තර විගණනය සිදු කරනු ලබන්නේ අභ්‍යන්තර විගණන අංශය විසිනි. වාර්ෂික විගණන සැලැස්මකට අනුකූලව සිදුකරනු ලබන විගණන ක්‍රියාවලිය, විගණන වැඩසටහනට අනුකූලව සිදුකරනු ලබන විගණන ක්‍රියාවලිය, විගණන හා කළමණාකරන කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. සුදුසු තීරණ ගනු පිණිස මතුවන අදාළ සියලුම තොරතුරු හා විගණන කරුණු සභාපතිවරයාට ඉදිරිපත් කරනු ලැබේ.

සොයා බැලිය යුතු ක්ෂේත්‍ර කවරේ ද යන්න පිළිබඳ මාර්ගෝපදේශ, විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණනයට ලබාදෙනු ලැබේ. ඒ වාර්තා පදනම් කරගෙන පවත්නා පද්ධති හා ක්‍රියාපටිපාටීන් කෙසේ වැඩිදියුණු කළ හැකි ද යන්න තක්සේරු කිරීම සඳහා කමිටුව රැස්වන අතර අදාළ රැස්වීම පිළිබඳ වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

අභ්‍යන්තර විගණනයෙහි අරමුණ වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංස්ථාමය පරිපාලන වගකීම හා සමාගම ඇතුලත ඵලදායි හා කාර්යක්ෂම ව්‍යාපාර ක්‍රියාදාමයන් නිසි පරිදි ඉටු කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයට සහය දැක්වීමයි.

ප්‍රසම්පාදන කමිටු

භාණ්ඩ සේවා සහ වැඩ ප්‍රසම්පාදනය කරගැනීම පිළිබඳව ජාතික ප්‍රසම්පාදන ආයතනය විසින් හඳුන්වා දී ඇති රජයේ මිලදී ගැනීමේ පටිපාටිය ස්වාධීන රූපවාහිනී සේවය විසින් ද අනුගමනය කෙරේ. මෙමඟින් තරඟකාරීත්වය මත මුදලට ඉහළම අගයක් ලබා ගැනීමට ස්වාධීන රූපවාහිනී සේවයට හැකි වන අතර පාරදෘශ්‍යතාවය ද මිලදී ගැනීමේ ක්‍රියාවලියේ ඒකමිතිය ද පවත්වා ගත හැකි වේ. ස්වාධීන රූපවාහිනී සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවට රුපියල් මිලියන 100 ක් දක්වා ප්‍රසම්පාදනය කර ගැනීමේ බලය පැවරී ඇති අතර මෙම කමිටුව කොටස් දෙකකට වර්ග කර ඇත.

ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුව පත්කරනු ලබන්නේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර සමාගමේ සභාපතිවරයා, සාමාන්‍යාධිකාරිවරයා සහ අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් වේ. රුපියල් මිලියන 02 කට වඩා වැඩි වටිනාකමක් ඇති භාණ්ඩ, සේවා, වැඩ මෙම කමිටුව හරහා සිදු කරනු ලැබේ.

සුළු ප්‍රසම්පාදන සඳහා වන ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කරන්නේ සාමාන්‍යාධිකාරිවරයා වන අතර රුපියල් මිලියන 02 කට වඩා අඩු වටිනාකමෙන් යුතු ප්‍රසම්පාදන සිදු කරනු ලබන්නේ මෙම කමිටුව හරහා ය.

මෙම පහළ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් දෙසතියකට වරක් පැවැත්වේ.

සමාගම් ලේකම්වරයා

අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාපටිපාටිය අනුගමනය කරන බවටත් ඵලදායී ලෙස තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු, විස්තර හා ලේඛන රැස්වීම් වල දී අධ්‍යක්ෂ මණ්ඩලයට සපයන බවටත් සහතික වීමේ මූලික කාර්ය භාරයන් සමාගම් ලේකම්වරයා ඉටු කරයි.

● සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ මෙම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ද සමග වන සමාගම් වාර්තාව අධ්‍යක්ෂකවරුන් ඉදිරිපත් කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

අදාල වසරෙහි සමාගමේ මූලිකතම ක්‍රියාකාරකම වූයේ රූපවාහිනී නාලිකා දෙකක් හා ගුවන් විදුලි නාලිකා දෙකක් ඔස්සේ ප්‍රවෘත්ති, සංගීතය, චිත්‍රපට, නාට්‍ය, අධ්‍යාපන වැඩසටහන් හා වත්මන් සංසිද්ධීන් සමග පුළුල් දැනුම හා විනෝදායන ක්ෂේත්‍රයකට සේවා සැපයීමය.

සමාලෝචනයට ලක්ව ඇති මූල්‍ය වසරෙහි උක්ත ප්‍රධාන ක්‍රියාකාරකම් වල ස්වභාවයෙහි සුවිශේෂී වෙනස් වීම් කිසිවක් නොතිබුනි.

එක් එක් අංශ විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවල අදාල වසරෙහි මෙම ක්‍රියාන්විත වලින් ලද ප්‍රතිඵල මෙන්ම අපේක්ෂිත අනාගත ප්‍රගතීන්ද සඳහන් කර ඇත. මෙම වාර්තා සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාවේ අනුකූලන කොටසක් නිර්මාණය කරයි.

අනාගත ප්‍රවර්ධනය

අනාගත ප්‍රවර්ධනය සංවිධානයේ අනාගත අභිවෘධීන් ආංශික වාර්තාවලින් ආවරණය කර ඇත.

දිගු කාලීන පැවැත්මේ සංකල්ප

ආයතනයේ ක්‍රියාන්විත සියල්ල අඛන්ඩව කරගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගම සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවංක විශ්වාසයයි.

ඒ අනුව මූල්‍ය වාර්තා සම්පාදනය කරන ලද්දේ දිගු කාලීන පැවැත්මේ සංකල්පය මතයෙහි පිහිටමිනි.

ආදායම

අදාල වසරෙහි සමාගමේ අදායම රුපියල් මිලියන 1,407 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශයේ ආදායම පිළිබඳ විශ්ලේෂණයක් ලබා දී ඇත.

කොටස් ප්‍රාග්ධනය

වසර අවසානයෙහි කොටස් ප්‍රාග්ධනය ලෙසින් සාමාන්‍ය කොටස් 9,500,000 වලින් සමන්විත වූ රුපියල් 95,000,000 ක් තිබුනි.

ලාභ හා අනුයෝජන

බදු ගෙවීමෙන් පසු සමාගම ලැබූ අලාභය රුපියල් මිලියන 315 කි.

සේවා නියුක්තිය

2021 දෙසැම්බර් 31 වැනි දිනට සේවා නියුක්තියන්ගේ සංඛ්‍යාව 19 වන පිටුවේ සඳහන් වේ.

සංචිත

2021 දෙසැම්බර් 31 වැනි දිනට සංචිත වටිනාකම රුපියල් මිලියන 920 ක් විය. වසර 2021 සඳහා වන හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයෙහි සංචිතයේ විචල්‍යයන් දක්වා ඇත.

දේපල හා යන්ත්‍රෝපකරණ

දේපළ අත් කර ගැනීම, යන්ත්‍රෝපකරණ, සිදු කෙරෙමින් පවතින ක්‍රියාකාරකම්වල ප්‍රාග්ධන පිරිවැය යනාදිය සඳහා සම්පූර්ණ ශුද්ධ ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 56.2 ක් විය. මූල්‍ය ප්‍රකාශයේ සටහන 14 හි දේපළ හා යන්ත්‍රෝපකරණවල විස්තර ලබා දී ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

තමන්ගේ දැනුම අනුව සමාලෝචනයට බඳුන්ව ඇති කාල වකාවානුව තුල සේවා නියුක්තියන්ට මෙන්ම රජයටද නීති ප්‍රකාර ගෙවිය යුතු සියලුම ගෙවීම් ගෙවා අවසන් කර ඇත යැයි අධ්‍යක්ෂවරුන් තහවුරු කරති.

අධ්‍යක්ෂ මණ්ඩලය

ස්වාධීන රූපවාහිනියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා එහි පත් වීම් වල වෙනස් කිරීම් වාර්ෂික වාර්තාවේ පිටුව 22 හි සඳහන් කර ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්

අධ්‍යක්ෂවරුන්ට කොටස් හිමිකම් නොමැත.

ආයතනයේ ආධාර දීමනා

අදාල වසරෙහි දෙන ලද ආධාර දීමනා පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 7 හි සඳහන් කර ඇත.

ආයතනික පරිපාලනය

වත්මන් ආයතනික චර්යාව අනුව සංවිධානයේ අධ්‍යක්ෂකවරුන් යහපාලන ක්‍රමෝපායන් අත්‍යාවශ්‍ය මෙවලමක් ලෙසින් පිළිගෙන එය ආදේශ කර ඇත. 2021 වාර්ෂික වාර්තාවේ දිනයට ආයතනික පරිපාලන රීතීන් අනුව කටයුතු කරන ලද්දේ යැයි සමාගම තහවුරු කරයි.

කොටස් හිමිකම් දැරීම

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය, කොටස් 100% කට හිමිකම් දරයි.

අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්

මූල්‍ය ප්‍රකාශයේ සටහන 32 හි විස්තර කර ඇති අසම්භාව්‍ය වගකීම් හා බැඳියා හැරෙන්නට අන් කිසි අසම්භාව්‍ය වගකීම් හෝ බැඳියා සමාගමට නොමැත.

ශේෂ පත්‍රයෙන් පසුව වුන සංසිද්ධීන්

ශේෂ පත්‍ර දිනය හා ගිණුම් වලට අධ්‍යක්ෂවරුන් අත්සන් තබන දිනය අතර මූල්‍ය ප්‍රකාශයට අනුකූල කිරීම් කළ යුතු හෝ අනාවරණය කළ යුතු ආකාරයේ ප්‍රමාණාත්මක සංසිද්ධීන් සටහන 33 හි විස්තර කර ඇත. ඒ හැර කිසිවක් නොමැත.

වාර්ෂික මහා සමුළුව

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික මහා සමුළුව 2022 අගෝස්තු 24 වන දින පස්වරු 2.00 ට වික්‍රමසිංහපුර, බත්තරමුල්ල ප්‍රධාන කාර්‍යාලයේ දී පැවැත්වේ.

විගණකාධිවරුන්

විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත. අධ්‍යක්ෂවරුන් දන්නා පරිදි එම ආයතනයට සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සමඟ අන් කිසිදු සබඳතාවයක් නොමැත.

අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්,

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

සුදර්ශන ගුණවර්ධන
සභාපති

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

මූල්‍ය වාර්තා

2021 - 12 - 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } සිඒඑම/බී/ඇයිටීඑන්/1/එෆ්ඒ/2021

මගෙ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2022 ජූනි 17 දින

සභාපති

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් කර දැක්විය නොහැකි වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති රු.69,119,727 ක බැංකු අයිරාව රු.29,160,605 ක්වූ බැංකු ශේෂයන්ට හිලව් කර දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 හි 18 වී ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට පිළියෙළ කිරීමේ දී මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය ගණනය කිරීම සඳහා බදු පෙර ලාභය යොදාගත යුතු වුවත් මාධ්‍ය ජාලය විසින් විස්තීර්ණ ආදායම් ගැලපීමෙන් පසු දලාභය රු.329,653,045 යොදා ගෙන තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය රු. 14,058.366 ක් දඩුවෙන් දක්වා තිබුණි

(ඍ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 අනුව (SLFRS 15) ගණුදෙනුකරුවන් සමඟ ඇති වූ ගිවිසුම් වලින් පැන නැඟී ඇති ණය ගැතියන් හා ණය හිමියන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගිවිසුම් වත්කම් හා ගිවිසුම් වගකීම් ලෙස වෙන වෙනම දැක්විය යුතු වුවද ප්‍රතිවෙළඳ ගිවිසුම් මගින් ඇති වූ ණය ගැති ශේෂ හා ණය හිමි ශේෂය පිළිවෙලින් රු.28,824,028 ක් හා 69,702,230 ක් වෙළඳ හා ලැබිය යුතු වෙනත් දැ යටතේ හා විලම්බිත ආදායම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඎ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 (LKAS 24) අනුව මූල්‍ය ප්‍රකාශන වල සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධව හෙළිදරව් කිරීම් කල යුතු වුවද මාධ්‍ය ජාලය විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ සුද්ගලයන් සම්බන්ධයෙන් අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ඇතැකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සම්ස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 2.2.2 (i) (අ), 2.3(ග) ඡේදවල නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව		විස්තරය
(අ)	2020 ජනවාරි 27 දිනැති අංක. PED 1/2020 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.2 ඡේදය	(i)	සභාපතිවරයාගේ රාජකාරි හෝ පුද්ගලික පාවිච්චිය සඳහා සපයා තිබූ නිල වාහනයට අමතරව සපයා තිබුණු කුලී වාහනයට ඉන්ධන ලීටර් 6,347 ක් හා වාහන කුලී වෙනුවෙන් රු.4,527,582 ක් ගෙවා තිබුණි.

(ii) වක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සභාපති තනතුරට අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් 1,800ක් වුවත් අනුමත ප්‍රමාණය ඉක්මවා ලීටර් 6,025 ක් වෙනුවෙන් රු.1,035,828 ක් සමාලෝචිත වර්ෂය තුල දී දරා තිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 15 දිනැති අංක. පීඊඩී 03/2021 වක්‍රලේඛය — වක්‍රලේඛ විධිවිධාන අනුව 2020 මූල්‍ය වර්ෂයේ දී අලාභ තත්වයක් වාර්තා කර ඇති, එහෙත් 2021 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩු කරගෙන නොමැති රජය සතු සමාගම් එක් අයෙකුට රු. 3,000 ක් පමණක් ප්‍රසාද දීමනා ගෙවිය යුතු වුවත් එයට පටහැනිව එක් අයෙකුට රු.3,000 ඉක්මවා රු. 13,027,000 ක් ප්‍රසාද දීමනා අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල වන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(i) රජයේ ආයතන වැඩ සැපයුම් සේවා සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කල යුතු වුවත්, මාධ්‍ය ජාලය විසින් 2021 දෙසැම්බර් 31 දින පවත්වන ලද "ආසියානු තරු පලස" සංගීතමය වැඩසටහනට අදාලව ඉසව් කළමනාකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඇස්තමේන්තු වටිනාකම් රු.11,000,000 ක් වූ වැඩ සැපයුම් සඳහා එක් සැපයුම්කරුවකු තෝරා ගෙන තිබුණු අතර එමගින් ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු වන පරිදි අවම පිරිවැයකින් උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි, සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ,හා උපරිම අවස්ථා ලබා දීමට හැකිවන ලෙස කටයුතු කර නොතිබුණි. තවද, තෝරා ගත් ආයතනයේ පැවැත්ම පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ජාල පරීශීලනයේ දී අනාවරණය නොවුණි.

2.3 වෙනත් කරුණු

(අ) මාධ්‍ය ජාලයේ 2015 වර්ෂයේ රු. 3,198,499,721 ක් වූ සංකන්ධ ප්‍රාග්ධනය 2021 වර්ෂය දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. 2016 වර්ෂයේ සමාගමේ අලාභය රු.107,189,266 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනියේ අලාභය රු.238,131,346 ක්ද අයිටීඑන් එෆ්එම් හි අලාභය රු.41,325,521ක්ද වසන්තම් එෆ්එම් හි අලාභය රු.10,455,852 ක් හා වසන්තම් රූපවාහිනියට රු.46,337,505 ක ප්‍රදාන ලැබීමෙන් පසුද අලාභය රු.26,061,682 ක් ද වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමාගමේ මුළු අලාභය රු.315,974,401 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් පදනම් ව ස්ථාවර තැන්පතුවක් ඇපයට තබා රු.මිලියන 75ක අයිරා සීමාවක් අනුමත කර ගෙන තිබුණු අතර වර්ෂය අවසාන අයිරා ශේෂය රු.69,119,727 ක් විය.එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මාස 07 ක් අඛණ්ඩව අනුමත අයිරා සීමාව ඉක්මවා තිබුණු අතර අයිරා පොලී ලෙස රු. 3,593,733 ක් ගෙවා තිබුණි.

(ඇ) ටෙලි නාට්‍ය විකාශන ගුවන් කාලය තෝරා ගැනීමේ දුර්වලතාවයන් හේතුවෙන් 2021 වර්ෂය දී මාධ්‍ය ජාලය විසින් මිල දී ගෙන ඇති දේශීය ටෙලි නාට්‍ය 8 ක් තුලින් රු.18,348,836 ක අලාභයක් ලබා තිබුණු අතර මීන් පූර්ව දර්ශන මණ්ඩලය මගින් විකාශනයට නුසුදුසු බවට නිර්දේශ කරන ලද "සත් වර්ෂා" ටෙලි නාට්‍යය, නිෂ්පාදිකාවගේ අභියාචනාවක් මත නැවත පත්කරන ලද වෙනත් සමීක්ෂණ මණ්ඩලයක අනුමැතියෙන් පූර්ව දර්ශනය කොට විකාශනය කර තිබූ අතර එමගින් මාධ්‍ය ජාලයට රු.මිලියන 5,100,506 ක අලාභයක් දැරීමට සිදු වී තිබුණි.

(ඈ) මාධ්‍ය ජාලයේ කාරක ප්‍රාග්ධනය 2020 වර්ෂයේ රු. 620,761,280 ක් වූ අතර 2021 වර්ෂයේ දී එය රු.399,833,265 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ පවතින දුර්වලතා හේතුවෙන් එදිනෙදා මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමේ දුෂ්කරතාවයට මුහුණ දී තිබුණි.ප්‍රායෝගිකව කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී කාර්තුමය වශයෙන් මුදල් ලැබීම් හා ගෙවීම් පුරෝකථනය කරමින් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් අයවැයක් පිළියෙල කර මුදල් ප්‍රවාහ සැලසුම් කළ යුතු වුවද එවැනි අයවැය පාලන ක්‍රම භාවිතා කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට මාධ්‍ය ජාලයේ වර්ෂය ඉක්ම වූ ණයගැති ශේෂය රු.371,580,502 ක් වී තිබුණු අතර එයින් රු.2,531,970 ක් සඳහා පමණක් නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවාදායක ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය රු.28,824,029 ක් වූ අතර මාධ්‍ය ජාලය විසින් අදාළ සේවාවන් සපයා නොගැනීම හේතුවෙන් වසර 05 ක් ඉක්මවා ඇති ප්‍රතිවෙළඳ ණයගැති ශේෂයන්ගේ එකතුව රු. 14,641,728 ක් සඳහා මූල්‍ය වර්ෂයේ හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාධ්‍ය ජාලයට එරෙහිව රු. 105,000,000 ක වන්දි ඉල්ලා අපහාස වන්දි නඩු 03 ක් පවරා තිබුණි. ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය මගින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම, බෙදා හැරීම හෝ විකිණීමට ඇති අයිතිවාසිකම සමාගම විසින් කඩ කිරීමට එරෙහිව නඩු 06 ක් සහ චිත්‍රපට බුද්ධිමය දේපල නඩු 06 ක් පවරා තිබුණු අතර එම නඩු සඳහා ඉල්ලා ඇති වන්දි මුදල රු. 510,325,000 ක් විය. සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නඩු 05 ක් සහ වෙනත් කරුණු සඳහා නඩු 04 ක් වශයෙන් නඩු 24ක් සමාගමට එරෙහිව පවරා තිබුණු අතර ඉල්ලුම් කළ වන්දි මුදල රු. 125,325,000 ක් විය.මෙම නඩු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 1,036,494 ක වියදමක් දරා තිබුණි. එසේම නඩු 23 සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම්ද කර නොතිබුණි.

(ඵ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 69,702,230 ක් වූ විලම්බිත ආදායම් ශේෂය තුළ වසර 05 ට අඩු ශේෂය රු.22,725,000 ක් ද, වසර 05 ත් 10 ත් අතර ශේෂය රු. 45,379,753 ක් ද, වසර 10 ට වැඩි ශේෂය රු. 1,597,477 ක් ද ඇතුළත්ව තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඒ) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන රු.127,240,756 ක් වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වසර 10 ක් ඉක්මවූ ශේෂය රු. 41,470,241ක් වූ අතර මෙම ශේෂය නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශන අනුව රු. 5,718,320 ක් වූ අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය තුළ වසර 03 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙනඑන රු. 2,644,085 ක් වටිනා චෙක්පත් 242 ක් සහ වසර 02 ත් 03 ත් අතර කාලයට අදාල රු. 2,485,466 ක් වටිනා චෙක්පත් 239 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(ඕ) මාධ්‍ය ජාලය විසින් 2015 වර්ෂයේ මිලදිගත් රු. 1,588,500 ක් වූ Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් මිලදී ගත් දින සිට සහ 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද පිරිවැය රු. 1,218,274 ක් වූ Aros Flexus FT- 30 ,30KVA UPS Systems වසර 03 ක පමණ කාලයක සිට භාවිතයකින් තාරව නිෂ්ක්‍රියව පැවතුණි.

(ක) මාධ්‍ය ජාලය දිගින් දිගටම අලාභ ලබන හා කාරක ප්‍රාග්ධන ගැටළු වලට මුහුණ දී ඇති තත්වයක් තුල කාර්ය මණ්ඩල කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කල යුතු වුවත්, මාධ්‍ය ජාලය මූල්‍ය වර්ෂය තුල දී කොන්ත්‍රාත් පදනමින් සේවකයින් දෙදෙනෙක් ද , දෛනික පදනමින් සේවකයින් 16 දෙනෙක් ද බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල අතිරික්ත කාර්යමණ්ඩලය 67 ක් ද,අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ තනතුරු වල නිලධාරීන්ට පෞද්ගලික වන සේ සේවකයන් 113 ක්ද අනුමත

කාර්යමණ්ඩල පුරප්පාඩු වූ ස්ථිර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් සේවකයන් 13 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම තුළ රු.10,130,000 ක් වටිනා සේවකයින්ට ලබා දුන් තැගි වවුවර් ඇතුළත් වීම නිසා ප්‍රතිවෙළඳ ගණුදෙනු වලින් ගුවන් කාල ආදායමක් ලැබුවද ඊට සාපේක්ෂව මුදල් ප්‍රවාහයක් මාධ්‍ය ජාලය වෙත ගලා ඒමක් සිදු නොවීම නිසා විකුණුම් ආදායම රු.257,569,354 කින් ඉහළ ගොස් තිබුණද ශුද්ධ කාරක ප්‍රාග්ධනය රු.220,928,015 කින් අඩු වී තිබුණි. ඒ අනුව විකුණුම් ආදායමට ශුද්ධ කාරක ප්‍රාග්ධන අනුපාතය ඉකුත් වර්ෂයේදී 1.85ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එය 3.52 දක්වා ඉහළ ගොස් තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය *(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)*

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය	සටහන	**2021**	**2020**
ආදායම	**6**	**1,407,648,212**	1,150,078,858
වෙනත් ආදායම්	**7**	**110,410,237**	345,490,014
මුළු ආදායම		**1,518,058,449**	**1,495,568,872**
වැඩසටහන් වියදම්	**8**	**(503,971,809)**	(409,350,323)
අලෙවිකරණ වියදම්	**9**	**(87,284,911)**	(91,416,798)
අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම්	**10**	**(1,300,923,871)**	(1,294,624,865)
මෙහෙයුම්වලින් ලාභ		**(374,122,142)**	**(299,823,114)**
ශුද්ධ මූල්‍ය ආදායම	**11**	**30,410,661**	50,141,441
බදුකරණයට පෙර ලාභය		**(343,711,481)**	**(249,681,673)**
ආදායම් බදු වියදම්	**12**	13,678,644	35,707,166
වසර සඳහා ලාභය		**(330,032,837)**	**(213,974,507)**
කොටසක් සඳහා මූලික ඉපැයුම් (රු.)	**13**	**(33.26)**	**(23.88)**
වසර සඳහා ලාභය		**(330,032,837)**	**(213,974,507)**
අනෙකුත් විස්තීරණ ආදායම		14,058,436	(12,886,453)
වසර සඳහා මුළු විස්තීරණ ආදායම		**(315,974,401)**	**(226,860,960)**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය

පිටු 5 සිට 23 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	සටහන	2021	2020
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**14**	770,374,015	855,072,463
අස්පෘශ්‍ය වත්කම්	**15**	8,163,241	4,906,926
විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්	**16**	4,000	4,000
විලම්බිත බදු වත්කම	**17**	17,180,565	3,501,921
ජංගම නොවන මුළු වත්කම්		**795,721,821**	**863,485,311**
ජංගම වත්කම්			
වට්ටෝරු භාණ්ඩ	**18**	12,526,995	10,186,261
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**19**	601,543,093	712,153,945
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්	**20**	57,667,276	59,144,336
තැන්පතු හා අත්තිකාරම්	**21**	12,694,089	14,823,561
ජංගම බදු ලැබිය යුතු		10,736,395	10,736,395
පූර්ව ගෙවීම්		5,884,778	5,928,216
අනෙකුත් මූල්‍ය වත්කම්	**22**	338,300,156	326,681,339
මුදල් හා මුදලට සමාන දෑ	**23**	259,806,021	362,004,251
මුළු ජංගම වත්කම්		**1,299,158,803**	**1,501,658,304**
මුළු වත්කම්		**2,094,880,624**	**2,365,143,615**
ස්කන්ධ හා බැරකම්			
ස්කන්ධ			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	**24**	95,000,000	95,000,000
රඳවාගත් ඉපැයුම්		920,725,329	1,236,699,730
මුළු ස්කන්ධ		**1,015,725,329**	**1,331,699,730**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	**25**	113,854,752	129,534,361
රජයේ ප්‍රදාන	**26**	65,975,005	23,012,500
විලම්බිත බදු බැරකම	**17**		
මුළු ජංගම නොවන බැරකම්		**179,829,757**	**152,546,861**
ජංගම බැරකම්			
සේවාදායක අත්තිකාරම්		127,240,756	137,772,746
විලම්බිත ආදායම	**27**	69,702,230	63,929,480
අනෙකුත් ගෙවිය යුතු දෑ	**28**	132,801,209	146,229,965
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ	**29**	19,297,912	22,986,518
ප්‍රතිපාදනය හා උපචිත වියදම්		550,283,431	509,978,315
මුළු ජංගම බැරකම්		**899,325,538**	**880,897,024**
මුළු ස්කන්ධ හා බැරකම්		**2,094,880,624**	**2,365,143,615**

සමාගමේ මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතා සමග අනුකූල වන බව මම සහතික කරමි.

.....
මූල්‍ය කළමනාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

.....	.....
අධ්‍යක්ෂ	**අධ්‍යක්ෂ**

දිනය: 2022 මාර්තු 11
කොළඹ

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය
පිටු 5 සිට 23 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රඳවාගත් ඉපැයුම්	එකතුව
2020 ජනවාරි **01** දිනට ශේෂය	**95,000,000**	**1,463,560,695**	**1,558,560,695**
වර්ෂය සඳහා ලාභය	-	(226,860,960)	(226,860,960)
2020 දෙසැම්බර් **31** දිනට ශේෂය	**95,000,000**	**1,236,699,735**	**1,331,699,735**
වර්ෂය සඳහා ලාභය	-	(315,974,401)	(315,974,401)
2021 දෙසැම්බර් **31** දිනට ශේෂය	**95,000,000**	**920,725,334**	**1,015,725,334**

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය *(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)*

දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		2021	2020
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
බදුකරණයට පෙර ලාභය		(329,653,045)	(262,568,126)
ගැලපීම්			
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		78,376,094	52,397,951
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලාභය/අලාභය		11,739	(1,660,678)
රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය		(3,375,000)	(2,737,500)
ආපසු පොත්වලට ගත් නොගෙවූ ශේෂ		(11,038,234)	0
ලියා හරින ලද බොල් ණය		0	0
වෙළඳ ගෙවිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදන		5,936,662	30,077,472
ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදන		2,710,679	4,746,224
වෙළඳ ලැබිය යුතු දෑවල හානිකරණ අඩුවීම		(2,395,684)	
වර්ෂය සඳහා පාරිතෝෂික ගාස්තු		3,688,578	31,991,096
ක්ෂයවීම්		141,921,215	154,740,944
මන්දගාමී වට්ටෝරු භාණ්ඩ හානිය සඳහා ප්‍රතිපාදනය		0	490,675
ආර්ථික සේවා ගාස්තු ලියා හැරීම		0	5,821,064
තොග ලියා හැරීම්		0	0
පොළී ආදායම		(34,004,394)	(50,141,441)
පොළී වියදම		3,593,733	-
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය		**(144,227,657)**	**(36,842,319)**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
වට්ටෝරු භාණ්ඩ		(961,594)	2,264,452
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ		104,359,196	(239,868,495)
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්		1,477,060	6,519,322
තැන්පතු හා අත්තිකාරම්		2,129,472	4,409,884
පූර්ව ගෙවීම්		43,438	1,085,924
සේවාදායක අත්තිකාරම්		(10,531,990)	19,434,580
විලම්බිත ආදායම		5,772,750	2,531,250
අනෙකුත් ගෙවිය යුතු දෑ		(13,428,756)	34,235,670
ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		4,596,428	5,841,414
ප්‍රතිපාදනය හා උපචිත වියදම්		40,305,116	77,416,949
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්		**(10,466,537)**	**(122,971,369)**
ගෙවන ලද පාරිතෝෂික		(17,879,898)	(13,736,736)
ගෙවන ලද පොළිය			
ගෙවන ලද බදු			
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(28,346,435)**	**(136,708,105)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම්		(62,963,774)	(34,655,293)
දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබුණු මුදල්		855,333	1,682,028
නොනිමි ප්‍රාග්ධන වැඩ මත දරන ලද වියදම්		4,759,707	(495,558)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම්		(81,632,409)	(49,069,262)
අනෙකුත් මූල්‍ය වත්කම්වල ආයෝජන		(13,900,870)	19,162,687
ලැබුණු පොළිය		32,692,714	57,630,945
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(120,189,299)**	**(5,744,453)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
රජයේ ප්‍රදානය		46,337,505	5,100,000
ගෙවූ ලාභාංශ			
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලැබූ ශුද්ධ මුදල්		**46,337,505**	**5,100,000**
වර්ෂය තුළ මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වෙනස්කම්		(102,198,229)	(137,352,558)
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ		362,004,251	499,356,809
වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ	**(සටහන 23)**	**259,806,021**	**362,004,251**

විගණන වාර්තාව පිටුව **1**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය

පිටු **5** සිට **23** දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි ඒකාබද්ධ කොටසක් වේ

1. ආයතනික තොරතුරු

1.1 වාර්තාකරණ අස්තිත්වය

සීමාසහිත ශ්‍රී ලංකා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ශ්‍රී ලංකාව තුළ රූපවාහිණී නාලිකා දෙකක් සහ ගුවන් විදුලි නාලිකා දෙකක් මෙහෙයවන්නා වූ රූපවාහිණිනී සහ ගුවන්විදුලි විකාශන ආයතනයකි. සමාගමේ ප්‍රධාන කාර්යාලය වික්‍රමසිංහපුර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා තිබේ. 1987 අංක 23 දරණ පනත යටතේ රාජ්‍ය සංස්ථා සහ රජයට අයත් ව්‍යාපාරික ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම ප්‍රකාරව රජයට අයත් ව්‍යාපාරයක් වන සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය විසින් සිදුකරනු ලැබූ ව්‍යාපාරය පවරා ගනු පිණිස සීමිත රාජ්‍ය සමාගමක් ලෙස 1992 අප්‍රේල් 27 දින එය සංස්ථාගත කරන ලදී. ඒ අනුව, 2004 වර්ෂය අවසානය වන විට මුළුමණින්ම ක්‍රමක්ෂය කරන ලද රු. 33,861,107/=ක කිර්තිනාමයක් ඇති කරමින් භාණ්ඩාගාරයේ ලේකම්ට නිකුත් කරන ලද රු. මිලියන 95ක කොටස් ප්‍රාග්ධනයට අදාළ ගැලපීම හැරුණු විට රජයට අයත් ව්‍යාපාරික ආයතනයේ ගිණුම්වල පෙන්නුම් කරන ශේෂ සමාගමට පවරා ඇත.

1.2 නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

2022 මාර්තු 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් ප්‍රකාරව 2021දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලයේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය පවරන ලදී.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 පිළියෙළ කිරීමේ පදනම

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පිළියෙළ කර තිබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු යොදා ගැනීම අවශ්‍ය වේ. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය සිය තීන්දු ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ. වඩා ඉහළ ප්‍රමාණයක තීරණ හෝ සංකීර්ණතා සම්බන්ධවන්නා වූ හෝ මූල්‍ය ප්‍රකාශනවලට උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂෙත්‍රයන් 5වන සටහනේ හෙළිදරව් කර තිබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ෙඑතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපාන්නා වූ උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදු නොකර සංගතව ආදේශ කර ඇත. ඒ හැරුණු විට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම, පාරිතෝෂික සූත්‍රය භාවිතා කරමින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමවේදය පාදක කර ගනිමින් එහි වත්මන් වටිනාකමට මණිනු ලබයි.

2.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්, අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති කාල සීමාවන්ට සංගතව ආදේශ කර ඇත.

වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා සහ ප්‍රවර්තන වසර සමග වඩා සන්සන්දනීය වීම පිණිස අදාළ තැන්හිදී, පෙර වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය සංශෝධනය කර ඇත.

2.3 ඛණ්ඩ වාර්තාකරණය

මෙහෙයුම් ඛණ්ඩයක් යනු, සමාගමේ අනෙකුත් සංරචක කවරක් හෝ සමග ගනුදෙනු ආශ්‍රිත ආදායම් සහ වියදම් ඇතුළුව එය ආදායම් ඉපැයිය හැකි හො වියදම් දැරිය හැකි ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල නියැළෙන සමාගමේ සංරචකයකි. ඛණ්ඩය සඳහා වෙන්කරනු ලැබිය හැකි සම්පත් පිළිබඳ තීරණ ගැනීම සහ එහි කාර්යසාධනය ඇගයීම පිණිස, සියලු මෙහෙයුම් ඛණ්ඩවල මෙහෙයුම් ප්‍රතිඵල මණ්ඩලය විසින් නිරතුරුව සමාලෝචනය කරනු ලබයි. සමාගම සතු විවිධ නාලිකාවන්ට අනුව මෙහෙයුම් ඛණ්ඩ වෙන් වශයෙන් සංවිධානය කර කළමනාකරණය කරනු ලබයි. එක් එක් මෙහෙයුම් ඛණ්ඩයේ ප්‍රතිඵල පිළිබඳ විස්තරාත්මක තොරතුරු 34 වන සටහනේ සපයා ඇත.

2.4 ප්‍රවර්තන ව්‍යාපාරය

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදු කර ඇති අතර ඇවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

2.5 වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සියළු ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන්හිදී අදාළ මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකොට හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

2.6 බැඳීම්

වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සියලු සැලකිය යුතු බැඳීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල හෙළිදරව් කොට ඇත.

2.7 විදේශ ව්‍යවහාර මුදල්

(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාරික මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර ඇති අයිතම මණිනු ලබන්නේ අස්තිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ ව්‍යවහාරික මුදල යොදා ගනිමිනි (ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාරික මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

(ආ) ගනුදෙනු සහ ශේෂ

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ,ගනුදෙනුව සිදුකළ දිනයන්හිදී පැවති විනිමය අනුපාතය හෝ අයිතම නැවැත මනිනු ලබන අවස්ථාවන්හිදී වටිනාකම යොදාගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විදේශ මුදලින් අභිධාන කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වසර අවසාන විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේදී ඇතිවන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

2.8 දේපළ, පිරියත හා උපකරණ

සියලු දේපළ, පිරියත සහ උපකරණ මුලින්ම හඳුනාගනු ලබන්නේ වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද යම් ආනුෂංගික වියදම් ඇතුළුව මිලදී ගැනීමේ පිරිවැය ඇතුළුව මුළින්ම හඳුනාගත් පිරිවැයටය. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගෙන ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් හෝ වටිනාකමේ සමුච්චිත හානිවීම් අඩුකර පිරිවැයටය.

ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාජ්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතමය තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

ආරම්භයේදි තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල ,පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට දරන ලද වියදම් ,එලෙස වියදම් දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

2.8.1 **ක්ෂයවීම්**

ඉඩම් ක්ෂය කරනු නොලැබේ. අනෙකුත් වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සරල රේඛීය ක්‍රමය භාවිතා කරමින් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ඒවායේ පිරිවැය වෙන්කිරීමටය. ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ.

ක්ෂය	ප්‍රයෝජනවත් වර්ෂ ගණන
ගොඩනැගිලි	20
පිරියත හා යන්ත්‍රෝපකරණ	02 15
දෘශ්‍ය සංඛ්‍යාත උපකරණ	04-08
ලී බඩු හා උපාංග	08
සම්ප්‍රේෂක	08
රථ වාහන	04
පුස්තකාල පොත්	04
මෙවලම්	04
කර්යාල උපකරණ	04

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදීම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කොට ගලපනු ලැබේ. වත්කමක ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්, වත්කමේ ධාරණ අගය වහාම ලියා හරිනු ලැබේ..

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ලත් මුදල සහ ධාරණ වටිනාකම සමග සැසඳීමෙන් වන අතර ලාභ/(අලාභ) විස්තිරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

2.8.2 නොනිම් ප්‍රාග්ධන වැඩ

නොනිම් ප්‍රාග්ධන වැඩ යනු වත්කමක් ඉදිකිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය වේ. නොනිම් වැඩ එය සාරනුකූලව සම්පූර්ණ කරනු ලැබූ විටදී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් විටදී අදාළ වත්කම් ගිණුම්වලට මාරුකරනු ලැබේ.

2.8.3 අස්පෘශ්‍ය වත්කම්

අ) පරිගණක මෘදුකාංග

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒම අපේක්ෂා කරන්නේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් සේ පිළිගනු ලැබේ. අත් කර ගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකර ප්‍රකාශ කරනු ලැබේ. මෙම පිරිවැය ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය වන වසර 5 ක කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

ආ) විකාශන අයිතිය

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයන් තිබේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් විකාශන අයිතිය සඳහා බලපත්‍ර අස්පෘශ්‍ය වත්කමක් සේ පිළිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකොට පිරිවැයට දක්වනු ලැබේ. මෙම පිරිවැය හඳුනාගත් ආශ්‍රිත ආදායමේ ප්‍රමාණයට මෙම පිරිවැය ක්‍රමක්ෂය කරනු ලැබේ.

විකාශන අයිතියේ වියදම්වලින් 90%ක්	පළමුව විකාශනය කිරීම
විකාශන අයිතියේ වියදම්වලින් 10% ක්	දෙවනුව විකාශනය කිරීම

2.8.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදී, වත්කම් හානියක් වී ඇති බවට යම් ඇඟවීමක් ඇත්දැයි යන්න නිශ්චය කිරීම සඳහා සමාගම එහි දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ධාරණ අගයන් සමාලෝචනය කරයි. එවැනි යම් ඇඟවීමක් පවතින්නේ නම්, හානිකරණ අලාභයේ ප්‍රමාණය (තිබේ නම් පමණක්) නිශ්චය කිරීම පිණිස වත්කමේ ආපසු අයකරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු ගත කරනු ලැබේ. යම් තනි වත්කමක ආපසු අයකර ගත හැකි ප්‍රමාණය තක්සේරු කිරීමට නොහැකි විටදී, සමාගම මුදල් උත්පාදන ඒකක නිශ්චය කරන අතර වත්කම් අයත් මුදල් උත්පාදන ඒකකයන්හි ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ.

ආපසු අයකර ගත හැකි වටිනාකම යනු විකිණීම සඳහා පිරිවැය අඩුකොට සාධාරණ වටිනාකම සහ භාවිතයේදී වටිනාකම අතුරින් වඩා ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලේ කාලික අගයේ වත්මන් වෙළඳපොළ තක්සේරු පිළිබිඹු කෙරෙන පූර්ව බදු වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඒවායේ වත්මන් වටිනාකමට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ සහ අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු ගලපා නොමැති වත්කම්වලට විශේෂිත වූ අවදානම් වට්ටම් කරනු ලබයි.

වත්කමක ආපසු අයකර ගත හැකි වටිනාකම සහ මුදල් ජනන ඒකක ධාරණ අගය එහි ධාරණ වටිනාකමට වඩා අඩු බවට ඇස්තමේන්තු කර ඇත්නම්, වත්කමේ සහ මුදල් ජනන ඒකකවල ධාරණ අගය ආපසු අයකර ගත හැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ. විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හානිකරණ අලාභයක් වහාම හඳුනාගනු ලැබේ.

2.9 මූල්‍ය වත්කම්

(අ) වර්ගීකරණය

ආරම්භක හඳුනාගැනීමේදී සමාගම එහි මූල්‍ය වත්කම් නිශ්චය කරන අතර පහත පරිදි එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලැබේ.

I. ණය හා ලැබිය යුතු දෑ
II. විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

I. ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබූ වාර්තාකරණ කාල සීමාව අවසානයෙන් පසුව මාස 12 කට වඩා වැඩි කල්පිරීම් හැරුණු විට, ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම්වල ඇතුලත් කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ වාර්තාකරණ කාලසීමාව අවසානයේදි සමාගමේ ණය හා ලැබිය යුත දෑ ආයතනික ණය, අත්තිකාරම් මුදල් හා මුදලට සමාන දෙයින් සමන්විත වේ.

II. විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් වනුයේ මෙම කාණ්ඩයේ වර්ගීකරණ කර ඇති හෝ වෙනත් කිසිම කාණ්ඩයක වර්ගීකරණය කර නොමැති ව්‍යුත්පන්න නොවන දෑ වේ. වාර්තාකරණ කාල සීමාව අවසානයේ මාස 12ක් තුළ ආයෝජනය කල් පිරින්නේ නම් හෝ බැහැර කිරීමට කළමනාකරණය අදහස් කරන්නේ නම් මිස ඒවා ජංගම නොවන වත්කම්වල ඇතුලත් කරනු ලැබේ. විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් නොකැඳවූ දිගු කාලීන ආයෝජන සහ ණය සුරැකුම්පත්වලින් සමන්වි වේ.

(ආ) හඳුනාගැනීම සහ මූලික මැණීම

ණය හා ලැබියයුතු දෑ ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් සමාගම ගනුදෙනුව ආරම්භ කළ දිනයට හඳුනාගනු ලැබේ. අනෙකුත් මූල්‍ය වත්කම් පිළිගනු ලබන්නේ මූල්‍ය සාධන පත්‍රයේ ගිවිසුම්කර ප්‍රතිපාදනයන්ට සමාගම පාර්ශවකරුවකු වූ වෙළඳ දිනයටය.

මූල්‍ය වත්කමක් මුලින්ම මණිනු ලබන්නේ සාධාරණ වටිනාකමට සහ සාධාරණ වටිනාකමට මණිනු නොලබන වත්කමක් වන විටදී ගනුදෙනු පිරිවැයට සෘජුවම ආරෝපණිය ලාබය හෝ පාඩුව මගිනි.

මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය කල් ඉකුත් වූ විට හෝ පවරනු ලැබූ විටදී සහ මූල්‍ය වත්කමේ සියලු අවදානම්, පරිදාන සහ හිමිකාරිත්වය සමාගම සාරානුකූලව පවරනු ලැබ ඇති විටදී මූල්‍ය වත්කම්වල හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ.

(ඇ) තදනන්තර මැණීම

I. ණය හා ලැබිය යුතු දෑ
මූලික පිළිගැනීමෙන් අනතුරුව, ණය හා ලැබිය යුතු දෑ මණිනු ලබන්නේ හානි අඩුකොට සළුල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් තදනන්නතරව ක්‍රමක්ෂිත පිරිවැයටය.

II. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්
මූලික පිළිගැනීමෙන් අනතුරුව, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් මණිනු ලබන්නේ හානිකරණ සඳහා ප්‍රතිපාදන අඩුකොට සාධාරණ වටිනාකමටය.

(ඇ) මූල්‍ය වත්කම් හානිකරණය

I. ක්‍රමක්ෂිත පිරිවැයට පවත්වා ගනු ලැබූ වත්කම්

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම මූල්‍ය වත්කමක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන්හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මිණිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.
ක්‍රමක්ෂිත පිරිවැයට රැගෙන යනු ලැබූ ණය සහ ලැබිය යුතු දේ සඳහා, හානියේ ප්‍රමාණය මණිනු ලබනුයේ වත්කමෙහි ධාරණ මුදල සහ මූල්‍ය වත්කමෙහි මුල් සළුල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු කර හානියේ වටිනාකම විස්තිරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. තදනන්තර කාල සීමාවකදී, හානිකරණ අලාභයේ ප්‍රමාණය අඩු වේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමකට එම අඩුවීම වාස්තවිකව සම්බන්ධ කිරීමට හැකි නම්, කළින් හඳුනාගත් හානිකරණ අලාභයේ ප්‍රතිවර්තනය විස්තිරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. ආයතනික ණය ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරනු ලැබේ.

II විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්
සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම මූල්‍ය වත්කමක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. නොකැඳවූ ස්කන්ධ ආයෝජන සඳහා, ආයෝජනයේ වටිනාකම එහි පිරිවැයට අඩුවෙන් සැලකිය යුතු ලෙස හෝ දීර්ඝ කාලීනව අඩුවීම වත්කම හානි වී ඇති බවට වාස්තවික සාක්ෂියක් වේ. නොකැඳවූ ආයෝජන සම්බන්ධයෙන් එවැනි සාක්ෂි පවතින්නේ නම්, මූල්‍ය වත්කමේ ධාරණ අගය සහ සමාන මූල්‍ය වත්කමක් සඳහා වත්මන් වෙළඳපොළ ඉපැයුම් අනුපාතිකයට වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අතර වෙනස හානිකරණ අලාභය ගණනය කරනු ලැබේ. එවැනි හානිකරණ අලාභ ප්‍රතිවර්ත කරනු නොලැබේ.

2.10 වෙළඳ ලැබිය යුතු දෑ
වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකුණනු ලැබූ භාණ්ඩ හෝ ඉටුකරනු ලැබූ සේවාවන් වෙනුවෙන් ලැබිය යුතු මුදල් වේ. එක් වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ එකතුව අපේක්ෂා කරනු ලබන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ) ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. එසේ නොමැතිනම් ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ මුලින්ම සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර අනතුරුව කෙටි කාලයක් තුළ ලැබීමට අපේක්ෂා කරන බැවින් හානිකරණ ප්‍රතිපාදන අඩුකොට ගනුදෙනු මිලට (මුල් ඉන්වොයිසි වටිනාකම) මණිනු ලැබේ.

ලැබිය යුතු දෑ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සමාගමට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇති විටදී වෙළඳ අයවිය යුතු දේවල හානිවීම සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ. ණය ගැනියා මුහුණ දෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැනියා බුන්වත් බවට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළඳ ලැබිය යුතු දෑ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කමේ ධාරණ වියදම අඩුකරනු ලබන අතර විස්තිරණ ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල පිළිගනු ලැබේ.

වෙළඳ ලැබීය යුතු මුදලක් ලබා ගැනීමට නොහැකි වන විටදී ලැබිය යුතු වෙළෙඳ මුදල් සඳහා දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් ලියා හරින ලද මුදල් තදනන්තරව ආපසු අයකර ගැනීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදා හැරීමේ පිරිවැයට බැරකරනු ලැබේ.

වැදගත් වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරනු ලබන අතර වැදගත් නොවන වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා සාමුහික පදනමින් තක්සේරු කරනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ තක්සේරු කිරීම සඳහා යොදාගනු ලබන ආදර්ශය හා පදනම පහත දැක්වෙන පරිදි වේ.

(අ) කේවළ ඇගයීම් ආදර්ශය: හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වර්ගයන්හි වෙළඳ ලැබිය යුතු දෑ තනි තනිව සමාලෝචනය කරනු ලැබේ.

i. රාජ්‍ය ආයතන: හානිකරණය සඳහා වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් 100% ප්‍රතිපාදනය
ii. වාණිජ සේවාදායකයන් වැදගත් සේවාදායකයන් - හානිකරණය සඳහා වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් 100% ප්‍රතිපාදනය

(ආ) සාමූහික ඇගයීම් ආදර්ශය: හානිකරණ අලාභය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වර්ගයන්හි වෙළඳ ලැබිය යුතු දෑ සාමූහිකව සමාලෝචනය කරනු ලැබේ.

i. වාණිජ සේවාදායකන් වැදගත් නොවන සේවාදායකයන්- සම්භාවිතා ආදර්ශය

2.11 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයටය. හරිත සාමාන්‍ය ක්‍රමවේදය මගින් පිරිවැය නිශ්චය කරනු ලැබේ.අමතර කොටස්, ලිපිද්‍රව්‍ය, ඉන්ධන හා ලිහිසි තෙල් ආදියෙන් වට්ටෝරු භාණ්ඩ සමන්විත වේ. වට්ටෝරු භාණ්ඩ ඇත්තේ පරිභෝජනයට මිස නැවැත විකිණීම සඳහා නොවේ.

2.12 මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් හා සමාන දෑ යන්නට අතැති මුදල් ,ඉල්ලූ විට ලබාගැනීම සඳහා බැංකුවේ රඳවා ඇති තැන්පතු ,මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුලත් වේ .

2.13 කොටස් ප්‍රාග්ධනය

කොටස් ප්‍රාග්ධනය ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන අතර සාමාන්‍ය කොටස් ස්කන්ධ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

2.14 මූල්‍ය වගකීම්

සමාගම මූල්‍ය වගකීම් අනෙකුත් මූල්‍ය වගකීම්වලට වර්ගීකරණය කරයි. සමාගමේ අනෙකුත මූල්‍ය වගකීම්වලට අනෙකුත් ගෙවිය යුතු දෑ, පොළි දරන ණය සහ ආශ්‍රිත පාර්ශවවලින් ලැබීමට නියමිත මුදල් ඇතුලත් වේ. අනෙකුත් මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ වටිනාකම සහ සෘජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැයට හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මෙම මූල්‍ය වගකීම් මණිනු ලැබේ. ගිවිසුම්කර බැඳීම් ගෙවා නිම කළ විටදී, අවලංගු කළ විටදී හෝ කල් ඉකුත් වූ විටදී මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් ඉවත් කරනු ලැබේ.

2.15 ණය ගැනුම්

දරන ලද ගනුදෙනු පිරිවැය අඩු කොට සාධාරණ වටිනාකමට ණය ගැනුම් මුලදී හඳුනාගනු ලැබේ. ණය ගැනුම් පසුකාලීනව ක්‍රමක්ෂිත පිරිවැයට දක්වනු ලබන අතර ලත් මුදල (ගනුදෙනු පිරිවැය අඩු කොට) සහ මිදවුම් වටිනාකම අතර යම් වෙනසක් සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ණය ගැනුම් කාල පරිච්ඡේදය පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.
ණය ගැනුම් පිරිවැය ඒවා දරන ලද කාල පරිච්ඡේදය තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

2.16 ජංගම සහ විලම්භිත බදු

මෙම කාලසීමාව තුළ බදු වියදම් සමන්විත වන්නේ ජංගම සහ විලම්භිත බදුවලිනි. ආදායම් ප්‍රකාශය තුල බදු පිළිගනු ලබන්නේ අනෙකුතු විස්තීරණ ආදායම්වල හෝ සෘජුවම ස්කන්ධ ගණන් ගනු ලබන අයිතමවලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටය. මෙහිදී පිළිවෙලින් අනෙකුත් විස්තීරණ ආදායම්වල හෝ සෘජුවම ස්කන්ධවල ද බදු හඳුනාගනු ලැබේ.

අ) ජංගම බදුකරණය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සමාගමට ජංගම බදු බැරකම් ඇතිවේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරිත්වය විශ්වාස කරන යථෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල මේ බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ.

ආ) විලම්භිත ආදායම් බද්ද

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත ශේෂ පත්‍ර ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ. වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ සත්තාවීව පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය වන විටදී යොදා ගැනීමට අපේක්ෂා කරන ලබන බදු අනුපාතයන්ට විලම්භිත බදු ගණනය කෙරේ.
විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනසකම් උපයෝජනය සඳහා යොදාගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ඇතිවිය හැකි තාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තවදුරටත් සිදු නොවිය හැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට පනවනු ලැබ ඇති හෝ සත්තාවීව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව, වත්කම උපලබ්ධි වූ හෝ බැරකම පියවනු ලැබූ වර්ෂයට අදාළ කර ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට අනුව විලම්බිත බදු වත්කම් සහ බැරකම් ගණනය කරනු ලැබේ.

ජංගම බදු බැරකම් සහ වත්නම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහ බදු අධිකාරීන් විසින්ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

2.17 සේවක ප්‍රතිලාභ

අ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව සමාගමේ බැඳීම වනුයේ වාර්තාකරණ කාලසීමාව අවසානයේදී නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකමයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමවේදය භාවිතා කරමින් ස්වාධීන ආයුගණකවරුන් විසිනි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම නිර්ණය කරනු ලබන්නේ වත්මන් හා අනාගත කාලපරිච්ඡේදයන් සඳහා සේවකයන්ගේ සේවය වෙනුවෙන් ඔවුන් උපයා ඇති ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභ වට්ටම් කිරීම මගිනි.

අත්දැකීම් ගැලපුම්වලින් මතුවන ආයුගණක ලාභ හෝ අලාභ සහ ආයුගණක උපකල්පනවල වෙනස්කම් ඒවා පැන නගින කාලසීමාවන් තුළ අනෙකුත් විස්තීරණ ආදායමේ ස්කන්ධ වෙත බැර කරනු ලැබේ.
මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණ වාර්තාකරණ කාලසීමාව අවසානයේදී නිශ්චය කරනු ලබන ප්‍රමාණයන්ගෙන් සැලකිය යුතු ලෙස වෙනස් වන්නේ නම් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම සමාගම නැවත මණිනු ඇත.
අතීත සේවා පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එකෙණෙහිම හඳුනාගනු ලැබේ. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

ආ) නිර්වචිත දායකත්ව සැලසුම්

සමාගමේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයන් වන අතර ඒ සඳහා එම සේවකයන්ගේ මූලික හා ඒකාබද්ධ වේතනයෙන් හෝ වැටුපෙන්, ජීවන වියදම් දීමනාවෙන් සහ අනෙකුත් සියලු දීමනාවලින් පිළිවෙළින් 15% සහ 3% ක් සේවා යෝජකයන් දායක කරයි.

2.18 රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සමාගම අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇත්නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැය ආශ්‍රිත රජයේ ප්‍රදාන, එම ප්‍රදාන ලැබුණු විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.
දේපල, පිරියත සහ උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වල ඇතුලත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

2.19 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සංස්ථාව සතු විටදී එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය විම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටිදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.
වත්මන් බැඳීම හා ආශ්‍රිත අවදානම් හා අවිනිශ්චිතතා ඇතුළුව වාර්තාකරණ දිනයේදී පවතින වඩාත්ම විශ්වාසය තැබිය හැකි සාක්ෂි මත පදනම්ව, වත්මන් බැඳීම පියවීම පිණිස අවශ්‍ය ඇස්තමේන්තුගත වියදමට ප්‍රතිපාදන මණිනු ලැබේ.

2.20 අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකමක් යනු සමාගමේ පාලනයෙන් පරිබාහිර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් හට ගැනීම හෝ හට නොගැනීම මගින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් හෝ එකී බැඳීමෙන් නිදහස් වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යෑමක් සිදුවීමේ හැකියාවක් නැති නිසා පිළිනොගැනෙන වර්තමාන බඳීමකින් හෝ පැන නැගීමට හැකියාවක් ඇති බැඳීමකි

විශ්වසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින අතිශයින් දුර්ලභ අවස්ථාවලදී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි. අසම්භාව්‍ය බැරකමක් සමාගම පිළිනොගන්නා නමුත් එය පැවතීම මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කරනු ලැබේ.

අසම්භාව්‍ය වත්කමක් යනු සමාගමේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හට ගැනීමෙන් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සමාගම අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වූවත් එය සැබවින්ම ස්ථීර නොවන අවස්ථාවලදී එවැනි දේවල පැවැත්ම අනාවරණය කරයි.

2.21 වෙළඳ ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීමය. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් තුළ හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගුවේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. එසේ නොමැති නම් ඒවා ජංගම නොවන බැරකම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර අනතුරුව, කෙටි කාලයක් තුළ ගෙවීමට අපේක්ෂා කරන නිසා එහෙයින් මුදලේ වටිනාකම නොවැදගත් වන නිසා මුල් ඉන්වොයිසියේ ප්‍රමාණයට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂීත පිරිවැයට මණිනු ලැබේ.

2.22 කල්බදු

හිමිකාරිත්වයේ අවදානම් හා පරිදානවල සැලකිය යුතු කොටසක් කල්බදුකරු විසින් රඳවා ගන්නා කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු යටතේ සිදුකරන ගෙවීම් (කල්බදුකරුගෙන් ලැබෙන යම් දිරිදීමනා අඩු කොට) සරල මාර්ගික පදනමක් මත කල්බදු කාලපරිච්ඡේදය පුරා ආදායම් ප්‍රකාශය තුළ වියදමක් ලෙස දක්වා ඇත.

සමාගම දේපළ, පිරියත හා උපකරණ කල්බදු ගනියි. කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස සමාගමට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපල, පිරියත හා උපකරණ කල්බද්ද ආරම්භයේදී කල්බදු ගත් දේපලේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩුනම් සමුච්චිත ක්ෂයවීම අඩුකොට ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනායිත කරනු ලැබේ.

එක් එක් කල්බදු ගෙවීම් බැරකම සහ මූල්‍ය ගාස්තු අතර බෙදා වෙන්කරනු ලැබේ. අනුරූපී කුලී බැඳීම්, මූල්‍ය ගාස්තු අඩුකොට අනෙකුත් දිගුකාලීන ගෙවිය යුත දෑ වල ඇතුලත් කරනු ලැබේ. මූල්‍ය පිරිවැයෙහි පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා ආදායම් ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ. මූල්‍ය කල්බදු යටතේ අත්කර ගත් දේපළ, පිරියත හා උපකරණ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය සහ කල්බදු කාල සීමාව යන දෙකින වඩා අඩු කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ.

3 විස්තීරණ ආදායම

3.1 ආදායම හඳුනාගැනීම

ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලයේ සාධාරණ වටිනාකමට අනුව ආදායම මණිනු ලබන අතර සපයන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර අගය එකතු කළ බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද අඩුකොට ප්‍රකාශ කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වසනීය ලෙස මැණිය හැකි විටදී; අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ප්‍රවාහය වීමට ඉඩ ඇති විටදී; සහ සමාගමේ එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇති විටදී සමාගම ආදායම පිළිගනියි.

සපයනු ලැබූ එක් එක් හඳුනාගත් ප්‍රධාන සේවා වර්ගයන් වෙතට සමාගම පහත විස්තර කර ඇති ආදායම් හඳුනාගැනීමේ නිර්ණායක ආදේශ කරයි.

(අ) ගුවන්කාලය විකිණීම

අගය එකතු කළ බද්ද අඩුකොට ගුවන් කාලයේ ඉන්වොයිසි කරන ලද වටිනාකම්න් ආදායම සමන්විත වේ. වෙළඳ දැන්වීම විකාශනය කරනු ලබන විටදී ආදායම හඳුනාගනු ලැබේ.

(ආ) නිෂ්පාදන ආදායම

අගය එකතු කළ බද්ද අඩුකොට ගුවන් කාලයේ ඉන්වොයිසි කරන ලද වටිනාකම්න් ආදායම සමන්විත වේ. නිෂ්පාදනය විකාශනය කරනු ලබන විටදී ආදායම හඳුනාගනු ලැබේ.

3.2 පොළී ආදායම

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් පොළී ආදායම හඳුනාගනු ලැබේ.

3.3 කුලී ආදායම

කුලී කාලපරිච්ඡේද පුරා උපචිත පදනමින් පොළී ආදායම හඳුනාගනු ලැබේ.

3.4 දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් ආදායම දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම සමග සැසඳීමෙන් වන අතර විස්තීරණ ආදයම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

3.5 අනෙකුත් ආදායම

අනෙකුත් සියලු ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

3.6 මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමයක ඉපැයුම් අතර සෘජු සබඳතා පදනම මතය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දරනු ලබන සියලු වියදම් වර්ෂය සඳහා ලාභ/පාඩු නිගමනය කිරීමේදී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලු බැරකම් සහ දේපල, පිරියත හා උපකරණ මත ක්ෂයවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

4. නිකුත් කරන ලද එහෙත් මෙතෙක් බලාත්මක නොවූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දින දක්වා නිකුත් කර ඇති එහෙත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති පහත ලැයිස්තු ගත කොට ඇත. ඒවා බලාත්මක වූ විටදී, එම ප්‍රමිති යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

i. **ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 - මූල්‍ය සාධනපත්‍ර:** 2014 වසරේදි නිකුත් කරනු ලැබූ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 මගින් 'ල.ගි.ප්‍ර. 39- මූල්‍ය සාධන පත්‍ර, හඳුනාගැනීම සහ මැණීම' ප්‍රමිතියේ දැනට පවතින මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපය කරයි. අතර වර්ගීකරණය සහ මැණීම, හානිය සහ මූල්‍ය වත්කම් සහ සහ වගකීම් හානිය සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය හා අදාළ වේ. මූල්‍ය වත්කම් හානිය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව පොදු ඉදිරි රැකුම් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළුව මූල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය සහ මැණීම පිළිබඳ ප්‍රතිශෝධන මාර්ගෝපදේශ ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9හි අන්තර්ගත වේ. එසේම එය මූල්‍ය සාධනපත්‍ර හඳුනාගැනීම පිළිබඳ මාර්ගෝපදේශ ල.ගි.ප්‍ර 39 න් ඉදිරියට රැගෙන යයි. ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 9 බලාත්මක වන දිනය 2018 ජනවාරි 1 වේ.

ii. **ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.** 15 - **ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම්:** ආදායම හඳුනාගනු ලබන්නේද, ඒ කවර ප්‍රමාණයකින් ද සහ කවදාද නිර්ණය කිරීම සඳහා විස්තිරණ රාමුවක් **ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.** 15 ස්ථාපති කරයි. 'ල.ගි.ප්‍ර.18- ආදායම', 'ල.ගි.ප්‍ර.11- 'ඉදිකිරීම් කොන්ත්‍රාත්තු' ඇතුළුව දැනට පවතින ආදායම් පිළිගැනීම එමගින් ප්‍රතිස්ථාපනය කරයි. **ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.** 15 2017 ජනවාරි 1 වනදා සිට ආරම්භ වන වාර්ෂික වාර්තාකරණය සඳහා බලාත්මක වේ**.**

ශ්‍රී.ල.මූ.වා.ප්‍ර. 15/ **ශ්‍රී.ල.මූ.වා.ප්‍ර.** 9 යොදා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඇතිවීමට ඉඩ ඇති බලපෑම සමාගම තක්සේරු කරමින් සිටී.

5. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් හඳුනාගැනීම සහ මැණීම පිළිබඳ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන ගණනාවක් සැලකිල්ලට ගැනීමට කළමනාකාරිත්වය සිදුකරනු ලබයි.

I. මූල්‍ය ප්‍රකාශන මත වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී පහත දැක්වෙන කරුණු වැදගත් විනිශ්චයන් වේ.

(අ) විලම්බිත බදු වත්කම් හඳුනාගැනීම

විලම්බිත බදු වත්කම් හඳුනාගත හැකි ප්‍රමාණය කෙතෙක්ද යන්න විලම්බිත බදු වත්කම් ප්‍රයෝජනයට ගත හැකි අනාගත බදු අයකළ හැකි ආදායමේ සම්භාවිතාව පිළිබඳ තක්සේරුවක් මත පාදක වේ.

II. වත්කම්, බැරකම්, ආදායම හා වියදම් හඳුනාගැනීම සහ මැණීම මත වඩාත්ම වැදගත් බලපෑම ඇතිකරන ඇස්තමේන්තු හා උපකල්පන පිළිබඳ තොරතුරු පහත සපයා ඇත.

(අ) ක්ෂය කළ හැකි වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය

වත්කමේ අපේක්ෂිත ආර්ථික උපයෝගිතාව මත පදනම්ව, එක් එක් වාර්තාකරණ දිනයට, ක්ෂය කළ හැකි වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය පිළිබඳ සිය ඇස්තමේන්තුව කළමනාකාරිත්වය සමාලෝචනය කරයි.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම

නිර්වචිත ප්‍රතිලාභ සැලැසුම් බැඳීම්වල වර්තමාන වටිනාකම, උපකල්පන ගණනාවක් භාවිත කරමින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමවේදය මත නිශ්චය කරනු ලබන සාධක ගණනාවක් මත එය රඳා පවතී. 25 වන සටහනෙහි හෙළිදරව් කර ඇති වට්ටම අනුපාත ඇතුළුව නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා ශුද්ධ පිරිවැය සහ බැඳීම නිශ්චය කිරීමේදී උපකල්පන යොදා ගනු ලැබේ. මෙම උපකල්පනයන්හි කවර හෝ වෙනසක් නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ ධාරණ අගය කෙරෙහි බලපානු ඇත.

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්		2021	2020
6	**ආදායම**		
	ගුවන් කාල ආදායම	1,399,384,065	1,146,093,466
	නිෂ්පාදන ගාස්තු	8,264,147	4,720,310
		1,407,648,212	**1,150,813,776**
	ජාතිය ගොඩනැගීමේ බද්ද		(734,918)
		1,407,648,212	**1,150,078,858**
7	**වෙනත් ආදායම්**		
	දේපළ, පිරියත හා උපකරණ විකිණීම මත ලාභය		1,660,678
	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	534,804	333,010
	යූ ටියුබ් ආදායම	58,391,838	
	දඩ මුදල්	1,202,071	116,932
	විවිධ ආදායම්	33,014,246	60,517,895
	අගරු වෙක්පත් ගාස්තු	100	
	විනිමය ලාභ	20,855	
	රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය	3,375,000	282,737,500
	ආපසු පොත්වලට ගැනීම්	11,038,234	
	හානිකරණ දීමනාව අඩුවීම	2,395,684	
	ටෙන්ඩර් ගාස්තු	437,405	124,000
		110,410,237	**345,490,014**
8	**වැඩසටහන් වියදම්**		
	වැඩසටහන් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය - විදේශීය	28,963,283	9,456,885
	වැඩසටහන් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය - දේශීය	221,352,287	190,352,816
	විකාශන හිමිකම් ක්‍රමක්ෂය	78,376,094	52,005,349
	අනෙකුත් නිෂ්පාදන	175,280,145	157,535,272
		503,971,809	**409,350,323**
9	**අලෙවිකරණ වියදම්**		
	නියෝජිත හා අලෙවි විධායක කොමිස්	64,690,462	46,187,305
	මයික්‍රොවේව් සබැඳිය සඳහා බලපත්‍ර ගාස්තු	12,562,787	10,723,705
	වෙළඳපොළ පර්යේෂණ වියදම්	4,095,000	4,428,316
	ලියා හරින ලද බොල් ණය		
	වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ හානිකරණය/අධි ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය	5,936,662	30,077,472
		87,284,911	**91,416,798**
10	**අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම්**		
	වැටුප් හා දීමනා	**462,914,913**	442,811,672
	සේවක අර්ථසාධක අරමුදල	**67,365,989**	62,072,681
	සේවක භාරකාර අරමුදල	**13,466,945**	12,343,561
	අතිකාල	**73,484,343**	82,467,681
	දිරි දීමනා	**38,386,425**	36,165,227
	කාර්යසාධන දිරි දීමනා	**3,050,795**	5,729,334
	වෛද්‍ය නිවාඩු පනිපූරණය	**27,472,635**	28,057,983
	කාර්ය මණ්ඩල ප්‍රදාන	**380,000**	1,195,000
	කාර්ය මණ්ඩල පුහුණුව	**214,060**	233,695
	කාර්ය මණ්ඩල සුබසාධනය	**39,138,019**	21,899,328
	කාර්යමණ්ඩල නිල ඇඳුම්	**95,063**	251,753
	ගමන් වියදම් හා යැපීම් දීමනා	**32,038,810**	25,644,494
	වර්ෂය සඳහා පාරිතෝෂික ගාස්තු	**17,747,014**	19,104,644
	නිවාස ණය පොළිය	**5,111,688**	5,387,730
	තැපැල් ගාස්තු, දූරකථන හා ටෙලෙක්ස්	**9,012,514**	6,185,342
	විදුලිය හා බල ශක්තිය	**111,616,263**	124,269,155
	විනෝදාස්වාද කටයුතු	**179,082**	222,888
	විදුලි උත්පාදක සඳහා ඉන්ධන	**5,902,821**	4,480,510
	රථ වාහන ධාවන වියදම්	**46,183,761**	46,260,760
	උපකරණ අළුත්වැඩියා හා නඩත්තුව	**42,752,878**	24,079,033
	ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තුව	**18,141,596**	22,027,737
	මැදිරි අටවැඩියාව හා නඩත්තුව	**772,149**	59,090
	උද්‍යානය නඩත්තුව	**315,495**	835,589
	ලිපි ද්‍රව්‍ය, සුළු උපකරණ සහ මුද්‍රිත ආකෘති පත්‍ර	**11,533,118**	7,178,158
	වෙළඳ දැන්වීම් හා වාර ප්‍රකාශන	**14,082,642**	13,586,005
	ඉදිරියට රැගෙන ගිය ශේෂය	**1,041,359,018**	**992,549,048**

චරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්		2021	2020
ඉදිරියට ගෙනා ශේෂය		**1,041,359,018**	**992,549,048**
මාර්ග අළුත්වැඩියාව		**518,750**	376,250
වෙනත් නඩත්තු		**1,624,153**	301,887
රක්ෂණ		**29,300,332**	37,721,216
කුලී, වරිපනම් හා බදු		**34,779,661**	40,849,773
ක්ෂයවීම්		**141,921,215**	154,740,944
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය			392,602
ආරක්ෂක සේවා		**22,834,714**	27,124,395
විදේශ සංචිධාන වෙත දායක මුදල්		**5,454,628**	5,536,558
ජල සැපයුම		**1,819,114**	1,532,938
විගණන ගාස්තු		**1,272,000**	1,272,000
භාණ්ඩ සමීක්ෂණය		**275,000**	550,000
නීති කටයුතු වියදම්		**1,969,725**	2,974,154
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්		**1,407,566**	898,932
උත්සව සඳහා වියදම්		**211,915**	399,445
උපදේශන ගාස්තු		**40,000**	47,500
චන්දි		**1,000,000**	3,000,000
ඍත්නිමය ගාස්තු		**496,678**	143,948
තොරතුරු කළමනාකරණ පද්ධතිය		**150,750**	146,550
ප්‍රයිම් ටීවී වියදම්		**-**	90,700
මුද්දර ගාස්තු		**92,820**	36,200
ලියාපදංචිවීමේ ගාස්තු		**210,322**	121,137
වෙබ් සත්කාරක සේවා		**5,590,352**	5,448,186
ඩයලොග් ටීවී සබඳතාව		**552,048**	490,186
පරිත්‍යාග		**507,990**	307,638
විනිමය අලාබ		**-**	145,866
මන්දගාමී කොග භාණ්ඩ සඳහා ප්‍රතිපාදනය		**-**	490,676
දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් සිදු වූ අලාබ		11,739	
සංඛ්‍යාත ගාස්තු		2,163,875	1,578,625
අන්තර්ජාල සහ සබැඳි ගාස්තු		2,191,843	4,256,468
අනෙකුත් ලැබිය යුතු දෑ හානි		2,710,679	4,746,224
තොග ලියා හැරීම්		-	
බැංකු ගාස්තු		456,984	533,757
ආර්ථික හා සේවා ගාස්තු ලියා හැරීම		-	5,821,064
		1,300,923,871	**1,294,624,865**

11 ශුද්ධ මූල්‍ය ආදායම

පොළී ආදායම			
ආයෝජන මත පොළිය		31,965,999	48,078,448
කාර්යමණ්ඩල ණය පොළිය		2,038,395	2,062,993
		34,004,394	**50,141,441**
පොළී වියදම්			
අයිරාව මත පොළිය			
කල්බදු පොළිය		(3,593,733)	
බැංකු ණය පොළිය			
			0
		30,410,661	**50,141,441**

12 ආදායම් බදු වියදම්

ජංගම බදු සඳහා ප්‍රතිපාදනය	**(Note 12.1)**		-
විලම්බිත බදු වියදම් ගාස්තු/(ප්‍රතිවර්තනය)	**(Note 17)**	**13,678,644**	35,707,166
පෙර වසරේ ඌන ප්‍රතිපාදනය			
		13,678,644	**35,707,166**

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්	2021	2020
12.1 ප්‍රවර්තන බදු ප්‍රතිපාදනය සහ ගිණුම්කරණ ලාභ නිෂ්පාදිත අතර සැසඳීම		
බදුවලට පෙර ගිණුම්කරණ ලාභය	**(315,974,401)**	**(262,568,124)**
බදු සඳහා ඉඩ නොදුන් සමාහාර වියදම්	236,268,819	277,336,912
බදු සඳහා ඉඩ දුන් සමාහාර වියදම්	(132,826,097)	(120,220,777)
අනෙකුත් මූලාශ්‍රවලින් සමාහාර වියදම්	31,965,999	48,078,448
වසර සඳහා බදු අය කළ හැකි ලාභය	**(180,565,680)**	**(105,451,989)**
බදු සඳහා යටත් වෙනත් ආදායම		
මුළු ව්‍යවස්ථාපිත ආදායම/ තක්සේරු කළ හැකි/ බදු අය කළ හැකි ආදායම	**(180,565,680)**	**(105,451,989)**
ප්‍රවර්තන බදු ගාස්තු		0
ප්‍රවර්තන වසරේ අලාභය	(180,565,680)	105,451,989
ඉදිරියට ගෙනා අලාභ	1,520,196,961	1,414,794,972
	1,339,631,281	**1,520,246,961**

13 කොටසක් සඳහා මූලික ඉපැයුම් (රු.)

කොටසක් සඳහා ඉපයුම වනුයේ:

		2020
ලවය ලෙස භාවිතා කළ ප්‍රමාණය		
සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණීය ශුද්ධ ලාභය (රු.)	(315,974,401)	(226,860,960)
හරය වශයෙන් භාවිතා කරන ලද සාමාන්‍ය කොටස් සංඛ්‍යාව		
නිකුතුවේ ඇති සාමාන්‍ය කොටස්වල භරිත සංඛ්‍යාව	9,500,000	9,500,000
කොටසක් සඳහා මූලික ඉපැයුම් (රු.)	**(33.26)**	**(23.88)**

2021 දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

14 දේපළ, පිරියත හා උපකරණ

සින්නක්කර පිරිවැය	ඉඩම	ගොඩනැගිලි	පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ	සම්ප්‍රේෂණ සහ සංඛ්‍යාත උපකරණ	රථ වාහන	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	වෙනත්	එකතුව
2020 ජනවාරි 31 දිනට ශේෂය	**29,782,159**	**594,348,908**	**1,828,225,779**	**526,362,011**	**183,561,427**	**226,149,033**	**85,973,986**	**3,474,403,303**
එකතුකිරීම්	-	-	26,765,775	-		4,691,957	4,506,739	35,964,471
කල්බදු වත්කම්වලින් පවරන ලද	-							
පැවරුම්			(1,119,338)			(61,770)	(128,070)	(1,309,178)
අපහරණ	-		(44,657,129)		(10,531,895)	(7,926,782)	(80,542)	(63,196,348)
2020 ජනවාරි 01 දිනට ශේෂය	**29,782,159**	**594,348,908**	**1,809,215,087**	**526,362,011**	**173,029,532**	**222,852,438**	**90,272,113**	**3,445,862,248**
එකතුකිරීම්		6,571,966	49,996,207			3,947,441	3,584,090	64,099,704
කල්බදු වත්කම්වලින් පවරන ලද								-
පැවරුම්			(392,290)			(382,572)	(361,068)	(1,135,930)
අපහරණ			(1,247,626)			(762,504)	(15,085)	(2,025,215)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**29,782,159**	**600,920,874**	**1,857,571,378**	**526,362,011**	**173,029,532**	**225,654,803**	**93,480,050**	**3,506,800,807**
ක්ෂයවීම								
2020 ජනවාරි 01 දිනට ශේෂය		**132,006,666**	**1,426,185,596**	**483,015,378**	**183,561,428**	**200,207,263**	**80,105,154**	**2,505,081,485**
වසර සඳහා ගාස්තුව		28,405,008	107,260,837	14,857,772		6,398,348	3,603,616	160,525,581
කල්බදු වත්කම්වලින් පවරන ලද								
පැවරුම්			(3,807,020)	(1,490,852)		(272,517)	(214,219)	(5,784,608)
අපහරණ			(44,648,032)		(10,531,895)	(7,914,519)	(80,542)	(63,174,988)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		**160,411,674**	**1,484,991,381**	**496,382,298**	**173,029,533**	**198,418,575**	**83,414,009**	**2,596,647,470**
වසර සඳහා ගාස්තුව		27,082,989	99,457,529	11,740,081		6,256,218	3,619,946	148,156,763
කල්බදු වත්කම්වලින් පවරන ලද								-
පැවරුම්			(4,098,711)	(1,490,852)		(294,475)	(237,260)	(6,121,298)
අපහරණ			(386,625)			(756,433)	(15,085)	(1,158,143)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**187,494,663**	**1,579,963,574**	**506,631,527**	**173,029,533**	**203,623,885**	**86,781,610**	**2,737,524,792**

ශුද්ධ ධාරණ වටිනාකම්		**2021**	**2020**
ඉඩම		29,782,159	29,782,159
ගොඩනැගිලි		413,426,211	433,937,238
දේපළ, පිරියත හා උපකරණ		277,607,804	324,223,705
සම්ප්‍රේෂණ හා සංඛ්‍යාත උපකරණ		19,730,484	29,979,707
රථ වාහන		(1)	(1)
ගෘහ භෘණ්ඩ හා සවිකිරීම්		22,030,918	24,433,844
වෙනත්		6,698,440	6,858,104
මුළු සින්නක්කර වත්කම්		**769,276,015**	**849,214,756**
නොනිමි වැඩ	**(Note 14.2)**	1,098,000	5,857,707
		770,374,015	**855,072,463**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

14.2 නොනිමි ප්‍රාග්ධන වැඩ	2021 ජනවාරි 01 දිනට	දරන ලද (පවරන ලද)	2021 දෙසැම්බර් 31 දිනට
ගොඩනැගිලි	5,857,707	(4,759,707)	1,098,000
ශුද්ධ ධාරණ වටිනාකම	**5,857,707**		**1,098,000**

15 අස්පෘශ්‍ය වත්කම්

	පරිගණක මෘදුකාංග	විකාශන හිමිකම්	එකතුව
පිරිවැයට			
2020 ජනවාරි 01 දිනට ශේෂය	**11,118,367**	**756,605,678**	**767,724,045**
එකතු කිරීම්/අපහරණ		49,069,262	49,069,262
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,118,367**	**805,674,940**	**816,793,307**
එකතු කිරීම්/අපහරණ		81,632,409	81,632,409
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,118,367**	**887,307,349**	**898,425,716**
ක්‍රමක්ෂය			
2020 ජනවාරි 01 දිනට ශේෂය	**10,725,765**	**748,762,665**	**759,488,430**
වසර සඳහා ගාස්තු	392,602	52,005,349	52,397,951
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,118,367**	**800,768,014**	**811,886,381**
වසර සඳහා ගාස්තු		78,376,094	78,376,094
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,118,367**	**879,144,108**	**890,262,475**

ශුද්ධ ධාරණ වඩිනාකම්	**2021**	**2020**
පරිගණක මෘදුකාංග	-	
විකාශන හිමිකම්	8,163,241	4,906,926
	8,163,241	**4,906,926**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2021	2020

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් කාණ්ඩ

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ වාර්තා කරනු ලැබූ ධාරණ වටිනාකම් සමගින් මූල්‍ය වත්කම් හා බැරකම්වල සාධාරණ වටිනාකම පහත දැක්වෙන පරිදි වේ.

මූල්‍ය වත්කම් හා බැරකම්වල සාධාරණ වටිනාකම් හා ධාරණ වටිනාකම්

		2021	2020
මූල්‍ය වත්කම්			
විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්			
නොකැඳවූ කොටස්වල ආයෝජන	**(සටහන 16)**	4,000	4,000
විකිණීම සඳහා ඇති ආයෝජනවල සාධාරණ වටිනාකම විශ්වසවන්ත ලෙස මිණිය නොහැකි බැවින් ඒවා පිරිවැයට දක්වා ඇත.			
ණය හා ලැබිය යුතු දෑ			
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	**(සටහන 19)**	601,543,093	712,153,946
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්	**(සටහන 20)**	57,667,276	59,144,336
තැන්පතු හා අත්තිකාරම්	**(සටහන 21)**	12,694,089	14,823,561
අනෙකුත් මූල්‍ය වත්කම්	**(සටහන 22)**	338,300,156	326,681,339
මුදල් හා මුදලට සමාන දෑ	**(සටහන 23)**	259,806,021	362,004,251
මුළු මූල්‍ය වත්කම්		**1,270,010,635**	**1,474,807,432**
ණය හා ලැබිය යුතු දේවල ධාරණ වටිනාකම සාධාරණ වටිනාකමට ආසන්න බැවින් ණය හා ලැබිය යුතු දෑ ධාරණ වටිනාකමට ප්‍රකාශ කර ඇත.			
මූල්‍ය බැරකම්			
අනෙකුත් මූල්‍ය බැරකම්			
සේවාදායක අත්තිකාරම්		137,772,746	137,772,746
අනෙකුත් ගෙවිය යුතු දෑ	**(සටහන 29)**	146,229,965	146,229,965
මුළු මූල්‍ය බැරකම්		**284,002,711**	**284,002,711**

16 විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්

	2021	2020
ලංකා පුවත් සමාගමේ ආයෝජන (කොටස් සංඛ්‍යාව-4)	**4,000**	**4,000**

ලංකා පුවත් සමාගමේ ආයෝජනයේ සාධාරණ වටිනාකම විශ්වාසවන්ත ලෙස මිණිය නොහැකි බැවින් එය පිරිවැයට මැණ ඇත.

17 විලම්බිත බදුකරණය

		2021	2020
ජනවාරි 01 දිනට ශේෂය		**3,501,921**	**32,205,245**
වසර සඳහා (ගාස්තු)/ ප්‍රතිවර්තනය		(20,682,486)	(35,707,166)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(සටහන 17.1)**	**(17,180,565)**	**(3,501,921)**

17.1 විලම්බිත බදු වත්කම් හා බැරකම්වල විශ්ලේෂණය

	2021	2020
විලම්බිත බදු වත්කම්		
විභාග ප්‍රතිලාභ බැඳීමෙන්	27,325,140	30,829,399
හානිකරණ ප්‍රතිපාදනවලින් -වෙළඳ ලැබිය යුතු දෑ	69,170,159	68,459,846
හානිකරණ ප්‍රතිපාදනවලින් - කාර්යමණ්ඩල ණය	321,905	321,905
හානිකරණ ප්‍රතිපාදනවලින් - මන්දගාමී වට්ටෝරු භාණ්ඩ	1,944,672	2,275,665
අගරු වෙක්පත් හානිකරණවලින්	4,048,414	3,382,557
	102,810,290	**105,269,372**
විලම්බිත බදු බැරකම		
ත්වරක ක්ෂයවීම්වලින්	85,629,725	101,767,451
	(17,180,565)	**(3,501,921)**

17 විලම්බිත බදු වත්කම් ඉදිරියට.....

විලම්බිත බදු වත්කම් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදනය, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදනය සහ මන්දගාමී වට්ටෝරු භාණ්ඩ සඳහා ප්‍රතිපාදනය වෙනුවෙන් අනාගත බදු අයකළ හැකි ලාභ තුළින් ආශ්‍රිත බදු වත්කම් උපලබ්ධි වන ප්‍රමාණයට හඳුනාගනු ලබන අතර ත්වරක ක්ෂයවීම් සඳහා විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලැබේ.

(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතයි)

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2021	2020
18	**වට්ටෝරු භාණ්ඩ**		
	ඉන්ධන	3,900,268	2,511,224
	අමතර කොටස් හා වෙනත්	16,724,982	17,146,371
	එංජින් තෙල්	4,546	10,607
		20,629,796	**19,668,202**
	වන්කම් වටිනාකම අඩුවෙන් දැක්වීමේ ප්‍රතිපාදනය	(8,102,801)	(9,481,941)
		12,526,995	**10,186,261**

ඉලෙක්ට්‍රොනික හා අමතර කොටස්වල මන්දගාමී නොග භාණ්ඩ සඳහා විටිනාකම අඩුවෙන් දැක්වීමේ ප්‍රතිපාදනය

19	**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**			
	වෙළඳ ලැබිය යුතු දෑ		880,276,613	992,883,374
	අනෙකුත් ලැබිය යුතු දෑ	**(සටහන 19.2)**	27,556,995	19,309,430
			907,833,608	**1,012,192,804**
	හානිකරණ ප්‍රතිපාදනය	**(සටහන 19.1)**	(306,290,515)	(300,038,859)
			601,543,093	**712,153,946**

19.1 වෙළඳ ලැබිය යුතු දෑවල හානිකරණය සඳහා වන ප්‍රතිපාදනයේ විස්තර	**2021**	**2020**
වාණිජ ණයගැතියෝ	273,567,271	270,026,294
ප්‍රතිමුඛ ගනුදෙනු ණයගැතියෝ	14,641,728	14,641,728
අගරු වෙක්පත්	16,868,396	14,157,717
අනෙකුත් ලැබිය යුතු දෑ	1,213,120	1,213,120
	306,290,515	**300,038,859**
19.2 අනෙකුත් ලැබිය යුතු දෑ		
වෙනත්	26,343,875	18,096,310
සේවකයන්ගෙන්	1,213,120	1,213,120
	27,556,995	**19,309,430**

20	**කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්**		
	උත්සව අත්තිකාරම්	283,916	189,250
	ආපදා ණය	41,913,655	41,863,829
	වාහන ණය	14,462,188	16,977,409
	රෙදිපිළි ණය	1,135,667	184,000
	විශේෂ ණය- කොවිඩ්	-	57,998
		57,795,426	**59,272,486**
	හානිකරණය සඳහා ප්‍රතිපාදනය	(128,150)	(128,150)
		57,667,276	**59,144,336**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8 උපවගන්තියේ XXIV ඡේදය යටතේ නිකුත් කර ඇති රජයේ වක්‍රලේඛයෙන් උපදෙස් දී ඇති පරිදි 4.2% පොළී අනුපාතය යොදා ගනිමින් කාර්යමණ්ඩල ණය ගණනය කරනු ලැබේ. සමාගම ආයතන සංග්‍රහය යටතේ ආවරණය වන බැවින් ණය ලබා දී ඇති පොළී අනුපාතය රාජ්‍ය ආයතනවල සේවය කරන සේවකයන් සඳහා වෙළඳපොළ පොළී අනුපාතය සේ සලකනු ලැබේ.

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්		2021	2020
21	**තැන්පතු හා අත්තිකාරම්**		
	දේශීය අත්තිකාරම්	872,501	1,891,183
	ණයවර ලිපි තැන්පතු	915,720	2,436,320
	දේශීය මිලදී ගැනුම් සඳහා අත්තිකාරම්	3,190,828	2,785,884
	වෙනත්	7,715,040	7,710,174
		12,694,089	**14,823,561**
22	**අනෙකුත් මූල්‍ය වත්කම්**		
	ස්ථාවර තැන්පතු	329,461,308	315,560,438
	ලැබිය යුතු පොළි	8,838,848	11,120,901
		338,300,156	**326,681,339**

ස්ථාවර තැන්පතුවල ආයෝජන, එම ආයෝජනවල මුහුණත වටිනාකමේ ප්‍රමාණයට සමාගමේ අයිරා පහසුකම්වලට එදිරිව ඔඩපනය කර ඇති අතර ලැබිය යුතු පොළිය ඇතුලත්ව ගණනය කරනු ලැබේ.

ඔඩපනය කරන ලද ස්ථාවර තැන්පතු පිළිබඳ විස්තර සහ අයිරා පහසුකම් පහත දැක්වෙන පරිදිය.

මූල්‍ය ආයතනය	පහසුකම් වර්ගය	පහසුකමේ සීමාව	ඔඩපනය කරන ලද ස්ථාවර මුහුණත
ලංකා බැංකුව	අයිරාව	5,900,000	7,015,638
ලංකා බැංකුව	අයිරාව	86,900,000	95,802,997
ලංකා බැංකුව	ණයවර ලිපිය	250,000,000	379,710,897

23	**මුදල් හා මුදලට සමාන දෑ**	**2021**	**2020**
	බැංකු සහ මුදල් ශේෂ	(33,774,992)	82,295,049
	කෙටි කාලීන ස්ථාවර තැන්පතු	293,581,013	279,709,202
		259,806,021	**362,004,251**
24	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	නිකුත් කරන ලද හා සම්පූර්ණයෙන් ගෙවන ලද		
		9,500,000	**9,500,000**
	වටිනාකම (රු.)	**95,000,000**	**95,000,000**
25	**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම**		
	ජනවාරි 01 දිනට ශේෂය	**129,534,361**	**115,844,748**
	විස්තිරණ ආදායමේ හඳුනාගත් වියදම්	17,747,013	19,104,644
	විස්තිරණ ආදායමේ හඳුනාගත් ආයුගණක	(14,058,436)	12,886,452
	ගෙවිය යුතු	(1,488,288)	(4,564,747)
	වසර තුළ සිදුකරන ලද ගෙවීම්	(17,879,898)	(13,736,736)
	දෙසැම්බර් 31 දිනට ශේෂය	**113,854,752**	**129,534,361**
	25.1 විස්තිරණ ආදායමේ හඳුනාගත් වියදම්		
	ප්‍රවර්තන සේවා පිරිවැය	11,658,092	6,361,722
	වසර සඳහා පොළී ගාස්තු	6,088,921	12,742,922
	වසර තුළ හඳුනාගත් ශුද්ධ ආයුගණය (ලාභ)/අලාභ	(14,378,021)	12,886,452
	උපකල්පන වෙනස්වීමෙන් මතුවන (ලාභ)/අලාභ		
		3,368,992	**31,991,096**

සමාගම විසින් සිදුකරනු ලැබූ මෙම උපකල්පනවිශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම පිණිස භාවිතා කරනු ලැබූ විචල්‍යයන් පිළිබඳ කළමනාකාරිත්වයේ හොඳම ඇස්තමේන්තු මත පදනම් වේ. වාර්තාකරණ කාල සීමාව අවසානයේදී රජයේ බැඳුම්කර පස් අවුරුදු වෙළඳපොළ ප්‍රදයතිලාභ මත පදනම්ව වට්ටම් අනුපාතය නිර්ණය කරනු ලැබේ.

යොදා ගත් ප්‍රධාන උපකල්පන පහත පරිදි වේ.

වට්ටම් අනුපාතය [%]	11	11
අනාගත වැටුප් වැඩිවීම් - වැටුප [%]	1	1 - 3.5
කාර්යමණ්ඩල පිරිවැටුම් සාධකය [%]	4	4
විශ්‍රාම වයස (අවුරුදු)	62	60

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	2021	2020
26 රජයේ ප්‍රදාන		
ජනවාරි 01 දිනට ශේෂය	**23,012,500**	**20,650,000**
ලැබුණු	46,337,505	5,100,000
වර්ෂය සඳහා ක්‍රමක්ෂය	(3,375,000)	(2,737,500)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**65,975,005**	**23,012,500**

ශ්‍රී ලංකා රජයෙන් ඉහත ප්‍රදානයන් ලැබුණේ විකාශනය හා සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන සංවර්ධනය සඳහාය. වියදම් කරන ලද මුදල් ප්‍රමාණයන් අදාළ දේපළ, යන්ත්‍රාගාර හා උපකරණ යටතේ උපයෝජනය කරනු ලැබ ඇත. අනුරූප පදානය අදාළ වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැේබ.

27 විලම්බිත ආදායම		
ජනවාරි 01 දිනට ශේෂය	**63,929,480**	**61,398,230**
ලැබුණු භාණ්ඩ හා සේවා	15,902,750	11,000,000
විස්තීරණ ආදායමේ හඳුනාගනු ලැබූ	(10,130,000)	(8,468,750)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**69,702,230**	**63,929,480**

සමාගම විසින් සපයන ලද සේවාවල වටිනාකම හා සසඳන විට ගණුදෙනු කරුවන් විසින් සපයනු ලබන භාණ්ඩවල සහ සේවාවල වඩා ඉහළ අගයක් සමාගම උපෙයෝජනය කර ඇති අවස්ථාවලදී හුවමාරු ගණුදෙනුවක ශුද්ධ බලපෑම විලම්භිත ආදායමෙන් නියෝජනය වේ.

28 අනෙකුත් ගෙවිය යුතු දෑ		
තැන්පතු	645,950	1,687,956
විවිධ ණයහිමියෝ	22,632,536	14,689,375
ණයවර ලිපි අත්තිකාරම	2,094,883	2,094,883
ගෙවිය යුතු	36,201,330	54,208,495
හිමිකම් නොපෑ ගෙවීම්	1,233,815	2,268,386
හඳුනා නොගත් තැන්පතු	1,465,859	1,253,409
අවලංගු කළ චෙක්පත්	5,718,321	11,898,232
රඳවාගැනීම්	3,673,569	5,083,264
දොරමඩලාව භාරකාර අරමුදල	473,636	459,655
මනුෂ්‍යත්වයේ සත්කාර්ය	3,333,111	3,333,111
කුලිය	55,328,199	49,253,199
	132,801,209	**146,229,965**

29 ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ		
ජංගම බදු		
අගය එකතුකළ බද්ද (VAT)	19,239,012	22,933,543
ජාතිය ගොඩනැගීමේ බද්ද		
ආර්ථික සේවා ගාස්තු		
රඳවාගැනීමේ බද්ද		
මුද්දර ගාස්තු	58,900	52,975
	19,297,912	**22,986,518**

29.1 ජංගම බදු		
ජනවාරි 01 දිනට ශේෂය	**(10,736,395)**	**(14,865,957)**
වර්ෂය සඳහා ප්‍රතිපාදන		
ඌන/ අධි ප්‍රතිපාදන ගැලපුම්		
සිදුකළ ගෙවීම් - බැරකම් පියවීම		(1,691,502)
- ස්වයං ඇගයීම		5,821,064
ලියා හරින ලද ආ.සේ. ගාස්තු		
බදු හර		
දෙසැම්බර් 31 දිනට ශේෂය	**(10,736,395)**	**(10,736,395)**

දෙසැම්බර් 31න් අවසන් වසරේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

30 ආශ්‍රිත පාර්ශව ගණුදෙනු

සමාගමේ ආශ්‍රිත පාර්ශවයන්ට ශ්‍රී ලංකා රජය, රජයට අයත් ව්‍යාපාර, රජය ආශ්‍රිත අනෙකුත් අස්තිත්වයන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් ඇතුලත් වේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ගණුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත-24 "ආශ්‍රිත පාර්ශව හෙළිදරව් කිරීම්" ප්‍රකාරව, ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සෘජුව හෝ වක්‍රව අස්තිත්වයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා වගකීම දරන අය වේ. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමනාකරණ

31 ආශ්‍රිත පාර්ශව ගණුදෙනු

සමාගම සිදුකරන වැදගත් ආශ්‍රිත පාර්ශව ගණුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වෙන පරදි වේ.

ශ්‍රී ලංකා රජය, රජයට අයත් ව්‍යවසාය සහ රජය හා ආශ්‍රිත වෙනත් අස්තිත්ව සමග ගණුදෙනු

සමාගමේ එකම ප්‍රාග්ධන දරන්නා ශ්‍රී ලංකා රජය වන අතර එබැවින් එහි මෙහෙයුම්වල පාලනය රජය සතුය. ඒ අනුව ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන, ඒකාබද්ධව පාලනය කරනු ලබන හෝ සැලකිය යුතු ලෙස බලපෑම් කරනු ලබන (රජය ආශ්‍රිත අස්තිත්ව) අස්තිත්ව ආශ්‍රිත පාර්ශව ලෙස සමාගම සලකයි.

32 බැඳීම් හා අවිනිශ්චිතතා

2019 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින්අනුමත කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් හෝ වෙනත් මූල්‍ය බැඳීම් නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට විභාග වෙමින් පැවැති නඩු කටයුතු පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

නඩුව පිළිබඳ විස්තරය	කරුණු	නඩුවේ තත්ත්වය	කළමනාකරණයේ ඇස්තමේන්තුව
ගයිරුක ජේරුසිංහ මහතා එදිරිව ITN සහ තවත් තිදෙනෙක් නඩු අංක : 51824/MR කොළඹ දිසා අධිකරණය	2004.04.12 දින විකාශනය වූ විකාශයේ ප්‍රචාරය වූ ප්‍රවෘත්තියක් ද්වේශ සහගත, අපහාසාත්මක සහ අපකීර්තිකර බව ප්‍රකාශ කරමින් සියලු චිත්තිකරුවන්ට එරෙහිව පැමිණිළිකරු මෙම නඩුව ගොනු කර ඇත.	මෙම කරුණු සියලු චිත්තිකරුවන්ට එරෙහිව ඒක පාක්ෂික නඩු විභාග තත්ත්වයක පවතී.	රු. 50,000,000/- (හානි ලෙස පැමිණිළිකරු අයැද සිටින මුළු මුදල)

එදිනෙදා ව්‍යාපාර කටයුතු වලදී මතුවන නෛතික හිමිකම්පෑම් සම්බන්ධයෙන් හදිසි අවස්ථා වගකීම් සමගම සතු වේ. ප්‍රතිපාදනයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල පිළිගනු ලබන්නේ නම් මිස එකී හිමිකම් ඉදිරිපත් කිරීම් සාධාරනකරණය කළ නොහැකි නිසා ඒවා බෙරුම් කිරීම සඳහා සම්පත් පිටතට ගලා යෑමක් වීමේ හැකියාව ඉතා අල්ප බව කළමනාකාරිත්වය සලකයි මේ තක්සේරුව සමාගමේ නීති අංශයේ නීති උපදෙස් වලට අනුකූලය ඒ අනුව එවැනි නෛතික හිමිකම්පෑම් සඳහා විධිවිධාන සැලසී නැත

33 වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනය සහ බලය පැවැරූ දිනය අතර ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකිරීම අවශ්‍ය කරන්නා වූ හෝ සිදුවීම් සිදුව නොතිබුණි

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට

සටහන 34

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය

මෙහෙයුම් ඛණ්ඩ තොරතුරු

පහත දැක්වෙන වගුව 2020 දෙසැම්බර් 31න් හා 2021 දෙසැම්බර් 31න් අවසන් වර්ෂ සඳහා ආදායම්, විකුණුම්පිරිවැය, මෙහෙයුම් වියදම් සහ ලාභ ඉදිරිපත් කරයි.

	ස්වාධීන රූපවාහිනිය		වසන්තම් රූපවාහිනිය		ලක්හඬ		වසන්තම් එෆ් එම්		එකතුව	
දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා	**2021**	**2020**	**2021**	**2020**	**2021**	**2020**	**2021**	**2020**	**2021**	**2020**
ආදායම	1,200,607,356	875,005,987	116,601,235	197,971,701	56,917,796	44,755,150	33,521,825	32,346,020	1,407,648,212	1,150,078,858
විකුණුම් පිරිවැය	(420,569,442)	(325,791,550)	(74,092,944)	(75,679,173)	(5,285,147)	(4,873,698)	(4,024,280)	(3,005,902)	(503,971,813)	(409,350,323)
දළ ලාභය/ (අලාභය)	**780,037,914**	**549,214,437**	**42,508,291**	**122,292,528**	**51,632,649**	**39,881,452**	**29,497,545**	**29,340,118**	**903,676,399**	**740,728,535**
වෙනත් ආදායම් අඩු කොට මුඛ වියදම්	(1,044,594,660)	(788,277,983)	(68,202,716)	(59,908,301)	(94,796,897)	(101,536,821)	(39,793,612)	(42,517,847)	(1,247,387,885)	(992,240,952)
බදුකරණයට පෙර ලාභය/අලාභය)	**(264,556,746)**	**(239,063,546)**	**(25,694,425)**	**62,384,227**	**(43,164,248)**	**(61,655,369)**	**(10,296,067)**	**(13,177,729)**	**(343,711,486)**	**(251,512,417)**
ආදායම් බදු වියදම්	13,034,935	28,439,846	-		643,709	7,267,320		-	13,678,644	35,707,166
වර්ෂය සඳහා ලාභය/ (පාඩුව)	**(251,521,811)**	**(210,623,700)**	**(25,694,425)**	**62,384,227**	**(42,520,539)**	**(54,388,049)**	**(10,296,067)**	**(13,177,729)**	**(330,032,842)**	**(215,805,251)**
නිර්වචිත සැලැස්ම මත ආයුගණක ලාභ	13,390,465	(11,015,959)	(367,261)	(215,500)	1,195,017		(159,785)	175,751	14,058,436	(11,055,708)
මුළු විස්තිරණ ආදායම	**(238,131,346)**	**(221,639,659)**	**(26,061,686)**	**62,168,727**	**(41,325,522)**	**(54,388,049)**	**(10,455,852)**	**(13,001,978)**	(315,974,401)	**(226,860,959)**

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා අඩුකිරීමය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් ඉදිරියට